# संस्कृतभाषा

# සංස්කෘත භාෂාව

## ගුරු මාර්ගෝපදේශය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

මූලික පිරිවෙණ

5

ශ්‍රේණිය

මුද්‍රණය සහ බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

Scanned by CamScanner

# සංස්කෘත භාෂාව

## මූලික පිරිවෙණ

# ගුරු මාර්ගෝපදේශය

# 5 වැනි ශ්‍රේණිය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

පිරිවෙන් ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : **www.nie.lk**
විද්‍යුත් ලිපිනය : **info@nie.lk**

වෙබ් අඩවිය : **pirivena.sch.lk**
විද්‍යුත් ලිපිනය : **pirivena@moe.gov.lk**

මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**සංස්කෘත භාෂාව**

මූලික පිරිවෙණ

ගුරු මාර්ගෝපදේශය

5 වැනි ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය - 2019

© ජාතික අධ්‍යාපන ආයතනය

© පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

ISBN 978-955-25-0507-2

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය ඃ pirivena.sch.lk
විද්‍යුත් ලිපිනය ඃ pirivena@moe.gov.lk

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

මුද්‍රණය ඃ එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්
නො. 49, ජයන්ත වීරසේකර මාවත,
කොළඹ 10.

# පිරිවෙන් තුළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සවිබල ගන්වමු

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාවේ මූලිකත්වයෙන් සහ ජාතික අධ්‍යාපන ආයතනයේ තාක්ෂණික සහයෝගයෙන් මූලික පිරිවෙන් 1-5 ශ්‍රේණි සඳහා ප්‍රථම වතාවට ගුරු මාර්ගෝපදේශ සකස් කිරීම සම්බන්ධ ව අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් සතුටට පත්වෙමි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සඵලදායි බව උදෙසා පෙළපොත් සහ විෂය නිර්දේශ මෙන් ම ගුරු මාර්ගෝපදේශවලින් ද සැලසෙනුයේ ඉතා වැදගත් පිටුබලයකි. මෑත කාලීන ව මෙරට අධ්‍යාපන පද්ධතියෙහි ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීම වෙනුවෙන් සංවර්ධනාත්මක තීන්දු තීරණ රැසක් ක්‍රියාවට නංවා ඇති අතර, පිරිවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය සංවර්ධනයට ද එහි දී විශේෂ අවධානය යොමු කර ඇති බව සතුටින් දන්වනු කැමැත්තෙමි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනය සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙන ඇති මෑත කාලීන ක්‍රියාමාර්ග අතරට එක්වන තවත් සුවිශේෂ පියවරක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමේ වැඩපිළිවෙළ හැඳින්විය හැකි අතර, මූලික පිරිවෙන් අධ්‍යාපන විෂය නිර්දේශයට ඇතුළත් ව ඇති සෑම විෂයයක් ම ආවරණය කරමින් සකස් කර ඇති ගුරු මාර්ගෝපදේශ සියල්ල පිරිවෙන් සිසුන්ගේ ඉගෙනුම් කාර්ය සාධනය ඉහළ නංවා ලීම උදෙසා සැබෑ මෙහෙවරක් වනු ඇති බව ද මගේ විශ්වාසය යි.

මෙම සද්කාර්යය වෙනුවෙන් දායක වූ අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යක්ෂතුමා සහ නිලධාරීන් ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලයට ද, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ නිලධාරීන් ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලයට ද, කෘතවේදී ස්තුතිය පිරිනමමි.

**අකිල විරාජ් කාරියවසම්**

අධ්‍යාපන අමාත්‍ය

## අධ්‍යාපන ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපන සම්ප්‍රදායය සුරකිමින් ත්‍රිවිධ ශාසනයේ අභිවෘද්ධිය වෙනුවෙන් ථේරවාදී භික්ෂු සමාජයේ මනා පැවැත්මට උර දිය හැකි ධර්මධර හා විනයධර භික්ෂු පිරිසක් හා ලාංකේය අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් අනාගත අභියෝගයන්ට මුහුණ දිය හැකි ආධ්‍යාත්මික සංවර්ධනයකින් හෙබි පුරවැසියන් පිරිසක් බිහි කර ගැනීම පිරිවෙන් අධ්‍යාපනයෙන් අපේක්ෂිත ය. අනාගත ලෝක ප්‍රජාවේ යහපැවැත්ම සඳහා වූ ආදර්ශවත් පුරවැසියන් පිරිසක් බිහි කිරීමේ වගකීමෙන් අපට මිදිය නොහැකි ය.

කාලීන ව වෙනස් වන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ තාක්ෂණික ක්‍රමශිල්පයන් හා විවිධ කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමවේදයන් අනුගමනය කරමින් පිරිවෙන් ශිෂ්‍ය ප්‍රජාව බලාත්මක කළ යුතු ය. මානව හා භෞතික සම්පත් මනාව උපයෝජනය කර ගැනීමටත් විෂයමාලාව හා පන්ති කාමර කළමනාකරණය ඇතුළු කළමනාකරණ ක්‍රියාවලිය වගකීමෙන් හා වගවීමෙන් යුක්ත ව හසුරුවාලීම ගුරු භූමිකාවට ආදර්ශයකි.

කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි විශ්වීය පුරවැසියකු නිර්මාණය කිරීමේ අභියෝගයට ශක්තිමත් ව මුහුණ දීමට මෙම ගුරු මාර්ගෝපදේශය, ඔබට මහඟු පිටිවහලක් වනු ඇත. ශිෂ්‍ය ප්‍රජාවේ විවිධත්වය හඳුනාගෙන වඩාත් උචිත ක්‍රමශිල්පයන් යොදා ගනිමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය, ජාතික අධ්‍යාපන අරමුණු, පරමාර්ථ හා සුවිශේෂ ව පිරිවෙන් අභිමතාර්ථ සාධනයට සියලු ම පිරිවෙන් ගුරු ප්‍රජාව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

**එම්. එන්. රණසිංහ**

ලේකම්

අධ්‍යාපන අමාත්‍යාංශය

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව මගින් සම්පාදනය කර තිබූ විෂය නිර්දේශයේ අන්තර්ගතය සංශෝධනය කිරීමෙන් පසු අදාළ නිපුණතා සාක්ෂාත් වන පරිදි පාඩම් සැලසුම් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ අභිනවයෙන් පිහිටුවන ලද පිරිවෙන් අධ්‍යාපන ඒකකය මගින් මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත.

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන පරිදි ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරුවරුන්ට ද ලබා දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා සැලසුම් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය ගත් යහපත් තීරණයකි. ඒ වෙනුවෙන් අපගේ ස්තුතිය හිමි වන අතර ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරීමෙන් එම තීරණය යථාර්ථයක් බවට පත් විය.

සාම්ප්‍රදායික ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට පමණක් සීමා නො වී නව ඉගෙනුම්-ඉගැන්වීම් ප්‍රවේශ පිළිබඳ යොමු වීමට මෙම ගුරු මාර්ගෝපදේශයේ අන්තර්ගත උපදෙස් පිරිවෙන් ගුරුවරුන්ට උපකාර වනු ඇත. ඒ අනුව නව ප්‍රවේශ හා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ ගවේෂණය කර තම පාඩම් සැලසුම් කර ගැනීමෙන් ඉහළ ගුණාත්මක ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට ගුරුවරයාට හැකියාව ලැබේ.

මෙහි අන්තර්ගතය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. එනම් විෂය නිර්දේශය සහ එහි නිපුණතා හා නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට උපකාර වන ක්‍රියාකාරකම් සන්තතිය යි. එක් එක් නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් ආවරණය වන ආකාරයට ඉගෙනුම් පල සාක්ෂාත් වන පරිදි ඒ සඳහා වෙන් කර ඇති කාලය ද සැලකිල්ලට ගෙන ක්‍රියාකාරකම් සමූහය නිර්මාණය කර ඇත. තව ද ක්‍රියාකාරකම් පදනම් කර ගෙන නව ක්‍රියාකාරකම් නිර්මාණය කර ගැනීමට ද මෙ මගින් අවකාශය ලැබෙනු ඇත.

ඉතා කෙටි කාලයකින් මූලික පිරිවෙන් විෂයමාලවෙහි සියලු විෂයයන් සඳහා ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමට ශාස්ත්‍රීය නායකත්වය දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකයටත් ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය විශේෂඥයන්ට මෙන් ම බාහිර සම්පත් දායකයන්ටත් මාගේ ස්තුතිය පිරිනැමේ.

**ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

## පෙරවදන

පිරිවෙණ ශ්‍රී ලාංකීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයකි. මිහිඳු මහ රහතන් වහන්සේ ශ්‍රී ලංකා ධරණී තලය තුළ ස්ථාපිත කළ උතුම් සම්බුද්ධ ශාසනය යුග යුග පසු කර නොයෙක් බාධා හමුවේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව වෙත අවිච්ඡින්න ව දායාද කරමින් ධර්මඥානයෙන් පිරිපුන් යතිවර පරපුරක් හා දැ හිතකාමී ජන සමාජයක් පිරිවෙණ මඟින් නිර්මාණය කිරීමට භික්ෂූන් වහන්සේලා සමත් වූහ.

අතීතයේ පටන් ම කාලීන අවශ්‍යතා සපුරාලමින් හා සාම්ප්‍රදායික අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ගිහි පැවිදි සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් පිරිවෙණ මඟින් සිදුවූ මෙහෙය අනුපමේය ය. සම්භාව්‍ය අධ්‍යාපනය ආරක්ෂා කර ගනිමින් පාරම්පරික ශාසනික ක්‍රමවේද හා නූතන අධ්‍යාපන රටා මනාව සම්මිශ්‍රණය කර වර්තමානයේ පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ සහ ගිහි සිසුන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන අද වන විට නිපුණතා පාදක නව විෂයමාලාවක් ඔස්සේ අවශ්‍ය දැනුම ලබා දීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව දරන ප්‍රයත්නය අතිශයින් අගය කරමු. එයට ශක්තියක් වෙමින් සියලු ම විෂය සඳහා නව විෂය නිර්දේශ මුද්‍රණය කරවීම හා මූලික පිරිවෙණ සඳහා පෙළපොත් 54ක් වාර්ෂික ව මුද්‍රණය කර ලබා දීම මඟින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ද අවශ්‍ය පහසුකම් සලසා ඇත.

නිපුණතා පාදක නව විෂයමාලාව සඳහා ගුරු මාර්ගෝපදේශ සැකසීම පිරිවෙන් අධ්‍යාපනය වෙනුවෙන් පළමු වරට සිදු වන උසස් ක්‍රියාදාමයකි. ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව එක් ව සම්පාදනය කළ මෙම ගුරු මාර්ගෝපදේශ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මඟින් මුද්‍රණය කර ඔබ අතට පත් කිරීමට ලැබීම සතුටට කරුණකි. මෙම කාර්යය සඳහා දායකත්වය සැපයූ උපදේශක, සංස්කාරක, ලේඛක මණ්ඩල සාමාජික සියලු දෙනාට ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ද මගේ ස්තුතිය පිරිනමමි. පිරිවෙන් අධ්‍යාපනයේ ඉදිරි දියුණුව ද පතමි.

**ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2019.04.10

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

නූතන ලාංකීය පිරිවෙන් ක්ෂේත්‍රයෙහි මෙම ගුරු මාර්ගෝපදේශ බිහිවීම ඓතිහාසික අවස්ථාවක් බව මම පළමු ව සඳහන් කරමි. ජාතික අධ්‍යාපන ආයතනයත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශයත් සුසංයෝග වී මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය වීම ඊට හේතුව යි.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පාසල් අධ්‍යාපනය සඳහා විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ, ගුරු පුහුණු, අධ්‍යාපන කළමනාකරුවන් පුහුණු කිරීම සහ අධ්‍යාපන පර්යේෂණ සිදු කිරීමේ ව්‍යවස්ථාපිත බලය ඇති එක ම ආයතනය 1985 අංක 28 දරන පනතින් ස්ථාපිත වූ ජාතික අධ්‍යාපන ආයතනය යි. එහෙත් මේ වන විට වසර 2325ක ඉතිහාසයක් ඇති මහා විහාරයීය අධ්‍යාපන සම්ප්‍රදායේ කේන්ද්‍රස්ථානය වූ 'පිරිවෙණ'ට ව්‍යවහාර වර්ෂ 2017 තෙක් ජාතික අධ්‍යාපන ආයතනයේ ඍජු දායකත්වයක් නො තිබිණි.

පිරිවෙන් අංශයක්/දෙපාර්තමේන්තුවක් නොමැති ජාතික අධ්‍යාපන ආයතනයක් තිබිය හැකි දැයි නිතර අප පෙළන ලද කරුණකි. මෙයට විසඳුමක් ලබා ගැනීම සඳහා අපට දායක වීමට හැකි වූයේ වර්තමාන අතිගරු ජනාධිපතිතුමන්, ගරු අධ්‍යාපන ඇමතිතුමන්, 2018 වර්ෂයේ කටයුතු කළ අධ්‍යාපන ලේකම්තුමන්, එවකට පිරිවෙන් අධ්‍යක්ෂ ස්වාමීන්ද්‍රයාණන්, ජාතික අධ්‍යාපන ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ පූර්ණ අනුග්‍රහය හා ආශීර්වාදය ලැබීමෙනි.

ඒ අනුව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 ජනවාරි මස 31 දින රැස්වූ ජාතික බෞද්ධ බුද්ධි බල මණ්ඩලයේ තීරණය පරිදි සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ 2017-03-16 දිනැති 412'5'12 IM No.5157 තීරණය පරිදි ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවට අයත් ව පිරිවෙන් ඒකකය ස්ථාපිත විය.

එහි ප්‍රතිඵලයක් ලෙස පිරිවෙන් ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරු පුහුණුව සිදු කිරීමේ කාර්යවලට දායක වීමට ජාතික අධ්‍යාපන ආයතනයට ඍජු ව හැකි විය. ජාතික අධ්‍යාපන ආයතනය සතු ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ පළපුරුදු බව, පර්යේෂණ, අත්දැකීම්, තාක්ෂණික ප්‍රාගුණ්‍යය සුසංයෝග කර ගනිමින් පිරිවෙන් පන්ති කාමරයෙහි අවදිමත් බවක් ඇති කිරීමට ලද මෙම අවස්ථාව මහාර්ඝ භාග්‍යයකි. අප්‍රමාණ සතුටකි.

පිරිවෙන්වල ගුරු භවතුන් මෙම ගුරු මාර්ගෝපදේශ පරිශීලනයෙන් තම පන්ති කාමරය තුළ ශිෂ්‍ය මිත්‍රභාවයෙන් හා ප්‍රබෝධාත්මක ව කටයුතු කරමින් ඉහළ සාධනයක් කරා පිරිවෙන් අධ්‍යාපනය නංවා ලීමට උත්සුක වන ලෙස ගෞරවයෙන් ආයාචනා කරමි. මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනයට දායක වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, පිරිවෙන් ඒකක ප්‍රධාන සහ සියලු විද්වතුනට ගෞරවය පිරිනමමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය

**පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය**

මහින්දාගමනයෙන් පසු ලක්දිව ශාසන ප්‍රතිෂ්ඨාපන කාර්යයේ දී මහා අරිට්ඨ තෙරුන් විසින් මහා මහින්ද තෙරුන් මුලසුන තබා ථූපාරාම විහාරයේ ධර්ම මණ්ඩපයේ දී මත්තාභය තෙරුන් ප්‍රමුඛ 500ක් සංඝයා වහන්සේට විනය ඉගැන්වීමේ රාජ්‍ය මහෝත්සවයෙන් ලක්දිව පාරිවේණික අධ්‍යාපනය ආරම්භ කෙරිණ. එවක් පටන් විවිධ අවධීන්හි උන්නතියට හා අවනතියට ලක්වෙමින් ලක්වැසි ගිහි පැවිදි සුවහස් සංඛ්‍යාත ප්‍රජාවට පිරිවෙන් අධ්‍යාපනයෙන් වූ සේවාව මහාර්ඝ ය. පිරිවෙණ මගින් සාරධර්ම අධ්‍යාපනය කේන්ද්‍ර කර ගත් සමය හා සමයාන්තර ඥාණයත්, සම්භාව්‍ය හා නූතන භාෂාවනුත්, ශිල්ප කලා ඥාණයත්, ජ්‍යෝතිර්විද්‍යා වාස්තුවිද්‍යා ඥාණයත්, ආදි ඥාන සම්භාරයත්, කාලීන අධ්‍යාපනය අනුව පුද්ගල පෞරුෂයට අවශ්‍ය සියලු සාධකයනුත් සම්පාදිත කෙරේ.

21 වන සියවසේ අධ්‍යාපන ක්ෂේත්‍රය නිපුණතා පාදක ක්‍රමයට නැඹුරු විය. පිරිවෙන් අධ්‍යාපනයට නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමය ආගන්තුක නොවුණ ද පිළිගත් ක්‍රමශිල්ප ඔස්සේ පිරිවෙණට අවශ්‍ය විෂය නිර්දේශ හා පෙළපොත් සම්පාදනය කෙරිණ. එමගින් ශිෂ්‍ය නිපුණතා මට්ටම අනුක්‍රමයෙන් වර්ධනය වන ශිෂ්‍ය මිතුරු පාඨමාලාවක් පිරිවෙන්වලට ඉදිරිපත් කෙරිණි.

ගුරුභවතුන්ට අවශ්‍ය පාඩම් සැලසුම් කිරීම සහ මිනුම් ඇගයුම් ක්‍රම හා තක්සේරුකරණය සඳහා අවශ්‍ය ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කරදීම පිරිවෙන් අධ්‍යාපන ඉතිහාසයේ පළමු වරට සිදුකරන්නට ලැබීම පිළිබඳ අනතිමානී ආනන්දයක් ලබමි. පන්තිකාමරය තුළ වඩාත් ඵලදායී ගුරුවරයකු වීමට ගුරු මාර්ගෝපදේශයේ එන උපදෙස්, ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් යොදා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. පාරිවේණික ගිහි පැවිදි සිසුන්ට අවශ්‍ය මනා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර ගැනීමට ඔබට මේ ගුරු මාර්ගෝපදේශය මහෝපකාරී වනු ඇතැයි සිතමි.

මේ මහඟු කාර්යය යථාර්ථයක් බවට පත් කිරීමේ දී සහය වූ ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයටත්, පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ කාර්ය මණ්ඩලයටත්, උපදේශකත්වය, සම්බන්ධීකරණය, විෂය නියාමනය හා විවිධ අයුරින් සම්පත් දායකත්වය සැපයූ සියලු පාර්ශ්වයන්ටත්, මාගේ කෘතඥතාව පිරිනමමි.

**විජිත වෙලගෙදර**
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

## විෂයමාලා කමිටුව හා ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය

| | | |
|---|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | : | ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| **මෙහෙයවීම** | : | ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර, අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික අධ්‍යාපන ආයතනය<br><br>විජිත වෙලගෙදර, අධ්‍යාපන අධ්‍යක්ෂ<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| **අධීක්ෂණය** | : | ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්<br>භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය<br>ජාතික අධ්‍යාපන ආයතනය<br><br>එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම<br>අධ්‍යක්ෂ, සිංහල භාෂා දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **සම්බන්ධීකරණය** | : | පූජ්‍ය කුකුරම්පොළ ඤාණවිමල හිමි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඒකක ප්‍රධාන<br>පිරිවෙන් අධ්‍යාපන ඒකකය<br>ජාතික අධ්‍යාපන ආයතනය<br><br>පූජ්‍ය කෙහෙල්වල විපස්සි හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| **විෂය නියාමනය** | : | පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අංශාධිපති<br>සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය<br>ජාතික අධ්‍යාපන ආයතනය<br><br>පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංස්කෘත)<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය |

| | | |
|---|---|---|
| **විෂය විශේෂඥ උපදේශනය** | : | මහාචාර්ය පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි<br>සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයනාංශය<br>කැලණිය විශ්වවිද්‍යාලය |
| | | මහාචාර්ය ඊ. ඩබ්ලිව්. මාරසිංහ (විශ්‍රාමික)<br>භාෂා සංස්කෘතික හා ප්‍රාසංගික කලා අධ්‍යයන අංශය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| | | මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ<br>භාෂා සංස්කෘතික හා ප්‍රාසංගික කලා අධ්‍යයන අංශය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| **ලේඛක මණ්ඩලය** | : | පූජ්‍ය උඩවෙල රේවත හිමි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර<br>අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය |
| | | පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංස්කෘත)<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| | | පූජ්‍ය රුපහ ඤාණරතන හිමි<br>නියෝජ්‍ය පරිවේණාධිපති<br>ගම්/ ශාසනවර්ධන මූලික පිරිවෙණ, මීරිගම |
| | | පූජ්‍ය අබේසේකරගම විජිත හිමි<br>පරිවේණාධිපති, ගා/ ශ්‍රී රේවත මහ පිරිවෙණ<br>කුඹල්වැල්ල, ගාල්ල |
| | | පූජ්‍ය රඹාවැවේ විජිතරතන හිමි<br>පරිවේණාධිපති, අ/ශ්‍රී සදානන්ද මහ පිරිවෙණ<br>පෙරියකුලම |
| | | පූජ්‍ය පුවරසන්කුලමේ විමලානන්ද හිමි<br>පරිවේණාචාර්ය, ගම්/ ශ්‍රී ධීරානන්ද මූලික පිරිවෙණ<br>මාවරමණ්ඩිය, හෙයියන්තුඩුව |
| | | ඩී. ජී. සුනිල්<br>පරිවේණාචාර්ය, ගා/ ශ්‍රී විජයානන්ද මූලික පිරිවෙණ<br>හබරකඩ, තවලම |

**භාෂා හා විෂය කරුණු සංස්කරණය**

| | | |
|---|---|---|
| | : | මහාචාර්ය පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි<br>සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයනාංශය<br>කැලණිය විශ්වවිද්‍යාලය |
| | | පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අංශාධිපති<br>සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **සෝදුපත් කියැවීම** | : | පූජ්‍ය උඩවෙල රේවත හිමි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර<br>අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය |
| | | පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංස්කෘත)<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| **පරිගණක වදන් සැකැසීම** | : | පූජ්‍ය උළුවිටිකේ සෝමරතන හිමි<br>නියෝජ්‍ය පරිවේණාධිපති<br>ගා/පියරතන මූලික පිරිවෙණ, බෝපේ, ගාල්ල |
| | | පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංස්කෘත)<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| | | පූජ්‍ය බෝගහපිටියේ ධර්ම ශ්‍රී ඥාණ හිමි<br>පරිවේණාචාර්ය, ගම්/විද්‍යාවංශ මහ පිරිවෙණ<br>බණ්ඩාරවත්ත, ගම්පහ |
| | | බී. සී. කේ. කුමාර<br>පරිවේණාචාර්ය, මාරි/ ශ්‍රී ඉසිපතන මූලික පිරිවෙණ<br>කිරින්ද, පුහුල්වැල්ල |
| | | නදී අමා ජයසේකර<br>ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥ, විභාග දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **පිටකවර නිර්මාණය** | : | ජේ. එම්. තරිඳු හසංග<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණය)<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| **විවිධ සහාය** | : | පී. ජී. බී. බුද්ධිකා<br>රාජ්‍ය කළමනාකරණ සහකාර |

## ගුරුමාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

ලෝකයේ ප්‍රචලිත ව පැවැති හා පවතින සියලු භාෂා ඇතැමුන් විසින් ජීවභාෂා, මෘත භාෂා හා සම්භාව්‍ය භාෂා යනුවෙන් වර්ගත්‍රයකට බෙදා-දක්වනු ලැබේ. ජීවභාෂා යනු අද්‍යතන ව්‍යවහාරයේ පවතින සිංහල, දෙමළ, ඉංග්‍රීසි, ජර්මන්, ජපන් ආදි භාෂාවෝ ය. මෘතභාෂා හෙවත් මළබස් යනු කලින් ව්‍යවහාරයේ පැවැත, අද ව්‍යවහාරයෙන් ගිලිහී-ගොස් ඇති භාෂා ය. මධ්‍යතන ප්‍රාකෘත භාෂා වූ ශෞරසේනී, අපභ්‍රංශ, ආවන්තී, ප්‍රාච්‍යා ආදිය උදාහරණ ය. බහුතර ජනයා විසින් වැවහර නොකරනු ලබන භාෂා වුව ද, ආගමික හා ශාස්ත්‍රීය අගයකින් යුත් ලතින්, සංස්කෘත හා පාලි වැනි භාෂාවෝ සම්භාව්‍ය භාෂා ගණයට අයත් වෙති.

ලෝකයේ පවත්නා සම්භාව්‍ය භාෂා අතුරින් සංස්කෘතයට හිමි වන්නේ අද්විතීය ස්ථානයෙකි. යුරෝපයේ හා ආසියාවේ ප්‍රචලිත ග්‍රීක හා ලතින් ඇතුළු භාෂා බහුතරයෙක මූලභාෂාව ලෙස සැලැකෙන්නේ සංස්කෘතය යි. එය ඉතා පොහොසත් වාක්කෝෂයකින් හා අතිශයින් සංකීර්ණ ව්‍යාකරණයකින් ද සමන්විත අතිප්‍රබල පෞරුෂයක් ඇති භාෂාවකි. ශ්‍රේෂ්ඨ සාහිත්‍යයක් උරුම කොට ඇති එය සංගීතය, නර්තනය, නාට්‍යය, චිත්‍රකලාව, මූර්තිශිල්පය වැනි පෙරදිග කලාවන් මෙන් ම කාව්‍යශාස්ත්‍රය, වෛද්‍යවිද්‍යාව, පුරාවිද්‍යාව, ආයුර්වේදය, ජ්‍යෝතිශ්ශාස්ත්‍රය වැනි ශාස්ත්‍රීය විෂයයන් සමග ද අත්‍යන්තයෙන් බැඳී-පවතින්නා වූ භාෂාවකි. සිංහලය හා සියලු උත්තර භාරතීය භාෂාවන් හදාරන විද්‍යාර්ථීනට එබස පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් තිබීම ඉතා ප්‍රයෝජනවත් ය. අද ප්‍රචලිත හින්දි ගුජරාටි, මරාටි ආදි සියලු භාරතීය භාෂා දොඩන්නවුනට වඩා සංස්කෘත වචන නිවැරදි ව උච්චාරණය කළ හැක්කේ සිංහල භාෂකයනට ය. සිංහල වාක්කෝෂයෙන් සියයට අනූවක් ම සමන්විත ව ඇත්තේ තත්සම ස්වරූපයෙන් භාවිත වන සංස්කෘත වචන හා ඒවායින් බිඳී-ආ තද්භව රූපවලිනි. සංස්කෘතයේ ආධිපත්‍යයට යට වී තුබුණු සිංහලය ඉන් මුදාගැනීමට ප්‍රබල සටනක් ගෙනගිය කුමාරතුංග මුනිදාසයන් සිංහල ගුරුවරුනට දුන් මුඛ්‍ය උපදේශය නම් ඔවුන් විසින් පුරාණ භාෂාවක් වශයෙන් සංස්කෘතය අනිවාර්යයෙන් උගත යුතු බව යි. සෙනරත් පරණවිතාන, ආනන්ද කුමාරස්වාමි ආදීන් ලෝ පතළ උගතුන් බවට පත් වූයේ ඔවුන් සතු ව තුබූ සංස්කෘත ඥානය නිසා බව අප අමතක නොකළ යුතු ය.

සංස්කෘතය මළ බසෙකැයි කියමින් එ බස ඉගැනීම නිෂ්ඵල ව්‍යායාමයෙකැ යි පවසන්නෝ අඥානයෝ ය. සංස්කෘතය කිසි ලෙසෙකිනුත් මළබසෙක් නො වේ. තව මත් සංස්කෘතයෙන් ග්‍රන්ථ රචනා වෙමින් පවතින අතර එය මවුබස ලෙස වහරන සුළු පිරිසක් හෝ අද ද භාරතයේ වාසය කරති. ලෝකයේ උසස් යැ යි සම්මත විද්‍යා නිකේතනයන් වන ඔක්ස්ෆර්ඩ්, කේම්බ්‍රිජ්, හාර්වර්ඩ්, චිකාගෝ, ජර්මනියේ ගොටින්ජන්, ඕස්ත්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලයය ආදියෙහි සංස්කෘතය සම්භාව්‍ය භාෂාවක් වශයෙන් ඉගැන්වේ. සංස්කෘතභාෂා අධ්‍යයනය අන් කිසිවකුටත්

වඩා වැදගත් වනුයේ ශ්‍රී ලාංකිකයන් වන අපට ය. එ බස හදාරන්නා මනා පෞරුෂයකින් හෙබි, සදාචාරසම්පන්න, පරිපූර්ණ මිනිසකු බවට පත් කිරීමේ ශක්තිය සංස්කෘතය සතු ව ඇත. එහෙයින් අපේ පාසල්වල සංස්කෘතය විෂයයක් වශයෙන් හැදෑරීම දිරිමත් කළ යුතු ය.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ මූලික පිරිවෙන් තුළ වඩාත් ඵලදායී ව සහ සුගම ව සංස්කෘත භාෂාව ඉගැන්වීමේ උදාර අරමුණෙන් මෙම ගුරු මර්ගෝපදේශය නිපුණතා පාදක ව සම්පාදනය කර ඇත. ශිෂ්‍යයා කෙරෙහි වඩාත් පරිපූර්ණ ශික්ෂණයක්, විචාරපූර්ව චින්තනයක්, සහ ප්‍රගතිශීලී නිර්මාණ කෞශල්‍යයක් උත්පාදනය කිරීම, මේ තුළින් අපේක්ෂා කෙරේ. පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයා තුළ ධනාත්මක වූත් ප්‍රබෝධාත්මක වූත් සිතුවිලි හා ක්‍රියාකාරකම් නොමැති නම් 'උල්පතට ඉහළින් ගඟ ගලන්නේ නැතිවා සේ' අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගත නොහැකි වනු ඇත. ඒ අනුව අධ්‍යාපන ක්ෂේත්‍රයේ වටිනා ම සම්පත වූ ගුරු සම්පතට අයත් ඔබ ගේ උද්‍යෝගය මත මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් ප්‍රායෝගික වනු ඇත. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය මුල සිට සැලකිල්ලෙන් කියවා හොඳින් අවබෝධ කර ගැනීම අත්‍යවශ්‍ය වේ.

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන නිපුණතා පාදක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය පිළිබඳ ගුරුවරයකු ලෙස ඔබට මේ වන විටත් හොඳ අවබෝධයක් ඇත. යම් විෂයයක් පිළිබඳ සිසුන් නිපුණයින් වීමට නම් ඇසීම, දැකීම හා කිරීම යන අංශ තුනෙහි ම ක්‍රියාකාරී ව යෙදිය යුතු ය. තමා උගත් දේ ප්‍රායෝගික ජීවිතයේ දී සුසංයෝගී ව යොදා ගැනීමේ හැකියාව ඇත්නම් ඔහු නිපුණයෙකි.

2019 වර්ෂයේ සිට ඔබ භාවිත කරන මෙම ගුරු මාර්ගෝපදේශය තුළින් දරුවන් විභාගයෙන් සමත් කරවීම ම පමණක් එක ම අරමුණ නො විය යුතු වේ. ඔබ ගේ ඉගෙනුම්-ඉගැන්වීම් කාර්යයෙන් ශ්‍රේෂ්ඨ ගණයේ පුරවැසියකු බිහි කිරීම ප්‍රධාන අරමුණ විය යුතු අතර විශිෂ්ට ලෙස විභාග සමත්වීම සිසුන් ලබන අතිරේක ප්‍රතිලාභයකි. අධ්‍යාපනයෙන් විභාග සමත්වීමේ නිපුණතාව නොව ධාර්මික ජීවිතයක් ගත කිරීමේ නිපුණතාව ඇති කළ යුතු ය.

මූලික පිරිවෙන් සංස්කෘත විෂය නිර්දේශය සමස්ත වශයෙන් නිපුණතා 10ක් ඔස්සේ විස්තාරණය වී ඇති අතර ඒ අතුරින් පළමු වන ශ්‍රේණිය සඳහා නිපුණතා 05ක් ද, දෙවන ශ්‍රේණිය සඳහා නිපුණතා 06ක් ද, තෙවන, සිව් වන, පස් වන ශ්‍රේණිවල දී සමස්ත නිපුණතා 10 ම ද, වශයෙන් සිරස් ව ගැඹුරටත්, තිරස් ව පුළුල් වත්, විහිදේ. අනතුරු ව එම නිපුණතාවලින් නියමිත ශ්‍රේණියේ දී සාක්ෂාත් කර ගත යුතු යැ යි අපේක්ෂිත කොටස නිපුණතා මට්ටම් ලෙස දක්වා එහි සීමා නිශ්චය කරමින් ඉගෙනුම් පල ඉදිරිපත් කර ඇත. ඊට අදාළ විෂය සන්ධාරය තීරණය කර ඇත්තේ එම ඉගෙනුම් පල පදනම් කර ගනිමිනි.

ගුරුවරයාට පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී කළ යුතු කාර්යභාරය දැක්වීමට ක්‍රියාකාරකම් සැලැසුම් සකස් කර ඇත. එ මගින් ගුරුවරයා අවශ්‍ය ඉලක්කය කරා දිශාභිමුඛ කෙරෙන අතර කාලච්ඡේදවල දී සුදුසු පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් කාර්යය කිරීමට හැකි වන සේ පාඩම් සැලැසුම් සකසා ගැනීම ගුරු අභිමතය පරිදි කරනු ඇතැ යි අපේක්‍ෂා කෙරේ.

යෝජිත කාලය තුළ අදාළ විෂය කරුණු ග්‍රහණය කර ගැනීමෙන් පසු සිසුන්ට අත්පත් කර ගැනීමට හැකි වූ ඉගෙනුම් පල ප්‍රමාණය තක්සේරු කර බැලීම ද නිපුණතාවක් හෝ ඒකකයක් හෝ අවසානයේ සිදු විය යුතු ය.

පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සිසුන්ට හා පන්තියට උචිත පරිදි වඩාත් නිර්මාණශීලි ක්‍රමයක් හා ගුණාත්මක යෙදවුම් ද භාවිත කිරීමට ගුරුවරයාට නිදහස ඇති අතර සිසුන්ගේ නිපුණතා තව දුරටත් සංවර්ධනය වීම සඳහා වැඩි දුර ගවේෂණයට යොමු කළ යුතු ය.

මෙම ගුරුමාර්ගෝපදේශය තුළ කාලච්ඡේද ගණනය කර ඇත්තේ විෂය අන්තර්ගතය පිළිබඳ සැලකිලිමත් වෙමිනි. වර්ෂයට නියමිත කාලච්ඡේද සංඛ්‍යාව නො ඉක්මවන පරිදි පාඩම් ඒකකවලට යොදා ඇති කාලච්ඡේද සංශෝධනය කර ගැනීමට හා පන්ති කාලසටහනට අනුව පාඩම් ඒකක කළමනාකරණය කර ගැනීමට ගුරුවරයාට අවකාශ ඇත. ගුරුමාර්ගෝපදේශය අවසානයේ දක්වා ඇති තක්සේරු හා ඇගයීම් ක්‍රියාවලියට අදාළ නිදර්ශක ආධාරකය ඇගයීම් උපකරණයක් ලෙස භාවිත කිරීමට ඔබට මග පෙන්වනු ඇත.

**පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි,**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අංශාධිපති,
සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය,
ජාතික අධ්‍යාපන ආයතනය

## පටුන


| | පිටු අංකය |
|---|---|
| ගුරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවිඩය | iii |
| අධ්‍යාපන ලේකම්තුමාගේ පණිවිඩය | iv |
| අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | v |
| පෙරවදන | vi |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | vii |
| පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය | viii |
| විෂයමාලා කමිටුව හා ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය | ix |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | xii |
| ජාතික අරමුණු | xvi |
| මූලික නිපුණතා | xvii |
| විෂය අධ්‍යයනයේ අරමුණු | xx |
| විෂය නිර්දේශය වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම | xxi |
| විෂය නිර්දේශය | xxiii |
| පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් සංවිධානය | xxxiv |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය | |
| පාඩම 1 - දේවනාගරී අක්ෂරමාලාව | 3 |
| පාඩම 2 - නාමපද | 6 |
| පාඩම 3 - ආඛ්‍යාතපද (අවසාන ක්‍රියාපද) | 12 |
| පාඩම 4 - විසර්ග සන්ධි | 19 |
| පාඩම 5 - ප්‍රකෘතිභාව සන්ධි | 22 |
| පාඩම 6 - කර්මධාරය සමාසපද | 30 |
| පාඩම 7 - ද්විගු සමාසපද | 33 |
| පාඩම 8 - බහුව්‍රීහි සමාසපද | 36 |
| පාඩම 9 - තද්ධිත | 39 |
| පාඩම 10 - කෘදන්ත | 46 |
| පාඩම 11 - වාක්‍ය නිර්මාණය | 50 |
| පාඩම 12 - නිර්දිෂ්ටග්‍රන්ථ - සාරස්වතය | 52 |
| පාඩම 13 - නිර්දිෂ්ටග්‍රන්ථ - අභිනවා පාඨාවලී - 02 | 56 |
| පාඩම 14 - සංස්කෘත සාහිත්‍යය පෝෂණය කළ විද්වතුන් | 58 |
| පාඩම 15 - පඤ්චතන්ත්‍රය | 62 |
| පාඩම 16 - සෞන්දරනන්ද මහාකාව්‍යය | 64 |
| ඇගයීම සහ තක්සේරුකරණය | 66 |

## ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කරගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරාගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

i. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමඟිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

ii. වෙනස් වන ලෝකයක අභියෝගවලට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම

iii. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම සහ හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මත සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

iv. පුද්ගලයින් ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයවලට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

v. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

vi. පුද්ගලයා ගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්ය සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

vii. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

viii. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

(උපුටා ගැනීම - 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා පෙර සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

(i) **සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය**: පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(ii) **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වාර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්, චිත්තවේගී බුද්ධිය

(iii) **පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවයශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව. ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(iv) **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

ආර්ථික සංවර්ධනයට දායක වීම

තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම

හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(v) **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාරධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(vi) **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවනරටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(vii) **ඉගෙනීමට ඉගෙනීම පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් මගින් වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන් හට ශක්තිය ලබාදීම

(උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

## විෂය අධ්‍යයනයේ අරමුණු

01. සිංහල හා සංස්කෘත වර්ණමාලාව පිළිබඳ ව තුලනාත්මක අධ්‍යයනයකට පෙළඹවීමක් ලැබීම

02. සිංහල භාෂාව නිවැරදි ව භාවිත කිරීමට මූලාධාර වීම

03. ආයුර්වේදය, ජ්‍යෝතිර්විද්‍යාව වැනි විවිධ ශාස්ත්‍ර, කලා ශිල්ප හා දර්ශනවාද ඉගැනීමේ දී ජීවභාෂාවක් වශයෙන් දැනුම, ආකල්ප, කුසලතා සංවර්ධනයට ශක්තිමත් පදනමක් සැපයීම

04. ඉන්දියානු භාෂා අධ්‍යයනයට අත්වැලක් සැපයීම

05. පුරාණ ඥාන ගවේෂණය සඳහා උපකාරී වීම

06. වාග්විද්‍යාත්මක භාෂා ගවේෂණයට හා පාරිභාෂික ශබ්දමාලා සම්පාදනයට මූලාධාර වීම

07. සාහිත්‍යරසාස්වාදයට රුකුලක් වීම

08. හරධර්ම චරිතායනයට සහාය වීම

09. තොරතුරු තාක්ෂණය සඳහා විධිමත් භාෂා මාධ්‍යයක් ගොඩනැගීමට මූලාධාර වීම

10. විශ්වීය කේත (Universal code) ක්‍රමයකට අවශ්‍ය විද්‍යාත්මක භාෂා අධ්‍යයනය සඳහා රුකුලක් වීම

11. සංස්කෘත භාෂාවෙන් ලියැවී ඇති හින්දු ස්තෝත්‍ර හා බෞද්ධශ්ලෝක මගින් ශ්‍රී ලංකාවේ ජාතික හා ආගමික සමගියට අවශ්‍ය දායකත්වය ලබා දීම

**සංස්කෘත භාෂාව**

**විෂය නිර්දේශය පිරිවෙන් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම**

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම් | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|
| 05 | **I** | 1.1, 2.1, 3.1, 9.1, 10.2, 10.3, 10.4 | 60 |
| | **II** | 3.1, 4.1, 4.2, 5.1, 9.1, 10.2, 10.3, 10.4 | 55 |
| | **III** | 6.1, 7.1, 8.1, 9.1, 10.1, 10.2, 10.3, 10.4 | 60 |
| | | එකතුව | 175 |

# संस्कृतपाठ्यक्रमः

## සංස්කෘත විෂය නිර්දේශය

## 5 ශ්‍රේණිය

**बहवो गुरवः सन्ति - शिष्यवित्तापहारकाः ।**
**दुर्लभो हि गुरुर्लोके - शिष्यचित्तापहारकाः ॥**

සිසුන්ගේ මුදල් පැහැර ගන්නා වූ ගුරුවරු බොහෝ වෙති,

එහෙත් සිසුන්ගේ සිත් පැහැර ගන්නා වූ ගුරුවරු දුර්ලභ වන්නා හ.

# වර්ෂයකට යෝජිත කාලච්ඡේද

| ශ්‍රේණිය / නිපුණතාව | | 1 ශ්‍රේණිය | 2 ශ්‍රේණිය | 3 ශ්‍රේණිය | 4 ශ්‍රේණිය | 5 ශ්‍රේණිය | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| දේවනාගරී අක්ෂරමාලාව නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | 01 | 01 | 01 | 01 | 01 | **110** |
| | කාලච්ඡේද | 40 | 25 | 15 | 15 | 15 | |
| සංස්කෘත භාෂාවේ නාමපද නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | 02 | 02 | 01 | 01 | 02 | **90** |
| | කාලච්ඡේද | 20 | 25 | 15 | 15 | 15 | |
| සංස්කෘත භාෂාවේ ආඛ්‍යාතපද නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | 03 | 03 | 03 | 03 | 03 | **95** |
| | කාලච්ඡේද | 20 | 30 | 15 | 15 | 15 | |
| සංස්කෘත භාෂාව නිවැරදි ව හසුරුවමින් අර්ථාන්විත ව සහ ව්‍යාකරණානුකූල ව වාක්‍යනිර්මාණය කරයි. | නිපුණතාව | 04 | 05 | 08 | 08 | 08 | **105** |
| | කාලච්ඡේද | 40 | 30 | 15 | 10 | 10 | |
| නිර්දිෂ්ටග්‍රන්ථ අර්ථාන්විත ව පරිශීලනය කරයි. | නිපුණතාව | 05 | 06 | 09 | 09 | 09 | **197** |
| | කාලච්ඡේද | 60 | 60 | 35 | 27 | 15 | |
| සංස්කෘත භාෂාවේ සන්ධි නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | - | 04 | 04 | 04 | 04 | **47** |
| | කාලච්ඡේද | - | 10 | 10 | 12 | 15 | |
| සංස්කෘත භාෂාවේ සමාස නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | - | - | 05 | 05 | 05 | **37** |
| | කාලච්ඡේද | - | - | 10 | 12 | 15 | |
| සංස්කෘත භාෂාවේ තද්ධිත නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | - | - | 06 | 06 | 06 | **37** |
| | කාලච්ඡේද | - | - | 10 | 12 | 15 | |
| සංස්කෘත භාෂාවේ කෘදන්ත නිවැරදි ව භාවිත කරයි. | නිපුණතාව | - | - | 07 | 07 | 07 | **37** |
| | කාලච්ඡේද | - | - | 10 | 12 | 15 | |
| උපදේශ සාහිත්‍යය හා මහාකාව්‍ය සාහිත්‍යය රසවිඳියි. | නිපුණතාව | - | - | 10 | 10 | 10 | **130** |
| | කාලච්ඡේද | - | - | 40 | 45 | 45 | |
| **එකතුව** | | 180 | 180 | 175 | 175 | 175 | 885 |

# 5 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **1.0 දේවනාගරී අක්ෂරමාලාව නිවැරදි ව භාවිත කරයි.** | 1.1 උත්පත්තිස්ථාන අනුව දේවනාගරී අක්ෂරමාලාව වර්ග කරයි. | 1.1 දේවනාගරී අක්ෂරවල උත්පත්තිස්ථාන<br>• **අකුහවිසර්ජනීයානාං කණ්ඨඃ** .......... යනාදි පාඨය<br>• උත්පත්ති ස්ථාන අනුව දේවනාගරී අක්ෂර වර්ගීකරණය | 1.1<br>• **අකුහවිසර්ජනීයානාං කණ්ඨඃ** .... යනාදි පාඨය වාචොද්ගත ව ප්‍රකාශ කරයි, ලියයි.<br>• **අකුහවිසර්ජනීයානාං කණ්ඨඃ**.... යනාදි පාඨයේ ඇති පරිදි අක්ෂර උත්පත්තිස්ථාන සංස්කෘත භාෂාවෙන් හා සිංහල භාෂාවෙන් නම් කරයි.<br>• උත්පත්තිස්ථාන අනුව දේවනාගරී අක්ෂරමාලාව වර්ග කරමින් වගු ගතකරයි.<br>• දේවනාගරී අක්ෂර හඬනගා උච්චාරණය කරමින් ඒවායේ උත්පත්තිස්ථාන පිළිබඳ ව ප්‍රායෝගික අත්දැකීම් ලබයි.<br>• දේවනාගරී අක්ෂරමාලාවේ ඕනෑම අක්ෂරයක උත්පත්ති ස්ථාන පැහැදිලි කරයි. | 15 |
| **2.0 සංස්කෘත භාෂාවේ නාම පද නිවැරදි ව භාවිත කරයි.** | 2.1 කාරක විභක්තිවලට අනුව නාම වරනගයි. | 2.1 විභක්ති<br>• කාරක විභක්ති<br>  • ප්‍රථමා<br>  • ද්වීතීයා<br>  • තෘතීයා<br>  • චතුර්ථී<br>  • පඤ්චමී<br>  • සප්තමී<br>• උපපද විභක්ති | 2.1<br>• සංස්කෘත භාෂාවේ නාම, කාරක විභක්ති හයක් යටතේ වරනැගෙන බව ප්‍රකාශ කරයි.<br>• කාරක විභක්ති හය නම් කරයි.<br>• සංස්කෘත භාෂාවේ කාරක විභක්තිවල අර්ථය පහදයි.<br>• අදාළ පරිදි කාරක විභක්තිවලට අනුව වරනගමින් වාක්‍යවල ආඛ්‍යාත නිවැරදි ව යොදයි.<br>• නියමිත අවස්ථාවල දී උපපද විභක්ති භාවිත කරයි. | 15 |

# 5 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **3.0 සංස්කෘත භාෂාවේ ආඛ්‍යාතපද (අවසාන ක්‍රියාපද) නිවැරදි ව භාවිත කරයි.** | 3.1ලට්, ලඞ්, ලෝට්, විධිලිඞ්, ලෘට් සහ ලිට් යන ලකාර, උභයපදයෙහි සහ පුරුෂත්‍රයෙහි වරනගමින් නිවැරදි ව භාවිත කරයි. | 3.1 ලට්, ලඞ්, ලෝට්, විධිලිඞ්, ලෘට් සහ ලිට් යන ලකාර, උභයපදයෙහි වරනැඟීම<br>• පරස්මෛපද ප්‍රත්‍ය<br>• ආත්මනෙපද ප්‍රත්‍ය | 3.1<br>• ලියනු ලබන සරල වාක්‍යවල ආඛ්‍යාතවල ඇති ලට්, ලඞ්, ලෝට්, විධිලිඞ්, ලෘට් සහ ලිට් පරස්මෛපද ප්‍රත්‍ය සහ ආත්මනෙපද ප්‍රත්‍ය වෙන්කර දක්වයි.<br>• දෙනු ලබන සරල වාක්‍ය සම්පූර්ණ කිරීමට සුදුසු ලට්, ලඞ්, ලෝට්, විධිලිඞ්, ලෘට් සහ ලිට් ආඛ්‍යාතපද යෝජනා කරයි.<br>• ලට්, ලඞ්, ලෝට්, විධිලිඞ්, ලෘට් සහ ලිට් යන ලකාර හයෙහි උභයපදයට අදාළ ව ඕනෑ ම ආඛ්‍යාතපදයක් වරනගයි. | 15 |
| **4.0 සංස්කෘත භාෂාවේ සන්ධි නිවැරදි ව භාවිත කරයි.** | 4.1 විසර්ගසන්ධියේ යෙදීම් අවබෝධයෙන් යුතු ව භාවිත කරයි. | 4.1 විසර්ගසන්ධිය<br>• විසර්ගසන්ධි ප්‍රභේද<br>  • ලෝපසන්ධිය<br>  • ලෝපශ්සන්ධිය<br>  • ආදේශසන්ධිය<br>• නිර්දිෂ්ටපාඨ ඇසුරින් විසර්ග සන්ධිපද විසන්ධි කිරීම හා විසන්ධිපද සන්ධි කිරීම | 4.1<br>• විසර්ගසන්ධිය සහිත වචන නම් කරයි.<br>• විසර්ගසන්ධි ප්‍රභේද නම් කරයි.<br>• විසර්ගසන්ධිය සහිත වචන ප්‍රභේදවලට වෙන් කරයි.<br>• විසර්ගසන්ධි ප්‍රභේද පැහැදිලි කරයි.<br>• විසර්ගසන්ධි ප්‍රභේදවලට නිදසුන් ඉදිරිපත් කරයි.<br>• නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් විසර්ගසන්ධිය සහිත පද උපුටා දක්වයි.<br>• විසර්ගසන්ධිපද විසන්ධි කොට සන්ධිය සෑදී ඇති ආකාරය මතුකර පෙන්වයි. | 15 |

# 5 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 4.2 ප්‍රකෘතිභාව සන්ධියේ යෙදීම් අවබෝධයෙන් යුතු ව භාවිත කරයි. | 4.2 ප්‍රකෘතිසන්ධිය<br>• නිර්දිෂ්ටපාඨ ඇසුරින් ප්‍රකෘති සන්ධිපද විසන්ධි කිරීම හා විසන්ධිපද සන්ධි කිරීම | 4.2<br>• ප්‍රකෘතිභාව සන්ධිය සහිත වචන නම් කරයි.<br>• ප්‍රකෘතිභාව සන්ධිය යෙදෙන අවස්ථා විස්තර කරයි.<br>• නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් ප්‍රකෘතිභාවසන්ධිය සෑදී ඇති ආකාරය මතුකොට පෙන්වයි.<br>• ප්‍රකෘතිභාව සන්ධිපද විසන්ධිකොට සන්ධිය සෑදී ඇති ආකාරය මතුකොට පෙන්වයි. | |
| **5.0 සංස්කෘත භාෂාවේ සමාස නිවැරදි ව භාවිත කරයි.** | 5.1 කර්මධාරය සමාසපද අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කරයි; ලියයි. | 5.1.2 කර්මධාරයසමාසය<br>• විශේෂණ පූර්වපද<br>• විශේෂණ උත්තරපද<br>• විශේෂණ උභයපද<br>• උපමාන පූර්වපද<br>• උපමාන උත්තරපද<br>• සම්භාවනා පූර්වපද<br>• අවධාරණ පූර්වපද<br>• 'න' නිපාත පූර්වපද<br>• ප්‍රාදී පූර්වපද | 5.1<br>• කර්මධාරයසමාසය හඳුන්වයි.<br>• කර්මධාරය සමාසපද නම් කරයි.<br>• කර්මධාරය සමාසප්‍රභේද නම් කරයි.<br>• කර්මධාරය සමාස ප්‍රභේද නිදසුන් සහිත ව පහදයි.<br>• නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් කර්මධාරය සමාසපද උපුටා දක්වයි. | 15 |
| | 5.2 ද්විගු සමාසපද අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කරයි, ලියයි. | 5.2 ද්විගුසමාසය<br>• සමාහාරද්විගු<br>• අසමාහාරද්විගු | 5.2<br>• ද්විගුසමාසය හඳුන්වයි.<br>• ද්විගු සමාසපද නම් කරයි.<br>• ද්විගු සමාසප්‍රභේද නම් කරයි.<br>• ද්විගු සමාසප්‍රභේද නිදසුන් සහිත ව පහදයි.<br>• නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් ද්විගු සමාසපද උපුටා දක්වයි. | |

# 5 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.3 බහුව්‍රීහි සමාසපද අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කරයි; ලියයි. | 5.3 බහුව්‍රීහිසමාසය<br>• තුල්‍යාධිකරණබහුව්‍රීහි<br>• ව්‍යාධිකරණබහුව්‍රීහි | 5.3<br>• බහුව්‍රීහිසමාසය හඳුන්වයි.<br>• බහුව්‍රීහි සමාසපද නම් කරයි.<br>• බහුව්‍රීහි සමාසප්‍රභේද නම් කරයි.<br>• බහුව්‍රීහි සමාසප්‍රභේද නිදසුන් සහිත ව පහදයි.<br>• නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් බහුව්‍රීහි සමාසපද උපුටා දක්වයි. | |
| **6.0 සංස්කෘත භාෂාවේ තද්ධිත නිවැරදි ව භාවිත කරයි.** | 6.1 තද්ධිත පද අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කරයි; ලියයි. | 6.1 තද්ධිතවර්ග<br>• අතිශයාර්ථතද්ධිත<br>• අනේකාර්ථතද්ධිත<br>• සඞ්ඛ්‍යාතද්ධිත<br>• අව්‍යයතද්ධිත | 6.1<br>• අතිශයාර්ථ තද්ධිතය හඳුන්වයි.<br>• අතිශයාර්ථ තද්ධිතපද නම් කරයි.<br>• නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් අතිශයාර්ථ තද්ධිත පද උපුටා දක්වයි.<br>• අනෙකාර්ථතද්ධිතය හඳුන්වයි.<br>• අනෙකාර්ථ තද්ධිතපද නම් කරයි.<br>• නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් අනෙකාර්ථ තද්ධිතපද උපුටා දක්වයි.<br>• සංඛ්‍යාතද්ධිතය හඳුන්වයි.<br>• සංඛ්‍යා තද්ධිතපද නම් කරයි.<br>• නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් සංඛ්‍යා තද්ධිතපද උපුටා දක්වයි.<br>• අව්‍යයතද්ධිතය හඳුන්වයි.<br>• අව්‍යය තද්ධිතපද නම් කරයි.<br>• නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් අව්‍යය තද්ධිතපද උපුටා දක්වයි. | 15 |

# 5 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **7.0 සංස්කෘත භාෂාවේ කෘදන්ත නිවැරදි ව භාවිත කරයි.** | 7.1 අතීත, වර්තමාන සහ අනාගත කෘදන්ත නිවැරදි ව භාවිත කරයි. | 7.1 අතීතකෘදන්ත<br>• අතීතකෘදන්තවල ප්‍රත්‍ය හය<br>• ක්වසු, කාන, ණිනි, ක්විප්, ක්විනිප්, ඩ | 7.1<br>• අතීතකෘදන්ත හඳුන්වයි.<br>• අතීතකෘදන්තවල ප්‍රත්‍යය හය වාචෝද්ගත ව ප්‍රකාශ කරයි.<br>• ප්‍රත්‍යය හයට අදාළ අතීතකෘදන්තපදවලට නිදසුන් ඉදිරිපත් කරයි.<br>• නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් අතීතකෘදන්තපද උපුටා දක්වයි. | 15 |
| | | 7.2 වර්තමානකෘදන්ත<br>• වර්තමානකෘදන්තවල ප්‍රත්‍ය දෙක<br>• ශතෘ, ශාන | 7.2<br>• වර්තමානකෘදන්ත හඳුන්වයි.<br>• වර්තමානකෘදන්තවල ප්‍රත්‍යය දෙක වාචෝද්ගත ව ප්‍රකාශ කරයි.<br>• ප්‍රත්‍ය දෙකට අදාළ වර්තමානකෘදන්තපදවලට නිදසුන් ඉදිරිපත් කරයි.<br>• නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් වර්තමානකෘදන්තපද උපුටා දක්වයි. | |
| | | 7.3 අනාගතකෘදන්ත<br>• අනාගතකෘදන්තවල ප්‍රත්‍ය තුන<br>• ස්‍යත්, ස්‍යමාන, ණිනි | 7.3<br>• අනාගතකෘදන්ත හඳුන්වයි.<br>• අනාගතකෘදන්තවල ප්‍රත්‍යය තුනට වාචෝද්ගත ව ප්‍රකාශ කරයි.<br>• ප්‍රත්‍ය තුනට අදාළ අනාගතකෘදන්තපදවලට නිදසුන් ඉදිරිපත් කරයි.<br>• නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් අනාගතකෘදන්තපද උපුටා දක්වයි | |

# 5 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **8.0 සංස්කෘත භාෂාව නිවැරදි ව හසුරුවමින් අර්ථාන්විත ව සහ ව්‍යාකරණානුකූල ව වාක්‍ය නිර්මාණය කරයි.** | 8.1 ව්‍යාකරණානුකූල පූර්ණ වාක්‍ය යොදා ගනිමින් අදහස් සන්නිවේදනය කරයි. | 8.1 සරල වාක්‍ය දහයකට නො අඩු වන සේ කිසියම් තේමාවකට අදාළ ව කථා කිරීම | 8.1<br>• දෙනු ලබන තේමාවකට අදාළ ව වාක්‍ය දහයකට නො අඩු කථාවක් පවත්වයි. | 10 |
| | | 8.2 සරල වාක්‍ය දහයක් ලිවීම<br>• නිර්මාණාත්මක සරල වාක්‍ය රචනා<br>• සිදුවීම් වාර්තා කිරීම<br>• පුද්ගලයන් පිළිබඳ තොරතුරු<br>• දහම් කරුණු | 8.2<br>• සරල වාක්‍ය රචනා ලියයි. | |
| **9.0 නිර්දිෂ්ට ග්‍රන්ථ අර්ථාන්විත ව පරිශීලනය කරයි.** | 9.1 සාරස්වතය අර්ථාන්විත ව පරිශීලනය කරයි. | 9.1 **සාරස්වතය** | 9.1<br>• සංස්කෘත ව්‍යාකරණය හැදෑරීම සඳහා ඇති වැදගත් මූලාශ්‍රයක් ලෙස සාරස්වතය නම් කරයි.<br>• සාරස්වතයෙහි අඩංගු සංඥා සහ සන්ධි යන ව්‍යාකරණාංග දෙකට අදාළ සූත්‍ර වාචෝද්ගත කරයි.<br>• එම සූත්‍රවල අර්ථ මතකයෙන් කියයි, ලියයි.<br>• එම සූත්‍ර භාෂා භාවිතයේ දී ප්‍රයෝජනයට ගනියි. | 47 |

# 5 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 9.2 අභිනවා පාඨාවලී - 02 රසවිඳියි. | 9.2 අභිනවා පාඨාවලී - 02<br>• කථාව (අංක 01) සඞ්ගෙ ශක්තිඃ කලෞ යුගෙ<br>• කථාව (අංක 03 දර්පාන්නාශෝනයාත්සුඛම්<br>• කථාව (අංක 13) අන්ධානාං නිරීක්ෂණම්<br>• කථාව (අංක 23) කථාප්‍රියස්‍ය මහීපාලස්‍ය | 9.2<br>• අභිනවා පාඨාවලී - 02 හි අදාළ කථා අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.<br>• අභිනවා පාඨාවලී - 02 හි අදාළ කථා මාතෘභාෂාවට පරිවර්තනය කරයි.<br>• අභිනවා පාඨාවලී - 02 හි අදාළ කථා රස විඳියි. | |
| **10.0 උපදේශ සාහිත්‍යය සහ මහාකාව්‍ය සාහිත්‍යය රසවිඳියි.** | 10.1 සංස්කෘත සාහිත්‍යය පෝෂණය කළ විද්වතුන් අගය කරයි. | 10.1 සංස්කෘත සාහිත්‍යය පෝෂණය කළ විද්වතුන් කිහිප දෙනෙක්<br>• මහාකවි අශ්වඝෝෂ පාදායෝ<br>• මහාකවි කාලිදාස<br>• ශ්‍රීමද් දණ්ඩීහු | 10.1<br>• සංස්කෘත සාහිත්‍යය පෝෂණය කළ විද්වතුන් කිහිපදෙනෙකු ලෙස මහාකවි අශ්වඝෝෂපාද, මහාකවි කාලිදාස සහ දණ්ඩින් හඳුන්වා දෙයි.<br>• අශ්වඝෝෂපාදයන්, මහාකවි කාලිදාසයන්, දණ්ඩින් යන විද්වතුන්ගේ නිර්මාණ වෙන් වෙන් ව නම් කරයි.<br>• අශ්වඝෝෂපාදයන්, මහාකවි කාලිදාසයන්, දණ්ඩින් යන විද්වතුන්ගේ සේවය වෙන් වෙන් ව ප්‍රකාශ කරයි. | 25 |

# 5 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 10.2 පඤ්චතන්ත්‍රය රසවිඳියි. | 10.2 පඤ්චතන්ත්‍රය<br>1. කාකෝලූකීය තන්ත්‍රය<br>• කථාව (අංක 05) බ්‍රාහ්මණසර්පකථා<br>• කථාව (අංක 10) ස්වර්ණපුරීෂපක්ෂී-රාජ-මන්ත්‍රිකථා<br><br>2. අපරීක්ෂිතකාරක තන්ත්‍රය<br>• කථාව (අංක 01) බ්‍රාහ්මණීනකුලකථා<br>• කථාව (අංක 03) සිංහකාරකමූර්ඛකථා<br>• කථාව (අංක 13) ඒකෝදරභාරුණ්ඩකථා<br><br>3. ලබ්ධප්‍රණාශ තන්ත්‍රය<br>• කථාව (අංක 04) සිංහශෘගාලශිශුකථා | 10.2<br>• පඤ්චතන්ත්‍රයෙහි අදාළ කථා අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.<br>• පඤ්චතන්ත්‍රයෙහි අදාළ කථා මාතෘභාෂාවට පරිවර්තනය කරයි.<br>• පඤ්චතන්ත්‍රයෙහි අදාළ කථා රස විඳියි. | |
| | 10.3 සෞන්දරනන්ද මහාකාව්‍යය රස විඳියි. | 10.3 සෞන්දරනන්ද මහාකාව්‍යය<br>• 4 වැනි සර්ගය (ශ්ලෝක 14) 01, 02, 04, 05, 06, 07, 26, 28, 30, 31, 33, 34, 39, 42 | 10.3<br>• සෞන්දරනන්ද මහාකාව්‍යයෙහි අදාළ ශ්ලෝක අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.<br>• සෞන්දරනන්ද මහාකාව්‍යයෙහි අදාළ ශ්ලෝක මාධ්‍යභාෂාවට පරිවර්තනය කරයි.<br>• සෞන්දරනන්ද මහාකාව්‍යයෙහි අදාළ ශ්ලෝක රසවිඳියි. | |

# 5 ශ්‍රේණිය විෂය නිර්දේශය - සංස්කෘත භාෂාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | • 06 වැනි සර්ගය (ශ්ලෝක 10) 01, 03, 05. 06, 12. 13, 14, 24, 25, 34<br>• 08 වැනි සර්ගය (ශ්ලෝක 11) 01 සිට 11 දක්වා<br>• 10 වැනි සර්ගය (ශ්ලෝක 07) 58 සිට 64 දක්වා<br>• 11 වැනි සර්ගය (ශ්ලෝක 03) 31 සිට 33 දක්වා<br>• 12 වැනි සර්ගය (ශ්ලෝක 04) 32 සිට 35 දක්වා<br>• 13 වැනි සර්ගය (ශ්ලෝක 12) 11, 13, 14, 15, 20, 29, 30, 31, 32, 33, 39, 40<br>• 14 වැනි සර්ගය (ශ්ලෝක 10) 11, 12, 13, 14, 15, 27, 28, 30, 33, 36<br>• 15 වැනි සර්ගය (ශ්ලෝක 09) 27, 32, 36, 41, 45, 46, 47, 49, 53<br>• 16 වැනි සර්ගය (ශ්ලෝක 12) 09, 10, 11, 12, 16, 26, 27, 28, 29, 30, 43, 44<br>• 18 වැනි සර්ගය (ශ්ලෝක 24) 01, 02, 03, 04, 05, 06, 07, 22, 23, 26, 27, 29, 30, 32, 33, 34, 38, 42, 45, 46, 54, 55, 63, 64 | | |

## නිර්දිෂ්ටග්‍රන්ථ හා පරිශීලනීය ග්‍රන්ථ (5 ශ්‍රේණිය)

### 1. නිර්දිෂ්ට ග්‍රන්ථ

- සංස්කෘත භාෂාව - 05, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- සාරස්වතය (සම්පූර්ණ පොත)
- සංස්කෘත පාඨමාලා - 05, පූජ්‍ය බෝදාවල පියභාරති හිමි, විද්‍යාලංකාර මුද්‍රණාලය, පෑලියගොඩ - 2016
- සාරස්වතව්‍යාකරණම් (දේවනාගරී) ආචාර්ය, මාදුරුඔයේ ධම්මිස්සර හිමි, උදය ග්‍රැපික්ස්, රත්තණපිටිය - 2016

### 2. පරිශීලනීය ග්‍රන්ථ

- සරල සංස්කෘත ශික්ෂකය - 02, බලන්ගොඩ ආනන්ද මෛත්‍රේය මහ නාහිමි, මොඩන් පොත් සමාගම, නුගේගොඩ - 2012
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (සංඥා - සන්ධි - නාම - තරඞ්ග), පූජ්‍ය හෑගොඩ ධම්මින්ද නාහිමි, සමයවර්ධන මුද්‍රණාලය, මරදාන - 2016
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී ( කාරක - සමාස - තද්ධිත - තරඞ්ග), පූජ්‍ය හෑගොඩ ධම්මින්ද නාහිමි, සමයවර්ධන මුද්‍රණාලය, මරදාන - 2016
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (ආඛ්‍යාත - කෘදන්ත - තරඞ්ග), පූජ්‍ය හෑගොඩ ධම්මින්ද නාහිමි, සමයවර්ධන මුද්‍රණාලය, මරදාන - 2016

## පාසල් ප්‍රතිපත්ති සහ වැඩ සටහන් සංවිධානය

සම්භාව්‍ය භාෂාවක් මෙන් ම ආගමික භාෂාවක් ද වශයෙන් සංස්කෘත භාෂාව ශ්‍රී ලංකාවේත්, ලොව විවිධ රටවලත්, පුරාතනයේ සිට අද දක්වා හැදෑරීම සහ භාවිතය සිදු වේ. තාක්ෂණික අංශයෙන් දියුණු වී විශ්ව ගම්මානයක් වූ ලෝක ප්‍රජාව ගේ ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක සංවර්ධනයට පෙරටත් වඩා පරිපූර්ණ දායකත්වයක් සංස්කෘත භාෂාවෙන් ලබා ගත හැකි ය. ජාත්‍යන්තර කීර්තියට පත් ශ්‍රී ලාංකික ඇතැම් විද්වතුන් එම තත්ත්වයට පත් වීමේ ප්‍රධාන සාධකය ඔවුන් සතු සංස්කෘත භාෂා නිපුණතාව යි. සංස්කෘත භාෂාව ශාස්ත්‍රීය කටයුතු හා ආගමික කටයුතුවලට පමණක් සීමා නො කොට පිරිවෙන් පද්ධතිය තුළින් සමාජයට නව ආරකට හඳුන්වා දිය යුතු කාලය එළඹ ඇත. දැනුම ගවේෂණය කරන ක්‍රියාකාරී පුද්ගලයකු ලෙස පන්ති කාමරයට පමණක් කොටු වී ලබන අධ්‍යාපනයෙන් බැහැර ව පිරිවෙන් තුළත්, ඉන් බැහැර වත්, විවිධ වැඩසටහන් සංවිධාන කළ යුතු යි. පිරිවෙන් සංස්කෘතියට ගැළපෙන පරිදි සහ පිරිවෙනෙහි පවත්නා මානව හා භෞතික සම්පත් අනුව විෂය නිර්දේශයේ සඳහන් නිපුණතා සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම වැඩසටහන් සංවිධානය විය යුතු ව ඇත. ඒ සඳහා නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

01. සංස්කෘත භාෂා දින
02. කණ්ඩායම් සංවාද
03. මාසික හා වාර්ෂික සංගම්වල දී සංස්කෘතයෙන් භාෂණය, සජ්ඣායනය
04. සංස්කෘත භාෂාව පසුබිම් කර ගත් කාව්‍ය ශාස්ත්‍රය, වෛද්‍ය විද්‍යාව, පුරා විද්‍යාව, ආයුර්වේදය වැනි තේමා පිළිබඳ ගවේෂණ
05. බිත්ති පුවත්පත් පළ කිරීම
06. උපදේශාත්මක සංස්කෘත ශ්ලෝක හා තොරතුරු එක් රැස් කිරීම
07. මවුබසේ වචන පරිණාමය වී ඇති ආකාරය පිළිබඳ සංස්කෘතය ඇසුරින් තොරතුරු රැස් කිරීම
08. දේවනාගරී අක්ෂර යොදා ගනිමින් විවිධ තොරතුරු සන්නිවේදනය සඳහා පෝස්ටර් නිර්මාණය

## තක්සේරු හා ඇගැයීම් කාර්යය

**පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ** පිරිවෙන්වලට ද අදාළ ය. ඒ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගැනුම්-ඉගැන්වීම් උපකරණ නිර්මාණාත්මක ව පිළියෙල කොට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ය.

ඉගැනුම්-ඉගැන්වීම් කාර්යයේ දී ශිෂ්‍යයා අපේක්ෂිත නිපුණතා මට්ටමට පැමිණ අත්පත් කරගෙන ඇති ඉගැනුම් පලවල ගුණාත්මක බව සොයා බැලීමට තක්සේරුව හා ඇගයීම අවශ්‍ය වේ.

නිපුණතා මට්ටම් ඔස්සේ අපේක්ෂිත ඉගැනුම් පලවලට ළඟා වන ආකාරය හඳුනා ගැනීම තක්සේරුවේ දී සිදු වේ. මුල දී තීරණය කර ගත් නිර්ණායක සමග සසඳා බලමින් අදාළ නිපුණතා කවර මට්ටමකින් ශිෂ්‍යයා සාක්ෂාත් කරගෙන තිබේ දැ යි පරීක්ෂා කළ යුතු ය. ඒ අනුව ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ප්‍රතිපෝෂණ සහ ඉදිරි පෝෂණ වැඩ සටහන් සංවිධාන කළ යුතු ය. ඉගැනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර දී කණ්ඩායම් ගවේෂණය, ශිෂ්‍ය ක්‍රියාකාරකම්, ඉදිරිපත් කිරීම යන අවස්ථාවල තක්සේරු කාර්යය මැනවින් කළ හැකි ය.

තක්සේරු කාර්යයට අමතර ව ඇගයීම් වැඩපිළිවෙළ යනු ශිෂ්‍යයා ගේ ප්‍රවීණතා මට්ටම තීරණය කිරීම ය. ප්‍රවීණතා මට්ටම විනිශ්චයේ දී සිසුන් හිමි කර ගත් ශ්‍රේණි, ලකුණු ආදිය සසඳා ඔවුන් ගේ ප්‍රගතිය සොයා බැලිය යුතු ය.

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

ශ්‍රී ලංකාව තුළ සංස්කෘත භාෂාව දිගු කලක පටන් පරපුරෙන් පරපුරට පැවත එයි. ජේතවනාරාම සංස්කෘත සෙල් ලිපිය නමින් ප්‍රකට ව ඇති අභයගිරි සංස්කෘත සෙල් ලිපිය අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වන්නේ ශ්‍රී ලාංකික ජන සමාජය තුළ සංස්කෘත භාෂාව සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් ද භාවිත වූ බව යි. සිංහල භාෂා-සාහිත්‍යය වෙත සුවිශාල ආභාසයක් සපයා ඇති සංස්කෘතය දෙමළ භාෂා-සාහිත්‍යය වෙත ද එබඳු ම ආභාසයක් සපයා ඇත. '**සර්වභාෂාසු යා ශ්‍රේෂ්ඨා**' ආදි හැඳින්වීම්වලට අනුව සංස්කෘතය සියලු භාෂාවන් අතර ශ්‍රේෂ්ඨතම වූත්, සියලු ශාස්ත්‍ර සමූහයන් ගෙන් ආඪ්‍ය වූත්, අංග සම්පූර්ණ භාෂාවකි. සිංහල හෝ දෙමළ මවුබස කොට ඇති ශිෂ්‍යයාට ඊට වෙනස් වූ අක්ෂර රටාවක් වෙත යොමු වෙමින් හෝඩිය වශයෙන් ඉඳුරා වෙනස් නො වුව ද විෂමතා හඳුනා ගනිමින් හැදෑරිය යුතු සංස්කෘතය ශිෂ්‍යයන් අතර ප්‍රියශීලි විෂයයක් බවට පත් කිරීමටත්, එම විෂය ඉගැනීම සඳහා ඔවුන් පෙළඹවීමටත්, භාෂාව පහසුවෙන් ඉගැනීමේ සාම්ප්‍රදායික විධි ක්‍රම නො ඉක්මවමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය සකස් කළ යුතු ය. එ විට පෙරට වඩා සංස්කෘත භාෂාව ජනප්‍රිය කළ හැකි ය. ඒ සඳහා තුලනාත්මක භාෂා අධ්‍යයන විධි ක්‍රමය වඩාත් උචිත වනු ඇත.

නිපුණතා පාදක අධ්‍යාපනය ජාතික අවශ්‍යතාවක් වන බැවින් සංස්කෘත භාෂාවෙන් පෙරටත් වඩා නිපුණයන් බිහි කිරීම අරමුණු කොට ගවේෂණාත්මක ක්‍රියාකාරකම් ඔස්සේ සිසු නිපුණතා ගොඩනැගෙන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කෙරේ.

අතීතයේ සිට පන්ති කාමර තුළ බහුල ව ක්‍රියාත්මක වූ ගුරුවරයාගේ ඉගැන්වීම් ක්‍රම වූ සම්ප්‍රේෂණ ක්‍රමය (Transmisson Role), ගනුදෙනු ක්‍රමය (Transaction Role), ඉක්මවා සිසු චින්තනය අවදි කරන, සිසුන්ගේ පෞද්ගලික හා සමාජ කුසලතා සංවර්ධනය කරන පරිණාමන ක්‍රමය (Transformation Role) ගුරුවරයා අනුගමනය කරනු ඇතැ යි මෙහි දී අපේක්ෂා කෙරේ.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යය ප්‍රබල ස්ථානයක් ගන්නා අතර පන්තියේ සෑම ළමයකු ම ඒ ඒ නිපුණතා සම්බන්ධ ව අඩු තරමින් ආසන්න ප්‍රවීණතාවට හෝ ගෙන ඒමට මැදිහත් වන සම්පත්දායකයකු ගේ තත්ත්වය පරිණාමන ගුරු භූමිකාවේ කැපී පෙනෙන ලක්ෂණයකි. ඉගැනුමට අවශ්‍ය උපකරණ හා අනෙකුත් පහසුකම් සහිත ඉගෙනුම් පරිසරයක් සැලසුම් කිරීම, සිසුන් උගන්නා අයුරු සමීප ව නිරීක්ෂණය කිරීම, ශිෂ්‍ය හැකියා හා නො හැකියා හඳුනාගැනීම, අවශ්‍ය ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙමින් සිසුන් ගේ ඉගැනුම ප්‍රවර්ධනය කිරීම මෙන් ම පන්ති කාමරයෙන් බැහැර ව ඉගෙනුම් හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා සුදුසු උපකරණ සකස් කිරීම ද මෙහි දී ගුරුවරයා ගෙන් ඉටු විය යුතු මූලික කාර්යයන් වේ.

සංස්කෘත විෂයය සමස්ත පිරිවෙන් පද්ධතියේ ප්‍රධාන සහ අනිවාර්ය භාෂා විෂයයක් වන බැවින් භාෂාවන් ඉගැනීමේ දී භාවිත කළ හැකි නූතන විද්‍යාත්මක ක්‍රම, එනම් ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය, සමකාලීන ප්‍රකාශන, අන්තර්ජාලය ආදිය ද භාෂා භාවිතයට කෙටි විද්‍යාත්මක ක්‍රම හා තර්කානුකූල ක්‍රම ද යොදා ගත යුතු ය.

# පාඩම 1 - දේවනාගරී අක්ෂරමාලාව

**නිපුණතාව** : 1.0 දේවනාගරී අක්ෂරමාලාව නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 1.1 උත්පත්ති ස්ථාන අනුව දේවනාගරී අක්ෂරමාලාව වර්ග කරයි.

**කාලච්ඡේද** : 15 යි.

**ඉගෙනුම් පල** :

- **අකුහවිසර්ජනීයානාං කණ්ඨඃ ....** යනාදි පාඨය වාචොද්ගත ව ප්‍රකාශ කරයි; ලියයි.
- **අකුහවිසර්ජනීයානාං කණ්ඨඃ....** යනාදි පාඨයේ ඇති පරිදි අක්ෂර උත්පත්තිස්ථාන සංස්කෘත භාෂාවෙන් හා සිංහල භාෂාවෙන් නම් කරයි.
- උත්පත්තිස්ථාන අනුව දේවනාගරී අක්ෂරමාලාව වර්ග කරමින් වගු ගතකරයි.
- දේවනාගරී අක්ෂර හඬනගා උච්චාරණය කරමින් ඒවායේ උත්පත්තිස්ථාන පිළිබඳ ව ප්‍රායෝගික අත්දැකීම් ලබයි.
- දේවනාගරී අක්ෂරමාලාවේ ඕනෑ ම අක්ෂරයක උත්පත්තිස්ථාන පැහැදිලි කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**ප්‍රවේශය :**

- පෙළපොතේ පළමුවන පාඩමේ ඇති රූපසටහන ඇසුරෙන් උච්චාරණ අවයව පෙන්වා දෙන්න.
- සියලුම අක්ෂරවල උත්පත්තිස්ථාන එම රූප සටහනේ දැක්වෙන බව පෙන්වා දෙන්න.
- ඒ ඒ අක්ෂර උච්චාරණය කරමින් ඒවායේ උත්පත්තිස්ථානය, එනම් අවයවය අත්දැකීමෙන් හඳුනාගැනීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- අතීත වේද ග්‍රන්ථවල ජිහ්වාමූලීය සහ උපධ්මානීය ලෙස අක්ෂර සංකේත දෙකක් තිබුණු බව ප්‍රකාශ කරයි.

**පාඩම සංවර්ධනය :**
**පියවර 1**

ස්වර

- පෙළපොතේ පළමුවන පාඩමේ ඇති උච්චාරණ අවයව පද්ධතියේ රූපසටහන වෙත සිසු අවධානය යොමු කරන්න.
- එහි අක්ෂරවල හඬ නිපදවීමට උපකාරී වන ප්‍රධාන අවයව **හයක්** ඇති බව පෙන්වා දෙන්න.
- අංකනය කරන ලද එම ස්ථාන හය අනුව සිසුන් කණ්ඩායම් හයකට වෙන් කරන්න.

- පළමු වන පාඩමේ ඇති සූත්‍රානුසාරයෙන් අක්ෂර උත්පත්තිස්ථාන දක්වන ලද වගුව පහත ආකාරයට බෙදා දී අදාළ ක්‍රියාකාරකමේ නිරත කරවන්න.
    - කණ්ඨජ හෙවත් ගෙළ ඇසුරුකොට උපදින ශබ්ද උච්චාරණය කිරීම සහ ලිවීම
    - තාලුජ හෙවත් තල්ල ඇසුරුකොටගෙන උපදින අක්ෂර උච්චාරණය කිරීම සහ ලිවීම
    - මූර්ධජ හෙවත් උඩුතල්ල ඇසුරුකොටගෙන උපදින අක්ෂර උච්චාරණය කිරීම සහ ලිවීම
    - දන්තජ හෙවත් දත් ඇසුරුකොටගෙන උපදින අක්ෂර උච්චාරණය කිරීම සහ ලිවීම
    - ඕෂ්ඨජ හෙවත් දෙතොල් ඇසුරුකොටගෙන උපදින අක්ෂර උච්චාරණය කිරීම සහ ලිවීම
    - නාසික්‍ය හෙවත් නැහැය ඇසුරුකොටගෙන උපදින අක්ෂර උච්චාරණය කිරීම සහ ලිවීම

## පියවර 2

### ව්‍යඤ්ජන

- ඉහතින් දැක්වුණු **කණ්ඨ, තාලු, මූර්ධ, දන්ත** සහ **ඕෂ්ඨ** යන ස්ථානවලින් උපදින **ङ ञ ण न म** යන අකුරු හැර සෙසු අකුරු ඒකජාක්ෂර බව පෙන්වා දෙන්න.
- **නාසික්‍ය, කණ්ඨතාලුජ, කණ්ඨෝෂ්ඨජ සහ දන්තෝෂ්ඨජ** යනුවෙන් **ද්විජාක්ෂර වර්ග හතරක්** ඇති බව පළමුවන පාඩමේ වගුව ඇසුරෙන් පහත සඳහන් ආකාරයට පෙන්වා දෙන්න.
    - **නාසික්‍ය (5)** - යනු කණ්ඨ, තාලු, මූර්ධ, දන්ත, ඕෂ්ඨ යන ස්ථාන සහ නාසය ඇසුරු කොටගෙන උපදින අක්ෂර බව
    - **කණ්ඨතාලුජ (2)** - යනු ගෙළ හා තල්ල ඇසුරු කොටගෙන උපදින අක්ෂර බව
    - **කණ්ඨෝෂ්ඨජ (2)** - යනු ගෙළ හා දෙතොල් ඇසුරු කොටගෙන උපදින අක්ෂර බව
    - **දන්තෝෂ්ඨජ (1)** - යනු දත් හා දෙතොල් ඇසුරු කොටගෙන උපදින අක්ෂර බව
- ඒවාට අයත් සාරස්වතසූත්‍ර පෙළපොතේ පළමුවන පාඩමේ ඇති වගුව උපයෝග කොටගෙන වාචෝද්ගත කරවන්න.
- එම ද්විජාක්ෂර සිසුන් සමග උච්චාරණය කරන්න.
- අනඹූ ලෙස තෝරාගත් සිසුන්ට ඒවා හුණුපුවරුවේ ලිවීමට අවස්ථාව දෙන්න.
- ඉහත සඳහන් ඒකජාක්ෂර සහ ද්විජාක්ෂරවලට අමතර ව ජිහ්වාමූලීය හා උපධ්මානීය යනුවෙන් අක්ෂර සංකේත දෙකක් ඇති බවත් ඒවා දැනට ව්‍යවහාරයේ නැතත් වේද ග්‍රන්ථවල භාවිත වී ඇති බවත් සිසුන්ට පහදා දෙන්න.

- ජිහ්වාමූලීය, උපධ්මානීය - **ක, ඛ** දෙකට පෙරටුව සිටි ≍ ජිහ්වාමූලීය ( ≍ ක, ≍ ඛ) හා **ප, ඵ** දෙකට මුලින් සිටි ≍ උපධ්මානීය ( ≍ ප, ≍ ඵ) නමින් හැඳින්වෙන බව පෙන්වා දෙන්න.
- පෙළපොතේ 1.1/1.2 අභ්‍යාස කිරීමට සිසුන් යොමු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- දේවනාගරී අක්‍ෂරමාලාවේ අක්‍ෂර උත්පත්තිස්ථාන සූත්‍රානුසාරයෙන් මතකයෙන් ප්‍රකාශ කිරීම
- අක්‍ෂර උත්පත්තිස්ථාන ප්‍රභේද 10 නම් කිරීම
- ප්‍රභේද දහයට අයත් අක්‍ෂර ලැයිස්තු ගත කිරීම
- නම් කරනු ලබන ඕනෑම අක්‍ෂරයක උත්පත්තිස්ථානය ප්‍රකාශ කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

- සංස්කෘත භාෂාව - පස්වන ශ්‍රේණිය, පෙළපොත
- සාරස්වතය
- හුණුපුවරුව

# පාඩම 2 - නාමපද

**නිපුණතාව** : 2.0 සංස්කෘත භාෂාවේ නාමපද නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 2.1 කාරක විභක්තිවලට අනුව නාම වරනගයි.

**කාලච්ඡේද** : 15 යි.

**ඉගෙනුම් පල** :

- සංස්කෘත භාෂාවේ නාම, කාරක විභක්ති හයක් යටතේ වරනැගෙන බව ප්‍රකාශ කරයි.
- කාරක විභක්ති හය නම් කරයි.
- සංස්කෘත භාෂාවේ කාරක විභක්තිවල අර්ථය පහදයි.
- අදාළ පරිදි කාරක විභක්තිවලට අනුව වරනගමින් වාක්‍යවල ආඛ්‍යාත නිවැරදි ව යොදයි.
- නියමිත අවස්ථාවල දී උපපද විභක්ති භාවිත කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**ප්‍රවේශය :**

- කාරක විභක්ති හය ඇතුළත් පහත සඳහන් ශ්ලෝකය සිසුන් සමග සජ්ඣායනා කරන්න.
  **कर्ता कर्म च करणं सम्प्रदानं तथैव च ।**
  **अपादानाधिकरणमित्याहुः कारकानि षट् ॥**
- එම ශ්ලෝකය ඇසුරින් කාරක විභක්ති හය නම් කරන්න.
- '**ක්‍රියාසිද්ධ්‍යුපකාරකං කාරකම්**' ක්‍රියාවක් සිදු කිරීමට උපකාර වන්නේ කාරක යැයි සාරස්වතය ඇසුරින් අර්ථකථනය කරන්න.

**පාඩම සංවර්ධනය :**
**පියවර 1**

- ඇමුණුම 1 සිසුන්ට ලබා දෙන්න.
- එහි ඇති කාරක විභක්ති අධ්‍යයනයට සිසුන් යොමු කරන්න.
- අහඹු විමසීමෙන් ඒවායේ අර්ථය මතකයෙන් ප්‍රකාශ කරවන්න.
- කාරක විභක්ති හයට අදාළ නාමපද හයක් හුණුපුවරුවේ දක්වා ඒවා කාරක විභක්ති හය යටතේ වරනගා පෙන්වන්න.
- ඔබ විසින් හුණුපුවරුවේ ලියන ලද නාමපද හැර වෙනත් නාමපද සමූහයක් සිසුන්ට සපයා ඒවා කාරක විභක්ති හය යටතේ වරනැගීමට යොමු කරන්න.
- ඇමුණුම 2 නිදසුනක් වශයෙන් සපයා සිසුන් කළ වරනැගීම් යොදා වාක්‍යනිර්මාණයට අවස්ථාව දෙන්න.

**පියවර 2**

- ඇමුණුම 3 සිසුන්ට සපයා දී උපපද විභක්ති භාවිත වන අවස්ථා පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- ආමන්ත්‍රණාර්ථයෙහි යෙදෙන සම්බෝධන විභක්ති පදවලට නිදසුන් ලැයිස්තුගත කරමින් ඒවාට ගැළපෙන ආඛ්‍යාතපද යොදා වාක්‍යනිර්මාණයට සිසුන් යොදවන්න.
- සම්බන්ධාර්ථයෙහි, නිර්ධාරණාර්ථයෙහි, අනාදරාර්ථයෙහි, හේතුප්‍රයෝගාර්ථයෙහි, ස්වාම්‍යාර්ථයෙහි, සිහිකිරීම් අර්ථයෙහි යෙදෙන ෂෂ්ඨී විභක්තියෙන් එන පදවල නිදසුන් සාකච්ඡා කරමින් ඒවා යොදා වාක්‍යනිර්මාණයට සිසුන් යොදවන්න.
- ඇමුණුම 4 සහ පෙළපොතේ අදාළ අභ්‍යාස කරවමින් සිසු දැනුම තහවුරු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- කාරක අර්ථකථනය කිරීම
- සංස්කෘත භාෂාවේ පවතින කාරක විභක්ති හය පිළිවෙළින් නම් කිරීම
- කාරක විභක්ති හය යටතේ නාමපද වරනගා පෙන්වීම
- උපපද විභක්ති පදවලට නිදසුන් ඉදිරිපත් කිරීම
- කාරක විභක්ති සහ උපපද විභක්ති යොදා වාක්‍යනිර්මාණය කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම් - 1,2,3 සහ 4
- සංස්කෘත භාෂාව - පස්වන ශ්‍රේණිය, පෙළපොත
- හුණුපුවරුව
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (කාරක - සමාස - තද්ධිත - තරඞ්ග)

**ඇමුණුම 1**

**01. ප්‍රථමාවිභක්තිය (කර්තෘකාරකය)**

ලිඞ්ගාර්ථයෙහි, උක්තාර්ථයෙහි, සම්බෝධනාර්ථයෙහි යෙදේ.

**02. ද්විතීයාවිභක්තිය (කර්මකාරකය)**

කර්මාර්ථයෙහි, ද්විකර්මක ධාතූන් සමග, අත්‍යන්ත සංයෝගයෙහි යෙදේ, උපසර්ග යෝගයෙහි, නිපාත යෝගයෙහි සහ ප්‍රයෝජ්‍යක්‍රියා යෝගයෙහි යෙදේ.

**03. තෘතීයාවිභක්තිය (කරණකාරකය)**

කර්තෘ කාරකයෙහි, කරණාර්ථයෙහි, සහාදි යෝගයෙහි, අඞ්ගවිකාරාර්ථයෙහි, හේතු අර්ථයෙහි සහ ඉත්ථම්භූතාර්ථයෙහි යෙදේ.

**04. චතුර්ථීවිභක්තිය (සම්ප්‍රදාන කාරකය)**

සම්ප්‍රදාන අර්ථයෙහි, ආශිර්වාද, ගෞරවාදිය ලබන්නා, ක්‍රෝධයට, ද්‍රෝහාදියට ලක්වන්නා, තාදර්ථ්‍යයෙහි යෙදේ.

**05. පඤ්චමීවිභක්තිය (අපාදාන කාරකය)**

අපාදානාර්ථය, හේත්වර්ථයෙහි, බියවීම් අර්ථය, සීමාර්ථය, **ऋते**, **आरात्** යනාදි අව්‍යයන් සමග ද, **अन्य**, **इतर** ආදි අන්‍යාර්ථ ශබ්ද හා දිශාවාචී ශබ්දයන් සමග ද යෙදේ.

**06. සප්තමීවිභක්තිය (අධිකරණ කාරකය)**

අධාරාර්ථයෙහි, නිර්ධාරණාර්ථයෙහි, අනාදරාර්ථයෙහි, භාවාර්ථයෙහි, නිමිත්තාර්ථයෙහි, ස්වාමි, ඊශ්වර හා අධිපති ආදි ශබ්ද සමග යෙදේ.

**ඇමුණුම 2**

| විභක්තිය | නිදසුන | යෙදෙන අර්ථය |
|---|---|---|
| ප්‍රථමාවිභක්තිය | मार्जारः मूषिकं खादति। | උක්තාර්ථයෙහි |
| ද්විතීයාවිභක්තිය | श्रामणेरः पुस्तकं पठति। | කර්මාර්ථයෙහි |
| තෘතීයාවිභක්තිය | मया अधुना सत्यं ज्ञातम्। | කර්තෘකාරකයෙහි |
| චතුර්ථීවිභක්තිය | स भिक्षवे चीवरं ददाति। | සම්ප්‍රදාන අර්ථයෙහි |
| පඤ්චමීවිභක්තිය | नरः वृक्षात् पतति। | අපාදානාර්ථය |
| සප්තමීවිභක්තිය | वानराः वृक्षेषु निवसन्ति। | ආධාරාර්ථයෙහි |

## ඇමුණුම 3

ක්‍රියාවකට උපකාරයක් නොලැබෙන හෙයින් සම්බෝධන හා ෂෂ්ඨී විභක්ති කාරක ගණයට නොගැනෙන නිසා ඒවා උපපද විභක්ති ලෙස හැඳින්වේ. සම්බෝධන විභක්තිය ප්‍රථමාවේ ම කොටසක් ලෙස ගැනේ.

01. **සම්බෝධන විභක්තිය** (ආමන්ත්‍රණාර්ථයෙහි යෙදේ.)

02. **ෂෂ්ඨීවිභක්තිය** (සම්බන්ධාර්ථයෙහි, නිර්ධාරණාර්ථයෙහි, අනාදරාර්ථයෙහි, හේතුප්‍රයෝගාර්ථයෙහි, ස්වාම්‍යර්ථයෙහි යන සිහිකිරීම් අර්ථයෙහි යෙදේ.)

**උපපද විභක්ති සඳහා නිදසුන්**

| | | |
|---|---|---|
| **සම්බෝධනවිභක්තිය (ආමන්ත්‍රණාර්ථය)** | देव मे तथ्यवचनं श्रूयताम् । | ආමන්ත්‍රණාර්ථයෙහි |
| **ෂෂ්ඨීවිභක්තිය (සම්බන්ධාර්ථය)** | मन्दविभवस्य पुरुषस्य बुद्धिः न पश्यति । | සම්බන්ධාර්ථයෙහි |

## ඇමුණුම 4

01. හිස්තැන් පුරවන්න.

i. साधर्म् යන්න යෙදෙන්නේ .......................... විභක්තිය සමගයි.

ii. हे යන නිපාතය යෙදෙන්නේ .......................... විභක්තිය සමගයි.

iii. සම්ප්‍රදාන අර්ථය යෙදෙන්නේ .......................... විභක්තිය සමගයි.

iv. උක්තාර්ථයෙහි, ලිංගාර්ථයෙහි .......................... විභක්තිය සමගයි.

v. කර්මාර්ථයෙහි, අත්‍යන්තසංයෝගයෙහි .......................... විභක්තිය සමගයි.

vi. අනුක්ත කර්තෘ, සහාදි නිපාතයෝගයෙහි .......................... විභක්තිය සමගයි.

vii. සම්ප්‍රදානයෝගයෙහි, තදර්ථයෙහි .......................... විභක්තිය සමගයි.

viii. අපාදානාර්ථයෙහි .......................... විභක්තිය සමගයි.

ix. සම්බන්ධාර්ථයෙහි .......................... විභක්තිය සමගයි.

x. ආධාරාර්ථයෙහි .......................... විභක්තිය සමගයි.

(ආ) පහත සඳහන් පදවල **විභක්තිය** හා වචනය ලියා දක්වන්න.

| पद | विभक्ति | वचन |
|---|---|---|
| कुमारान् | | |
| शिक्षकः | | |
| हस्तैः | | |
| रत्नेषु | | |
| दासेन | | |
| मुनिभिः | | |
| मृगान् | | |
| नरात् | | |
| फलानि | | |
| गुरोः | | |
| मालाम् | | |
| लतया | | |
| कन्यानाम् | | |
| मालयोः | | |
| वनिताः | | |
| कन्याभिः | | |
| लङ्कायाम् | | |
| लतासु | | |
| गङ्गासु | | |
| मालाभ्याम् | | |
| कवीनाम् | | |
| वनितायाः | | |
| गुरवे | | |
| साधून् | | |
| हस्ते | | |

| पद | विभक्ति | वचन |
|---|---|---|
| साधौ | | |
| पितरि | | |
| पादाभ्याम् | | |
| याचकाय | | |
| हे दारक | | |
| कपोतस्य | | |
| मित्राणि | | |
| नरैः | | |
| बालकौ | | |
| कविषु | | |
| पुस्तकेन | | |
| धेन्वोः | | |
| वने | | |
| वृक्षात् | | |
| नराणाम् | | |

# පාඩම 3 - ආඛ්‍යාතපද (අවසාන ක්‍රියාපද)

**නිපුණතාව** : 3.0 සංස්කෘත භාෂාවේ ආඛ්‍යාතපද (අවසාන ක්‍රියාපද) නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 3.1 ලට්, ලඞ්, ලෝට්, විධිලිඞ්, ලෘට් සහ ලිට් යන ලකාර, උභයපදයෙහි සහ පුරුෂත්‍රයෙහි වරනගමින් නිවැරදි ව භාවිත කරයි.

**කාලච්ඡේද** : 15 යි.

**ඉගෙනුම් පල :**

- ලියනු ලබන සරල වාක්‍යයන්හි ආඛ්‍යාතවල ඇති ලට්, ලඞ්, ලෝට්, විධිලිඞ්, ලෘට් සහ ලිට් පරස්මෛපද ප්‍රත්‍ය සහ ආත්මනෙපද ප්‍රත්‍ය වෙන්කර දක්වයි.
- දෙනු ලබන සරල වාක්‍ය සම්පූර්ණ කිරීමට සුදුසු ලට්, ලඞ්, ලෝට්, විධිලිඞ්, ලෘට් සහ ලිට් ආඛ්‍යාතපද යෝජනා කරයි.
- ලට්, ලඞ්, ලෝට්, විධිලිඞ්, ලෘට් සහ ලිට් යන ලකාර හයෙහි උභයපදයට අදාළ ව ඕනෑ ම ආඛ්‍යාතපදයක් වරනගයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- සෞන්දරනන්ද මහාකාව්‍යයේ සඳහන් වන පහත දැක්වෙන ශ්ලෝකය සජ්ඣායනා කරන්න.

**रुरोद मम्लौ विरुराव जग्लौ बभ्राम तस्थौ विललाप दध्यौ ।**
**चकार रोषं विचकार माल्यं चकर्त वक्त्रं विचकर्ष वस्त्रम् ॥**

- එහි යෙදී ඇති ලිට් ලකාර ක්‍රියාපද පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.

**පාඩම සංවර්ධනය :**

- පෙර ශ්‍රේණිවල දී ඉගෙනගත් ලට්, ලඞ්, ලෝට්, විධිලිඞ්, ලෘට් සහ ලිට් ලකාරවල උභයපදයෙහි ප්‍රත්‍යයන් හා ක්‍රියාපද කිහිපයක් සිසුන් සමග සාමූහික ව වරනගන්න.
- ඇමුණුම 1 සිසුන්ට ලබා දී ලෘට් ලකාරයේ බහුල ලෙස සදොස් ව භාවිත කෙරෙන ක්‍රියාරූප නිදොස් කර ගන්නා අයුරු පැහැදිලි කර දෙන්න.
- ඇමුණුම 2 වගුවලින් දැක්වෙන වරනැගීම් නිවැරදි ව උච්චාරණය කිරීමටත්, වනපොත් කිරීමටත් සිසුන්ට උපදෙස් දෙන්න.

- ඇමුණුම 3 අභ්‍යාසය සහ පෙළපොතෙහි 4, 5 පාඩම්වල සඳහන් ලෘට් හා ලිට් ලකාරවලට අදාළ අභ්‍යාස කිරීමට සිසුන් යොමු කරවන්න.

**මූලික වදන් සංකල්පය :**

- ලෘට්
- ලිට්

**ඇගයීම හා තක්සේරුකරණය :**

- දෙනු ලබන ආඛ්‍යාතපදයක ලකාරය අනුව ධාතුමූලය හා ප්‍රත්‍යය වෙන් වෙන් ව ප්‍රකාශ කිරීම
- ලට්, ලඞ්, ලෝට්, විධිලිඞ්, ලෘට් සහ ලිට් යන ලකාරවල උභයපදයට අදාළ ව ධාතු වරනගා උචිත පරිදි භාවිත කිරීම
- ලට්, ලඞ්, ලෝට්, විධිලිඞ්, ලෘට් සහ ලිට් යන ලකාරවල ආඛ්‍යාතපද භාවිත කරමින් සරල වාක්‍යයන් නිර්මාණය කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 1,2 සහ 3
- සංස්කෘත භාෂාව - පස්වන ශ්‍රේණිය, පෙළපොත
- සෞන්දරනන්ද මහාකාව්‍යය
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (ආඛ්‍යාත - කෘදන්ත - තරඞ්ග)

ඇමුණුම 1

| ධාතුව | ලට් | ලෘට් වැරදි | ලෘට් නිවැරදි |
|---|---|---|---|
| लिख् | लिखति | लिखिष्यति | लेखिष्यति |
| मिल् | मिलति | मिलिष्यति | मेलिष्यति |
| पच् | पचति | पचिष्यति | पक्ष्यति |
| दंश् | दशति | दशिष्यति | दंक्ष्यति |
| दह् | दहति | दहिष्यति | दक्ष्यति |
| वह् | वहति | वहिष्यति | वक्ष्यति |
| शक् | शक्नोति | शक्नोष्यति | शक्ष्यति |
| दृश् | पश्यति | पश्शिष्यति | द्रक्ष्यति |
| प्रच्छ् | पृच्छति | पृच्छिष्यति | प्रक्ष्यति |
| नी | नयति | नयिष्यति | नेष्यति |
| जि | जयति | जयिष्यति | जेष्यति |
| क्री | क्रीणाति | क्रीणिष्यति | क्रेष्यति |
| पा | पिबति | पिबिष्यति | पास्यति |
| गै | गायति | गायिष्यति | गास्यति |
| वा | वाति | वाष्यति | वास्यति |
| दा | ददाति | ददिष्यति | दास्यति |
| स्था | तिष्ठति | स्थाष्यति | स्थास्यति |
| म्लै | म्लायति | म्लिष्यति | म्लास्यति |
| घ्रा | जिघ्रति | जिघ्रिष्यति | घ्रास्यति |
| वप् | वपति | वपिष्यति | वप्स्यति |
| वस् | वसति | वसिष्यति | वत्स्यति |
| तुद् | तुदति | तुदिष्यति | तोत्स्यति |

ඍට් ලකාර පරස්මෛපද ප්‍රත්‍යයන් සහ कृ ධාතුව වරනැගෙන අයුරු

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|---|---|---|
| प्रथमपुरुष | ष्यति | ष्यतः | ष्यन्ति | करिष्यति<br>කරන්නේ ය. | करिष्यतः<br>(දෙදෙන) කරන්නෝ ය. | करिष्यन्ति<br>කරන්නා හ. |
| मध्यमपुरुष | ष्यसि | ष्यथः | ष्यथ | करिष्यसि<br>කරන්නෙහි. | करिष्यथः<br>(දෙදෙන) කරන්නෙහු. | करिष्यथ<br>කරන්නෙහු. |
| उत्तमपुरुष | ष्यामि | ष्यावः | ष्यामः | करिष्यामि<br>කරන්නෙමි. | करिष्यावः<br>(දෙදෙන) කරන්නෙමු. | करिष्यामः<br>කරන්නෙමු. |

ඍට් ලකාර ආත්මනෙපද ප්‍රත්‍යයන් සහ कृ ධාතුව වරනැගෙන අයුරු

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|---|---|---|
| प्रथमपुरुष | ष्यते | ष्येते | ष्यन्ते | करिष्यते | करिष्येते | करिष्यन्ते |
| मध्यमपुरुष | ष्यसे | ष्येथे | ष्यध्वे | करिष्यसे | करिष्येथे | करिष्यध्वे |
| उत्तमपुरुष | ष्ये | ष्यावहे | ष्यामहे | करिष्ये | करिष्यावहे | करिष्यामहे |

ලිට් ලකාර පරස්මෛපද ප්‍රත්‍යයන් සහ भू ධාතුව වරනැගෙන අයුරු

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|---|---|---|
| प्रथमपुरुष | अ | अतुः | उः | बभूव<br>වීලු. | बभूवतुः<br>(දෙදෙනෙක්) වූවෝලු. | बभूवुः<br>වූවෝලු. |
| मध्यमपुरुष | थ | अथुः | अ | बभूविथ<br>වූවෙහිලු. | बभूवथुः<br>(දෙදෙනෙක්) වූවෙහුලු. | बभूव<br>වූවෙහුලු. |
| उत्तमपुरुष | अ | व | म | बभूव<br>වූයෙමිලු. | बभूविव<br>(දෙදෙනෙක්) වූයෙමිල. | बभूविम<br>වූයෙමිල. |

ලිට් ලකාර ආත්මනෙපද ප්‍රත්‍යයන් සහ **भू** ධාතුව වරනැගෙන අයුරු

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|---|---|---|
| प्रथमपुरुष | ए | आते | इरे | बभूवे | बभूवाते | बभूविरे |
| मध्यमपुरुष | से | आथे | ध्वे | बभूविषे | बभूवाथे | बभूविध्वे |
| उत्तमपुरुष | ए | वहे | महे | बभूवे | बभूविवहे | बभूविमहे |

ඇමුණුම 3

01. පහත වගුව සම්පූර්ණ කරන්න.

| लट् | लृट् | लङ् | लोट् | विधिलिङ् |
|---|---|---|---|---|
| धावति දුවයි | | | | |
| गच्छति යයි | | | | |
| करोति කරයි | | | | |
| हसति සිනාසෙයි | | | | |
| स्मरति සිහිකරයි | | | | |
| पिबति බොයි | | | | |
| तिष्ठति සිටියි | | | | |

02. **बालकः पुस्तकानि पठति।** යන වාක්‍යයන් ආදර්ශයට ගෙන ( **ළමයා පොත් හදාරයි.**) යන්න ලකාර හයට පරිවර්තනය කරන්න.

01. ලට් — වර්තමානකාලය — **स नगरं गच्छति।**

02. ලෘට් — අනාගතකාලය — **स नगरं गमिष्यति।**

03. ලඞ් — අතීතකාලය — **स नगरम् अगच्छत्।**

04. ලෝට් — ප්‍රාර්ථනාර්ථය — **स नगरं गच्छतु।**

05. විධිලිඞ් — විධි, සම්භාවනාර්ථය — **स नगरं गच्छेत्।**

06. ලිට් — පරෝක්ෂාතීතාර්ථය — **स नगरं जगाम।**

03. උදාහරණය ආශ්‍රයෙන් සුදුසු පරිදි වගු සම්පූර්ණ කරන්න.

| | | | |
|---|---|---|---|
| लट् | වර්තමාන කාලය | लोट् | |
| लृट् | | विधिलिङ् | |
| लङ् | | लिट् | |

04. පහත සඳහන් වගුව සුදුසු පරිදි සම්පූර්ණ කරන්න.

| आख्यातपद | लकार | वचन | अर्थः |
|---|---|---|---|
| पठावः | ලට් | ද්විවචන | දෙදෙන පාඩම් කරමු |
| वपन्ति | ලට් | බහුවචන | |
| लिखतु | | | ලියාවා |
| लेखिष्यामः | | බහුවචන | ලියන්නෙමු |
| वदतु | ලෝට් | | කියාවා |
| नृत्यथ | | බහුවචන | නටහු |
| ताडयति | ලට් | ඒකවචන | |
| अगच्छम् | ලඞ් | | ගියෙමි |
| पश्यन्ति | ලට් | බහුවචන | බලති |
| अधावन् | | බහුවචන | දිවූහ |
| अयच्छः | ලඞ් | | දුන්නෙහි |
| पठामि | ලට් | ඒකවචන | |
| पश्यथ | ලට් | බහුවචන | |
| वदन्तु | | බහුවචන | කියත්වා |
| अगच्छम् | ලඞ් | | ගියෙමු |
| लभते | ලට් | | ලබයි |
| नृत्यसि | ලට් | ඒකවචන | |
| अभवत | ලඞ් | බහුවචන | |

| आख्यातपद | लकार | वचन | अर्थः |
|---|---|---|---|
| ताडयसि | | ඒකවචන | තලහි/ ගසහි |
| लिखावः | | ද්විවචන | දෙදෙන ලියමු |
| अगच्छामः | ලඞ් | බහුවචන | |
| वदिष्यन्ति | ලෘට් | බහුවචන | |
| पश्यसि | ලට් | ඒකවචන | දකිහි / බලහි |
| अपिबत् | | | බීවේ ය |
| अपठन् | ලඞ් | | |
| पततः | | ද්විවචන | දෙදෙන වැටෙත් |
| अगच्छत् | ලඞ් | | |
| अभवाम | ලඞ් | බහුවචන | |
| लिखामः | | | ලියමු |
| अपठत् | ලඞ් | | |
| जयथ | | | දිනහු |
| तिष्ठतु | ලෝට් | | |
| गाय | | | ගායනා කරව |
| अपठताम् | ලඞ් | ද්විවචන | |
| पश्यामः | ලට් | | |
| जयथः | | | දෙදෙන දිනහු |
| पचते | ලට් | | උයයි/පිසයි |
| पतिष्यामि | | | වැටෙන්නෙමි |
| अधावत् | ලඞ් | ඒකවචන | |
| तिष्ठामि | ලෝට් | ඒකවචන | |
| अयच्छामः | | | දුන්නෙමු |
| गायत | ලෝට් | බහුවචන | |
| खनिष्यामः | | | හාරන්නෙමු |
| हसिष्यति | ලෘට් | | |

# පාඩම 4 - විසර්ගසන්ධි

**නිපුණතාව** : 4.0 සංස්කෘත භාෂාවේ සන්ධි නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 4.1 විසර්ගසන්ධියේ යෙදීම් අවබෝධයෙන් යුතු ව භාවිත කරයි.

**කාලච්ඡේද** : 09 යි.

**ඉගෙනුම් පල** :

- විසර්ගසන්ධිය සහිත වචන නම් කරයි.
- විසර්ගසන්ධි ප්‍රභේද නම් කරයි.
- විසර්ගසන්ධිය සහිත වචන ප්‍රභේදවලට වෙන් කරයි.
- විසර්ගසන්ධි ප්‍රභේද පැහැදිලි කරයි.
- විසර්ගසන්ධි ප්‍රභේදවලට නිදසුන් ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් විසර්ගසන්ධිය සහිත පද උපුටා දක්වයි.
- විසර්ගසන්ධිපද විසන්ධි කොට සන්ධිය සෑදී ඇති ආකාරය මතුකර පෙන්වයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**ප්‍රවේශය :**

- පහත සඳහන් ශ්ලෝකය හුණුපුවරුවේ ලියන්න.
  **अन्तः सारैरकुटिलैरच्छिद्रैः सुपरीक्षितैः ।**
  **मन्त्रिभिर्धार्यते राज्यं सुस्तम्भैरिव मन्दिरम् ॥**
- එහි ඉරි ඇඳි පද විසර්ගසන්ධි බව පැහැදිලි කර දෙන්න.
- එහි ඉරි ඇඳි සියලු සන්ධිපද විසන්ධි කර හුණුපුවරුවේ ලිවීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- විසන්ධි කරන ලද සන්ධිපද හුණුපුවරුවෙහි ලිවීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- විසර්ගසන්ධි ගොඩනැගෙන ආකාරය පෙන්වා දෙන්න.

**පියවර 1**

- ඇමුණුම 1 සිසුන්ට ලබාදෙමින් විසර්ගසන්ධියක් හඳුනාගැනීමේ දී විසර්ගය හා සම්බන්ධ වන සන්ධිකාර්යයක් සිදුවන බව පෙන්වා දෙන්න.
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (සංඥා - සන්ධි - නාම - තරඞ්ග) සහ පෙළපොත ඇසුරින් විසර්ග සන්ධියෙහි ප්‍රධාන ප්‍රභේද තුන සහ අනුප්‍රභේද ඇතිබව පැහැදිලි කරන්න.
- එම ප්‍රභේද සහ අනුප්‍රභේදවලට නිදසුන් සපයන්න.

**පියවර 2**

- දෙන ලද ගද්‍ය ඡේදයක් ඇසුරෙන් විසර්ග සන්ධිපද උපුටා ඒවා විසන්ධිකොට දක්වීමට සලස්වන්න.
- පන්තියෙහි සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා එක් කණ්ඩායමකින් අසන ලද සන්ධිපද අනෙක් කණ්ඩායමට විසන්ධි කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- මෙසේ අවස්ථා හුවමාරු කොට පෙළපොතෙහි අභ්‍යාසවල නිරත කරවන්න.
- සංස්කෘත පාඨමාලා 5 ග්‍රන්ථයෙහි සඳහන් සිසුන් කැමති ඕනෑ ම ගද්‍යපද්‍ය පාඨයකින් විසර්ග සන්ධිපද දහයක් උපුටා දක්වා ඒවා විසන්ධි කොට දක්වීමට උපදෙස් දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- විසර්ග සන්ධිපදයක් හඳුනාගන්නා අයුරු පැහැදිලි කිරීම
- ගද්‍ය ඡේදවලින් විසර්ග සන්ධිපද උපුටා දැක්වීම
- විසර්ගසන්ධියෙහි ප්‍රභේද සහ අනුප්‍රභේද නම් කිරීම
- විසර්ගසන්ධියෙහි ප්‍රභේද අනුප්‍රභේද නිදසුන් ඇසුරෙන් පැහැදිලි කිරීම
- නිර්දිෂ්ටග්‍රන්ථවල ඇති විසර්ග සන්ධිපද විසන්ධිකොට කොට දක්වීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 1
- සංස්කෘත භාෂාව - පස්වන ශ්‍රේණිය, පෙළපොත
- සංස්කෘත පාඨමාලා 5 ග්‍රන්ථය
- ව්‍යාකරණ තරඞ්ගිණී (සංඥා - සන්ධි - නාම - තරඞ්ග)
- සාරස්වතය

**ඇමුණුම 1**

විසර්ගය (ඃ) සංස්කෘත නාමපදවලට විශේෂ වූවකි. එම විසර්ගය මූලික වී ලෝප ආදේශාදි සන්ධි විධි උපයෝගී කොටගෙන සාදාගනු ලබන සන්ධිය විසර්ගසන්ධිය නම් වේ. විසර්ගසන්ධියේ මුල්පදයේ අග විසර්ගය යෙදී තිබීම මෙහි මූලික ම ලක්ෂණය යි.

अन्तः सारैरकुटिलैरच्छिद्रैः सुपरीक्षितैः ।
मन्त्रिभिर्धार्यते राज्यं सुस्तम्भैरिव मन्दिरम् ॥

ඉහත ශ්ලෝකයෙහි යටින් ඉරි ඇඳි පදවල විසන්ධි රූප මෙසේ ය.

१. अन्तः सारैः + अकुटिलैः + अच्छिद्रैः २. मन्त्रिभिः + धार्यते ३. सुस्तम्भैः + इव

එහි දී සිදුවී ඇත්තේ විසර්ගයට (ඃ) र् කාරාදේශය වීම යි.

නාමින් අක්ෂරයක් + ඃ + ස්වර හෝ ඝෝෂ

सारैः + अकुटिलैः

सार् + ऐ + ः + अकुटिलैः

නාමින් ස්වර විසර්ගය ස්වරයක් හෝ ඝෝෂයක් තිබීම

सारै + र् + अकुटिलैः

सारै + र + कुटिलैः

सारैरकुटिलैः

මෙම සන්ධිපද र කාරාදේශයට අයත් වේ. විසර්ගය සඳහා र කාරය ආදේශවීම මෙහි දී සිදුවේ. නාමින් අකුරකින් පර වූ විසර්ගයට ස්වරයකින් හෝ ඝෝෂාක්ෂරයක් පසු අකුර ලෙස යෙදුණු විට र කාරයක් ආදේශ වේ. (නාමිනො රඃ)

උදාහරණ

(पटुः + यजते = पटुर्यजते / कतिः + एति = कतिरेति / कपिः + धावति = कपिर्धावति
रविः + लसति = रविर्लसति)

# පාඩම 5 - ප්‍රකෘතිභාවසන්ධි

**නිපුණතාව** : 4.0 සංස්කෘත භාෂාවේ සන්ධි නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 4.2 ප්‍රකෘතිභාව සන්ධියේ යෙදීම් අවබෝධයෙන් යුතු ව භාවිත කරයි.

**කාලච්ඡේද** : 06 යි.

**ඉගෙනුම් පල** :

- ප්‍රකෘතිභාවසන්ධිය සහිත වචන නම් කරයි.
- ප්‍රකෘතිභාවසන්ධිය යෙදෙන අවස්ථා විස්තර කරයි.
- නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් ප්‍රකෘතිභාවසන්ධිය සෑදී ඇති ආකාරය මතුකොට පෙන්වයි.
- ප්‍රකෘතිභාව සන්ධිපද විසන්ධි කොට සන්ධිය සෑදී ඇති ආකාරය මතුකොට පෙන්වයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- ඇමුණුම 1 ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවා අදාළ කරුණු සාකච්ඡා කරන්න.
- පහත ශ්ලෝකපාඨය යොදා ගනිමින් ප්‍රකෘතිභාවසන්ධියේ සුවිශේෂ බව මතුකර පෙන්වන්න.

  **ප්‍රකෘතේර්යථාස්ථිතස්‍ය රූපස්‍ය භවනං ප්‍රකෘතිභාවඃ**

  (ස්වකීය ස්වරූපයෙන් ම පිහිටි රූපයාගේ පැවැත්ම ප්‍රකෘතිභාව නම්.)

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- ඇමුණුම 2 සිසුන්ට සපයා සන්ධි විසන්ධි දෙකෙහි ම ප්‍රකෘතියෙන් හෙවත් ස්වභාවයෙන් ම සිටින සන්ධි ප්‍රකෘතිභාවසන්ධි බව නිදසුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.
- වෙන්කරන ලද ප්‍රකෘතිභාව සන්ධිපද කිහිපයක් හුණුපුවරුවෙහි ලියා ඒවා ප්‍රකෘතිභාව සන්ධිපද ලෙස සකස් කිරීමට අවස්ථාව ලබාදෙන්න.
- සකස්කරන ලද ප්‍රකෘතිභාව සන්ධිපදවල අර්ථය ලිවීමට සිසුන්ට පවරන්න.

**පියවර 2**

- ඇමුණුම 2 යොදා ගනිමින් ප්‍රකෘතිභාවසන්ධියෙහි විශේෂ ප්‍රභේද නොමැති බවත්, විවිධ හේතුන් මත සන්ධි කිරීමේ හැකියාව ඇතත් ස්වභාවයෙන් ම සන්ධිය වූ අවස්ථා ඇති බවත් පැහැදිලි කරන්න.
- එවැනි අවස්ථා නිදසුන් ඇසුරෙන් විස්තර කරන්න.

- පෙළපොත, ව්‍යාකරණ තරඞ්ගිණී (සංඥා - සන්ධි - නාම - තරඞ්ග) සහ ඇමුණුම 3 ඇසුරින් පහත සඳහන් කාර්යවල සිසුන් යොදවන්න.

– වාක්‍යවල ඇතුළත් ප්‍රකෘතිභාවසන්ධි උපුටා දක්වා ඒවායෙහි ලක්ෂණ පැහැදිලි කිරීම

– විසන්ධි කරන ලද ප්‍රකෘතිභාව සන්ධිපද නැවත සන්ධි කොට ඒවායෙහි සන්ධි රීතිය යෙදෙන අවස්ථා ලිවීම

– සන්ධිප්‍රභේද සියල්ලට අයත්වන සේ ලබාදෙන සන්ධිපද රාශියක් අතුරෙන් ප්‍රකෘතිභාව සන්ධිපද වෙන්කර දක්වීම

– නිර්දිෂ්ට ගද්‍යපද්‍ය පාඨවලින් ප්‍රකෘතිභාව සන්ධිපද තෝරා ඒවායෙහි ප්‍රකෘතිභාව අවස්ථාව සඳහන් කොට එහි අර්ථ ලිවීම

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ප්‍රකෘතිභාවසන්ධි යනු කුමක්දැයි පැහැදිලි කිරීම
- පාඨග්‍රන්ථවල සඳහන් ප්‍රකෘතිභාව සන්ධිපද උපුටා දක්වීම
- ප්‍රකෘතිභාව සන්ධිපද සකස් ව ඇති ආකාරය උදාහරණ ඇසුරෙන් විස්තර කිරීම
- දෙන ලද සන්ධිපද සමූහයක් අතුරින් ප්‍රකෘතිභාව සන්ධිපද තෝරා දක්වීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 1,2 සහ 3
- ඇමුණුම 1 ක්‍රියාකාරකමට අවශ්‍ය කාසි
- සංස්කෘත භාෂාව - පස්වන ශ්‍රේණිය, පෙළපොත
- සංස්කෘත පාඨමාලා 5 ග්‍රන්ථය
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (සංඥා - සන්ධි - නාම - තරඞ්ග)
- සාරස්වතය

**ඇමුණුම 1**

රු.10, රු.5, රු.2, රු.1, වර්ගවලට අයත් කාසි හෝ පහසුවෙන් සපයාගත හැකි ඕනෑම වර්ගයක කාසි පහ බැගින් වන සේ ගෙන ඒවා සියල්ල බඳුනකට දමන්න. එම බඳුනට ම පැරණි කාසි කිහිපයක් විදෙස් කාසි හෝ කාසි හැඩය ගත් අනුහුරු කීපයක් දමා මිශ්‍රකොට සිසුන්ට එම කාසි අගය අනුව ගොඩවල් පහකට වර්ග කිරීමට සලස්වන්න. සිසුන් කාසිවර්ග කරන අයුරු නිරීක්ෂණය

කොට එසේ වර්ග කිරීමට හේතු විමසන්න. එකදු වර්ගයකට හෝ ඇතුළත් කළ නොහැකි කාසි පොදු ගොඩකට එකතුකොට ඇති බව නිරීක්ෂණය වන්නේ නම් එම කාසි අනෙක් ගොඩවලට ඇතුළත් නොකිරීමට හේතු විමසන්න. සිසුන්ගෙන් ලැබෙන පිළිතුරු ද උපයෝගී කොටගෙන විවිධ වර්ග හා අගයන් හෝ සමාන නොවන නිසා පොදු ගොඩක් ලෙස තබන බව වටහා දෙන්න. එසේ ම විවිධ හැඩතල පැවතිය ද අගයෙන් සමාන කාසි එක් එක් ගොඩවලට ඇතුළත් කළා සේ භාෂාවේ පද වෙන් කිරීමේ දී ද එවැනි පිළිවෙතක් අනුගමනය කරන බවත් විශේෂයෙන් සන්ධිවල දී පැහැදිලි ව එම වෙනස දැකිය හැකි බවත් ස්වර, ව්‍යඤ්ජන, අනුස්වාර සහ විසර්ග වශයෙන් එම සන්ධිප්‍රභේද හතරක් දක්වා එම සන්ධිප්‍රභේදයන්ට කුමන හෝ හේතුවක් නිසා ඇතුළත් කළ නොහැකි සන්ධිපද ප්‍රකෘතිභාව යනුවෙන් සන්ධිප්‍රභේදයකට ඇතුළත් කොට ඇති බවත් එය කාසි වර්ග කිරීමේ නිදර්ශනයට අනුරූප වන බවත් පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

**ඇමුණුම 2**

**इह | अमी अश्वाः | इतस्ततो धावन्ति ।**

යන වාක්‍යයෙහි කොටුකරන ලද **अमी अश्वाः** පද දෙක **इयं स्वरे** යන සන්ධිරීතියට අනුව සන්ධි කළ හැකි වුවත් මෙහි දී සන්ධි කිරීමක් සිදු නොවෙයි. මෙලෙස සන්ධි කළ හැකි තැන් සන්ධි නොකොට තිබීම ප්‍රකෘතිභාවසන්ධිය නමින් හඳුන්වයි. එයට හේතුව වනුයේ **अदस्** ශබ්දයේ බහුවචන රූපය වන **अमी** ශබ්දයේ අන්තය පරපදයක් හා සන්ධි නොවීම යි.

| अदस् | ඒකවචන | ද්විවචන | බහුවචන |
|---|---|---|---|
| | असौ | अमू | अमी |
| | असावश्वः | अम्वश्वौ | अमी अश्वाः |

- **ප්‍රකෘතිභාව සන්ධිය භාවිත වන අවස්ථා ඇති බව පැහැදිලි කරන්න.**

  **පළමු අවස්ථාව :** වරනැගුණු පසු **ई ऊ ए** කාරාන්ත ව සිටින ද්විවචන ශබ්දරූප පරපදයක් හා සන්ධි නොවේ. (**යෙව ද්විත්වෙ**)

**अग्नी + अत्र = अग्नी अत्र / पटू + अत्र = पटू अत्र / माले + आनय = माले आनय**

**දෙවන අවස්ථාව :** **अदस्** ශබ්දයේ ප්‍රථමා බහුවචනය වන **अमी** යන රූපයේ අන්තය පරපදයක් හා සන්ධි නොවේ. (අමී)

**अमी + आदित्यः = अमी आदित्याः / अमी + उत्तमाः = अमी उत्तमाः**

**अमी + अजाः = अमी अजाः**

**තෙවන අවස්ථා :** නිපාත වශයෙන් සිටි තනි ස්වර සන්ධි නොවේ. (**ඔෟ නිපාතඃ**)

**आ एवं मन्यसे / नो अत्र स्थातत्यम् / उ उत्तिष्ठ / इ इन्द्र पश्य**

**සිව්වන අවස්ථව :** ප්ලුත සන්ධි නොවේ.

**देवदत्त... एहि / बाल... इह / देवदत्त... अत्र गाः चरति**

**පස්වන අවස්ථාව :** **ओ** කාරාන්ත නිපාත ද **है** / **हे** යන නිපාත දෙක ද ස්වරයක් පරකල්හි සන්ධි නොවේ.

**नो अत्र स्थातव्यम् / अहो ईश्वर / है अनड्वन् / हे इन्द्र**

**සයවන අවස්ථාව :** ඍතු ශබ්දය පරකල්හි පෙරටුව සිටි සමානස්වරය විකල්පයෙන් සන්ධි නොවේ.

**हिम + ऋतुः = हिम ऋतुः**

**ඇමුණුම 3**

01. පහත සඳහන් වාක්‍යවල ප්‍රකෘතිභාව සන්ධිපද ඇතුළත් වේ. එම සන්ධිපද උපුටා ඒවායෙහි අවස්ථා පැහැදිලි කරන්න.

१. अमी अजाः अङ्गणे धावन्ति ।

२. माता आह दुहितः शीघ्रं गत्वा माले आनय ।

३. हे इन्द्र पश्य ।

४. अहो आषाडभूते ।

५ आगच्छ कृष्ण अत्र गौश्चरति ।

६. श्रुणु हरे अत्रेयं गोपि ।

७. पश्य गुरो एष मां ताडयति ।

८. हे अग्रज तत्र गच्छ ।

९ हे ईश्वर रक्ष ।

१०. मणी इह ज्वलतः ।

02. විවිධ වර්ගවලට අයත් සන්ධිප්‍රභේද අතුරින් ප්‍රකෘතිභාව සන්ධිපද පමණක් තෝරමු.

| | | | | | |
|---|---|---|---|---|---|
| चन्द्र | + आलोकः | = चन्द्रालोकः | अहो | + आषाढभूते | = अहो आषाढभूते |
| देव | + आलयः | = देवालयः | अमी | + उत्तमा | = अमी उत्तमा |
| हित | + उपदेशः | = हितोपदेशः | कन्ये | + अत्र | = कन्ये अत्र |
| नै | + अकः | = नायकः | वाक् | + अर्थः | = वागर्थः |
| हे | + आर्ये | = हे आर्ये | दिक् | + गजः | = दिग्गजः |
| किं | + अपि | = किमपि | दम्पती | + एव | = दम्पती एव |
| जलं | + आदाय | = जलमादाय | अ | + अपेहि | = अ अपेहि |
| मनः | + रथः | = मनोरथः | मणी | + इह | = मणी इह |
| पुनः | + भवः | = पुनर्भवः | देवदत्त | + एहि | = देवदत्त एहि |
| अहो | + ईश्वरः | = अहो ईश्वरः | सत् | + धर्मः | = सद्धर्मः |

03. පහත සඳහන් විසන්ධිවලට අදාළ සන්ධිපදය වරහන් තුළින් තෝරා ලියන්න.

(अग्निर्दहति / दिग्गजः / मध्वानय / सद्वस्तु / भानूदयः / पुण्योदकम् / नभो / गर्भः / नामेति / पुत्रैरपि आयुर्वेदः / मनोमय / अत्रैव / जात्यालयः / देवेन्द्रः / रामोऽवदत् / बालावागच्छतः / पुस्तकान्यानयति हिमालयः / पूर्णेन्दुः / शीतोदकम् / बालानाह्वयति / जयन्तोऽवदत् / पद्माकरः / नद्यैव / स्वामीक्षते धेनुर्धावति / पुष्पोद्यानम् / सज्जनः / कविर्लिखति / विद्योदयः / तच्छिल्पम् / अत्रौषधी / वस्त्वानयति कर्तुरीप्सितम् / अगच्छद्रविः / महदन्तरम् )

01. अत्र + एव =

02. अग्निः + दहति =

03. नाम + इति =

04. जाति + आलयः =

05. देव + इन्द्रः =

06. दिक् + गजः =

07. पूर्ण + इन्दुः =

08. आयुः + वेदः =

09. मधु + आनय =

10. रामः + अवदत् =

11. शीत + उदकम् =

12. सत् + जनः =

13. पुत्रैः + अपि =

14. सत् + वस्तु =

15. हिम + आलयः =

16. भानु + उदयः =

17. कविः + लिखति =

18. बालान् + आह्वयति =

19. पुस्तकानि + आनयति =

20. पुण्य + उदकम् =

21. जयन्तः + अवदत् =

22. अगच्छत् + रविः =

23. बालौ + आगच्छतः =

24. नभस् + गर्भः =

25. पद्म + आकरः =

26. विद्या + उदयः =

27. तत् + शिल्पम् =

28. नद्या + एव =

29. कर्तुः + ईप्सितम् =

30. अत्र + ओषधी =

31. स्वामी + ईक्षते =

32. वस्तु + आनयति =

33. धेनुः + धावति =

34. महत् + अन्तरम् =

35. पुष्प + उद्यानम् =

36. मनस् + मय =

04. පහත සඳහන් සන්ධිපදවලට අදාළ විසන්ධිපද වරහන් තුළින් තෝරා ලියන්න.

( कः + अत्र / माम् + अन्तरेण / वक्र + उक्तिः / तरु + छाया / आयुः + वेदः / राज + ऋषिः प्रातर् + कालः / मधु + उच्छिष्टः / मही + इन्द्रः / नभः + तलम् / कालिदास + आदीनाम् विद्या + उदयः / लिम्पति + इव / नदी + अत्र / सम्यक् + उक्तम् / बालकौ + आगच्छतः महा + इन्द्रः / साधयामः + तावत् / वदन् + इति / अगमन् + ततः / कविः + लिखति किन्तु + उदेति / युद्ध + उपकरणानि / बालौ + आगच्छतः / महा + ओषधिः / जाति + अन्धः महत् + बलः / वितानि + आकुलानि / अत्र + एहि / आयुस् + वर्धत/ पशून् + आनय/ विद्युत् + माला/ काश्यपः + अवदत् / शरत् + चन्द्रः/ अर्जुनः + टीकत/ जयन्तः + चिन्तयति )

01. मामन्तरेण =

02. विद्योदयः =

03. कोऽत्र =

04. वदन्निति =

05. अगमंस्ततः =

06. वितान्याकुलानि =

07. कालिदासादीनाम् =

08. साधयामस्तावत् =

09. तरुच्छाया =

10. किन्तूदेति =

11. नद्यत्र =

12. कविर्लिखति =

13. अत्रैहि =

14. जयन्तश्चिन्तयति =

15. आयुर्वेदः =

16. युद्धोपकरणानि =

17. शरच्चन्द्रः =

18. राजर्षिः =

19. सम्यगुक्तम् =

20. बालावागच्छतः =

21. अर्जुनष्टीकते =

22. प्रातःकालः =

23. बालकावागच्छतः =

24. आयुर्वर्धते =

25. मधूच्छिष्टः =

26. महौषधिः =

27. जात्यन्धः =

28. महीन्द्रः =

29. पशूनानय =

30. महेन्द्रः =

31. काश्यपोऽवदत् =

32. महद्बलः =

33. विद्युन्माला =

34. नभस्तलम् =

35. लिम्पतीव =

36. वक्रोक्तिः =

# පාඩම 6 - කර්මධාරය සමාසපද

**නිපුණතාව** : 5.0 සංස්කෘත භාෂාවේ සමාස නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 5.1 කර්මධාරය සමාසපද අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කරයි; ලියයි.

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල** :

- කර්මධාරය සමාසය හඳුන්වයි.
- කර්මධාරය සමාසපද නම් කරයි.
- කර්මධාරය සමාසප්‍රභේද නම් කරයි.
- කර්මධාරය සමාසප්‍රභේද නිදසුන් සහිත ව පහදයි.
- නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් කර්මධාරය සමාසපද උපුටා දක්වයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- එකම වර්ගයකට අයත් විවිධ වර්ණයෙන් යුතු මල්වර්ග කිහිපයක් හුණුපුවරුවෙහි ලිවීමට සිසුන් යොමු කරන්න.
- රතු, සුදු, නිල් යනු විශේෂණපද බව අවධාරණය කරවන්න.
- එවැනි පද ඇතුළත් සමාස ප්‍රභේදය කර්මධාරයසමාසය බව පහත පාඨය මගින් තහවුරු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

  **කර්මධාරයස්තුල්‍යාර්ථෙ**

  (තුල්‍යාධිකරණ විශේෂණ විශේෂ්‍ය දෙකක් සමාස වේ නම් එය කර්මධාරය යි.)

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- සිසුන් දන්නා විශේෂණපද සහිත සිංහල වචන හුණුපුවරුවෙහි ලියවන්න.
- සිසුන් විසින් ලියන ලද සිංහල වචනවලට අනුරූප සංස්කෘත වචනය ද සිසුන් සමග සාකච්ඡා කොට හුණුපුවරුවේ ලියවන්න.
- මෙම වචන සැකසී ඇත්තේ කිසියම් විශේෂ්‍යයක් හා විශේෂණපදයක් එකතුවීමෙන් බවත් එවැනි පද කර්මධාරයසමාසයට අයත්වන බවත් පෙන්වා දෙන්න.
- ඇමුණුම 1 යොදාගනිමින් වෙන් වෙන් ව සකසන ලද විශේෂණ විශේෂ්‍යපද සහිත වචන මගින් කර්මධාරය සමාසපද ගොඩනැගීමට සිසුන් මෙහෙයවන්න.
- ගොඩනගන ලද කර්මධාරයසමාසවල අර්ථය ලිවීමට සිසුන්ට පවරන්න.

## පියවර 2

- කර්මධාරයසමාසයෙහි ඇති ප්‍රභේද නවය සිසුන්ට ඉදිරිපත් කරන්න.
- පෙළ පොත, සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (කාරක - සමාස - තද්ධිත - තරඞ්ග) සහ සාරස්වතය යොදා ගනිමින්
- එම ප්‍රභේද එකිනෙක නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.
- විග්‍රහ වාක්‍ය සහිත පද කර්මධාරය සමාසපද ලෙස ගොඩනැගීමටත්, කර්මධාරය සමාසපද කිහිපයක විග්‍රහ වාක්‍යය ගොඩනැගීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- නිර්දිෂ්ට ගද්‍යපද්‍ය පාඨග්‍රන්ථවලින් කර්මධාරය සමාසපද උපුටා දක්වා, ඒවායෙහි විග්‍රහ වාක්‍යය සකසා, එහි අර්ථය ද ලිවීමට සිසු කණ්ඩායම් මෙහෙයවන්න.
- ඒවා කර්මධාරයසමාසයෙහි ප්‍රභේදවලට අනුව වර්ග කරවන්න.

## ඇගයීම හා තක්සේරුකරණය :

- කර්මධාරයසමාසය යනු කුමක්දැයි අර්ථ දැක්වීම
- කර්මධාරයසමාසයෙහි ප්‍රභේද නම් කිරීම
- කර්මධාරයසමාසයට අයත් ප්‍රභේදවලට නිදසුන් දැක්වීම
- කර්මධාරයසමාසයක විග්‍රහ වාක්‍යය නිවැරදි ව ගොඩනැගීම
- විග්‍රහ වාක්‍යයට අනුරූප කර්මධාරය සමාසපදය ගොඩනැගීම
- කර්මධාරයසමාසයට අයත් සමාසපද සමූහයක් ප්‍රභේද අනුව වර්ග කිරීම

## ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 1
- සංස්කෘත භාෂාව - පස්වන ශ්‍රේණිය, පෙළපොත
- සංස්කෘත පාඨමාලා 5 ග්‍රන්ථය
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (කාරක - සමාස - තද්ධිත - තරඞ්ග)
- සාරස්වතය

## ඇමුණුම 1

කර්මධාරය සමාසපදයක් සැකසීමේ දී එහි විග්‍රහ වාක්‍යය ද වැදගත් වේ. විග්‍රහ වාක්‍යය පද කිහිපයක් එකතුව සෑදෙන්නකි. එහෙයින් මෙම ක්‍රියාකාරකමේ දී පෙළපොත යොදා ගනිමින් එහි ඇති පද දෙකක් සහිත විග්‍රහ වාක්‍යය භාවිත කරන්න. විග්‍රහ වාක්‍යයෙහි පද දෙක කොටස් දෙකකට ද සමාසපදය තවත් කොටසක් ද වශයෙන් කොටස් තුනකට වෙන්කොට වෙන වෙන ම තීරු වශයෙන් කපාගත් කාඩ්බෝර්ඩ්වල පැහැදිලි අකුරින් ලියන්න. සමාසපද 15ක් පමණ මේ සඳහා යොදාගන්න. සකස් කර ගන්නා ලද එම තීරු සමාසපද පහ බැගින් වන සේ භාජන තුනකට සමාන ව දමන්න. පන්තියෙහි සිසුන් කණ්ඩායම් තුනකට වෙන් කරන්න. එක් එක් කණ්ඩායමකට එක් එක් භාජනය බැගින් ලබා දෙන්න. කණ්ඩායමකට ලැබුණු තීරු ගළපමින් සමාසපද ගොඩනැගීමට උපදෙස් දෙන්න. කණ්ඩායම් තුනම තමන්ට හිමි වූ භාජනයෙහි ඇති තීරු ගළපමින් සමාසපද පහක් සකසා තිබිය යුතු වෙයි. කණ්ඩායම් විසින් සකසන ලද සමාසපද ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. ඒවායෙහි නිවැරදි බව සිසුන් සමග සාකච්ඡා කොට ඒවා අභ්‍යාසපොතෙහි සටහන් කරගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න. තීරු පහත අයුරින් සකස් කර ගන්න.

| | | |
|---|---|---|
| नीलश्च असौ | आकाशश्च | नीलाकाशः |
| वीरश्च स | पुरुषश्च | वीरपुरुषः |
| पवित्रं च तत् | स्थानं च | पवित्रस्थानम् |
| शारिपुत्रश्च स | स्थविरश्च | शारिपुत्रस्थविरः |
| मन्दं च तत् | शीतलं च | मन्दशीतलम् |
| प्रिया च सा | भार्या च | प्रियभार्या |
| शीतञ्च तत् | उष्णञ्च | शीतोष्णम् |
| धर्म एव | जीवितम् | धर्मजीवितम् |
| चन्द्र इव | मुखम् | चन्द्रमुखम् |
| पीतं च तत् | अम्बरम् | पीताम्बरम् |
| महांश्च सः | मुनिश्च | महामुनिः |
| नरः | सिंहः इव | नरसिंह |
| मेघः इव | श्यामः | मेघश्यामः |
| श्वेतानि च तानि | पद्मानि च | श्वेतपद्मानि |
| कृष्णा च सा | शुक्ला च | कृष्णशुक्ला |

# පාඩම 7 - ද්විගුසමාසය

**නිපුණතාව** : 5.0 සංස්කෘත භාෂාවේ සමාස නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 5.2 ද්විගු සමාසපද අවබෝධයෙන් යුතුව ප්‍රකාශ කරයි; ලියයි.

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල** :

- ද්විගු සමාසය හඳුන්වයි.
- ද්විගු සමාසපද නම් කරයි.
- ද්විගු සමාසප්‍රභේද නම් කරයි.
- ද්විගු සමාසප්‍රභේද නිදසුන් සහිත ව පහදයි.
- නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් ද්විගු සමාසපද උපුටා දක්වයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- **पञ्चतन्त्रम्** / **दशकुमारचरितम्** යන පොත් දෙක පන්තියට රැගෙන ගොස් එම ග්‍රන්ථ දෙක පෙන්වා එහි ග්‍රන්ථ නාමයන් සිසුන් ලවා කියවන්න.
- එම ග්‍රන්ථ නාමයන්හි විශේෂත්වය සිසුන්ගෙන් විමසා සංඛ්‍යාවක් විශේෂණපදය ලෙස යෙදී ඇති බව සිසුන්ගෙන් ප්‍රශ්න කිරීමෙන් මතු කොට ගන්න.
- එවැනි සංඛ්‍යාවක් විශේෂණපදය ලෙස යෙදී සෑදෙන සමාසප්‍රභේදය ද්විගුසමාසය නමින් හඳුන්වන බව පහත සඳහන් ශ්ලෝක පාඨය ඇසුරින් සාකච්ඡා කරන්න.

  **සංඛ්‍යාපූර්වෝ ද්විගුඃ**

  (සංඛ්‍යාවක් පූර්වපදය ලෙස යෙදී සිදුවන සංක්ෂිප්තතා ව ද්විගු නම් වේ.)

**පාඩම සංවර්ධනය :**

**පියවර** 1

- සිසුන් දන්නා මාධ්‍යභාෂාගත සංඛ්‍යාවාචී වචන කිහිපයක් සිසුන් ලවා හුණුපුවරුවෙහි ලියවන්න. (දශපාරමී, පන්සිල්, ත්‍රිවිද්‍යා,)
- සිසුන් විසින් ලියන ලද මාධ්‍යභාෂාගත වචනවලට අනුරූප සංස්කෘත වචනය ද සිසුන් සමග සාකච්ඡා කොට හුණුපුවරුවේ ලියන්න.
- මෙම වචන සෑකසී ඇත්තේ කිසියම් සංඛ්‍යාවාචී පදයක් විශේෂණය ලෙස එකතුවීමෙන් බවත් එවැනි පද ද්විගුසමාසයට අයත් වන බවත් පෙන්වා දෙන්න.

- අර්ථ වශයෙන් යම් සමූහයක් හෝ කොටසක් ගැන පැවසෙන සංඛ්‍යාවාචීපදයක් සහ උත්තරපදයක් අතර සිදුවන සංක්ෂිප්තතා ව ද්විගුසමාසය බව පැහැදිලි කරන්න.
- මෙය කර්මධාරයසමාසයෙන් වෙනස් වන්නේ විශේෂණපදය ලෙස සංඛ්‍යාවාචීපදයක් යෙදීම බව නිදසුන් කිහිපයක් මගින් පෙන්වා දෙන්න.
- **द्विगु** යන සමාස නාමය ම මෙයට උදාහරණයක් බව විස්තර කරන්න.
  (ද්වයොර්ගවොඃ සමාහාරඃ = ද්විගුඃ - ගවයන් දෙදෙනා)

## පියවර 2

- පෙළපොත, සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (කාරක - සමාස - තද්ධිත - තරඞ්ග) සහ සාරස්වතය යොදා ගනිමින්

- ද්විගුසමාසයෙහි ප්‍රභේද දෙක හඳුන්වන්න.
- ද්විගුසමාසයේ විග්‍රහ වාක්‍යය යෙදෙන අයුරු විස්තර කරන්න.
- විග්‍රහ වාක්‍යයෙහි හා සමාසපදයෙහි ලිඞ්ග, වචන යෙදෙන අයුරු නිදසුන් මගින් පෙන්වන්න.
- පහත ආකාරයට සමාසප්‍රභේදයේ සංඛ්‍යාවාචීපදය අගට ද යෙදෙන අවස්ථා ඇති බව ද දක්වන්න.

  **नयनद्वयम् , भुवनत्रयम् , द्वारत्रयम्**

- ඇමුණුම 1 සහ පෙළ පොතේ ඇති අභ්‍යාස කිරීමට සිසුන් යොමු කරන්න.
- ඇමුණුම 2 යොදා ගනිමින් නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨග්‍රන්ථවල ද්විගුසමාසපද උපුටා දක්වා ඒවායෙහි විග්‍රහ වාක්‍යය සකසා එහි අර්ථය ද ලිවීමට සිසුන්ට පවරන්න.

## ඇගයීම හා තක්සේරුකරණය :

- සංඛ්‍යාවක් විශේෂණපදය ලෙස යෙදී සෑදෙන සමාසය ද්විගුසමාසය ලෙස අර්ථකථනය කිරීම
- ද්විගුසමාසයට අයත් ප්‍රභේද නම් කිරීම හා ඒවාට නිදසුන් දැක්වීම
- ලිඞ්ග හා වචන නිවැරදි ව යොදාගනිමින් ද්විගුසමාසයක විග්‍රහ වාක්‍යය ගොඩනැගීම
- විග්‍රහ වාක්‍යයට අනුරූප ද්විගු සමාසපදය ගොඩනැගීම
- සමාසපදයේ අගට සංඛ්‍යාවාචීපද යෙදෙන අවස්ථාවලට නිදසුන් ඉදිරිපත් කිරීම
- නිර්දිෂ්ටග්‍රන්ථවලින් උපුටාගන්නා ලද ද්විගුසමාසපදවල විග්‍රහ වාක්‍යය, සමාසපදය, හා අර්ථය වගුගත කර දැක්වීම

## ගුණාත්මක යෙදවුම් :

- **पञ्चतन्त्रम् / दशकुमारचरितम्** යන ග්‍රන්ථ
- ඇමුණුම 1 සහ 2
- සංස්කෘත භාෂාව - පස්වන ශ්‍රේණිය, පෙළපොත
- සංස්කෘත පාඨමාලා 5 ග්‍රන්ථය
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (කාරක - සමාස - තද්ධිත - තරඞ්ග)
- සාරස්වතය

## ඇමුණුම 1

පහත සඳහන් සමාසපද විවිධ සමාස ප්‍රභේදවලට අයත් වේ. එම ප්‍රභේද අතුරින් ද්විගු සමාසපදයක් යනු සංඛ්‍යාවක් විශේෂණපදයන් ලෙස යෙදී සෑදෙන සමාසය යි. සංඛ්‍යාව සෑම විටෙකම පූර්වපදය ලෙස යෙදෙන නමුදු ඇතැම් තැනෙක පරපදය ලෙස ද යෙදී ඇති අවස්ථා දැකිය හැකි ය. පහත සමාසපද අතුරෙන් ද්විගු සමාසපද පමණක් තෝරන්න.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| सुभिक्षम् | अनुगु | वीरपुरुषः | अर्धरात्रम् | असुरः | पवित्रस्थानम् | त्रीलोकी |
| पञ्चगु | शारिपुत्रस्थविरः | गङ्गाद्वयम् | पुरुषत्रयम् | मन्दशीतलम् | दशपद्मानि | त्रिरात्रम् |
| प्रवातः | चतुस्कोटिम् | त्रिकोटिम् | शीतोष्णम् | पितरौ | द्विपात्रम् | दशबलः |
| द्विपत्रम् | द्विवचनम् | चन्द्रमुखम् | एकवचनम् | सशिष्यः | पीताम्बरम् | नवग्रहाणि |
| द्वारत्रयम् | विगतभयः | त्रिभुवनम् | पञ्चबलम् | नरसिंहः | पञ्चपात्रम् | सप्तर्षयः |
| बहुधनः | अष्टस्त्रियः | श्वेतपद्मानि | रत्नत्रयम् | पञ्चशीलम् | कृष्णशुक्ला | |

## ඇමුණුම 2

නියමිත නිර්දිෂ්ටග්‍රන්ථවලින් උපුටා ගන්නා ලද ද්විගුසමාසයට අයත් සමාසපද සියල්ල එකතුකොට පහත සඳහන් වගුවෙහි දක්වා ඇති ආකාරයට වගුගත කරන්න. (අවමය සමාසපද 25ක් විය යුතු ය. )

| අනු | සමාසපදය | විග්‍රහ වාක්‍යය | සමාසනාමය | අර්ථය |
|---|---|---|---|---|
| 01 | त्रिभुवनम् | त्रयाणां भुवनानां समाहारः | त्रिभुवनम् | තුන්ලොව |
| 02 | | | | |
| ..... | | | | |
| ..... | | | | |
| | | | | |
| 25 | | | | |
| | | | | |

# පාඩම 8 - බහුව්‍රීහි සමාසපද

**නිපුණතාව** : 5.0 සංස්කෘත භාෂාවේ සමාස නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 5.3 බහුව්‍රීහි සමාසපද අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කරයි; ලියයි.

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල** :

- බහුව්‍රීහිසමාසය හඳුන්වයි.
- බහුව්‍රීහි සමාසපද නම් කරයි.
- බහුව්‍රීහි සමාසප්‍රභේද නම් කරයි.
- බහුව්‍රීහි සමාසප්‍රභේද නිදසුන් සහිත ව පහදයි.
- නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් බහුව්‍රීහි සමාසපද උපුටා දක්වයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- දශබලඃ - **दशबलः** යනුවෙන් ද , ත්‍රිනේත්‍රඃ - **त्रिनेत्रः** යනුවෙන් ද හුණුපුවරුවේ පැහැදිලි අකුරින් ලියන්න.
- බුදුරජාණන් වහන්සේ හඳුන්වන වචනය දශබලඃ - **दशबलः** බව ද, ශිව දෙවියන් හඳුන්වන වචනය ත්‍රිනේත්‍රඃ - **त्रिनेत्रः** බව ද සිසුන් තුළින් ඉස්මතු කරවන්න.
- දශබලඃ - **दशबलः** සහ ත්‍රිනේත්‍රඃ - **त्रिनेत्रः** යනු බහුව්‍රීහි සමාසපද දෙකක් බව සාකච්ඡා කරන්න.
- පහත සඳහන් ශ්ලෝක පාඨය යොදා ගනිමින් බහුව්‍රීහි සමාසය හඳුන්වා දෙන්න.

  අන්‍යපදාර්ථප්‍රධානඃ බහුව්‍රීහි

  (සමාස වන පදයාගේ අන්‍යාර්ථ පදය ප්‍රධාන වනුයේ බහුව්‍රීහිය යි.)

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- සමාසප්‍රභේද හයෙන් තවත් එක් ප්‍රභේදයක් ලෙස බහුව්‍රීහිසමාසය හඳුන්වා දෙන්න.
- සමාස වන පදයන්හි අර්ථයට පරිබාහිර වෙනත් අර්ථයක් මතු කරන්නේ නම් එය බහුව්‍රීහි සමාසයක් බව පැහැදිලි කරන්න.
- බහු + ව්‍රීහි යන පදය ම මෙම සමාසයට නිදසුනක් බව පෙන්වා දෙන්න.

  (බහවො ව්‍රීහයො යස්‍ය සඃ, බහුව්‍රීහිඃ (ධනිකඃ)

පියවර 2

- පෙළපොත, සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (කාරක - සමාස - තද්ධිත - තරඞ්ග) සහ සාරස්වතය යොදා ගනිමින්
  - බහුව්‍රීහි සමාසපද තනාගැනීමේ දී විග්‍රහ වාක්‍යය වැදගත් වන බව පෙන්වා දෙන්න.
  - එහි දී यद् तद् एतद् इदम् अदस् යන සර්වනාම අන්‍යාර්ථය ප්‍රකාශ කිරීමේ දී භාවිත කරන බව පැහැදිලි කරන්න.
  - බහුව්‍රීහි සමාසපද සාදා ගැනීමේ දී ප්‍රථමා, ද්විතීයා, තෘතීයා, චතුර්ථී, පඤ්චමී, ෂෂ්ඨී හා සප්තමී යන විභක්ති අනුසාරයෙන් විග්‍රහ වාක්‍යය සකසාගන්නා බව විස්තර කරන්න.
  - විවිධ ලක්ෂණ අනුව බහුව්‍රීහි සමාසයෙහි ප්‍රභේද රාශියක් ඇතිබව සඳහන් කරන්න.
  - බහුව්‍රීහිසමාසයට අයත් ප්‍රභේද හඳුන්වා දෙන්න.
  - එම සමාස ප්‍රභේද උදාහරණ දක්වමින් විස්තර කරන්න. (මෙම පියවර 03 සඳහා සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී සමාස කාණ්ඩය 224 සිට 231 දක්වා පිටු යොදාගන්න.)
- ඇමුණුම 1 සහ පෙළපොතෙහි ඇති අභයාසවල සිසුන්ට නිරත කරවන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- බහුව්‍රීහි සමාසය උදාහරණ දක්වමින් හඳුන්වා දීම
- බහුව්‍රීහි සමාසපදයක් සකස්කරගන්නා ආකාරය පැහැදිලි කිරීම
- බහුව්‍රීහි සමාසයෙහි ප්‍රභේද නම් කොට ඒ එකිනෙකට උදාහරණ ඉදිරිපත් කිරීම
- බහුව්‍රීහි සමාසයට අයත් විග්‍රහ වාක්‍ය සහිත පද සමාස පද ලෙස ගොඩනැගීම
- නිර්දිෂ්ට ග්‍රන්ථවල සඳහන් බහුව්‍රීහි සමාසපද තෝරා ලිවීම, ප්‍රකාශ කිරීම සහ අර්ථ දැක්වීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 1
- සංස්කෘත භාෂාව - පස්වන ශ්‍රේණිය, පෙළපොත
- සංස්කෘත පාඨමාලා - 5 ග්‍රන්ථය
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (කාරක - සමාස - තද්ධිත - තරඞ්ග)
- සාරස්වතය

ඇමුණුම 1

01. පහත සඳහන් වන සමාසපද අතුරින් බහුව්‍රීහි සමාසපද උපුටා දක්වන්න.

| | | | |
|---|---|---|---|
| उपनगरम् | लम्बकर्णः | अनुरथम् | प्राप्तविद्यः |
| चोरभयम् | दशबलः | देवलोकः | त्रिनेत्रः |
| नरसिंहः | चक्रपाणिः | त्रिरात्रम् | पाणिपादम् |
| सशिष्यः | दण्डादण्डी | अनुरूपम् | हस्ताहस्ती |

| | | | |
|---|---|---|---|
| मुखपद्मम् | पुण्डरीकाक्षः | आसन्नविंशः | पितरौ |
| निर्गतजनः | बहुमूलः | सुभिक्षम् | मृगराजः |
| विगतभयः | वनवासः | आगतश्रमणः | शिवभक्तिः |
| कण्ठकालः | दशग्रामी | सलोमकः | महाभुजः |

02. පහත සඳහන් සමාසපද ඉදිරියෙන් සමාසනාමය ලියන්න.

| | | | | |
|---|---|---|---|---|
| ग्रामप्राप्तः | स्वर्गपतितः | वसिष्ठमुनिः | अग्निमारुतौ | अधिकृष्णम् |
| नरकपतितः | गृहापगतः | मन्दशीतलः | पितरौ | सचक्रम् |
| अश्वारूढः | ग्रामनिर्गतः | कृष्णशुक्ला | भ्रातरौ | उपनगरम् |
| मासदुःखम् | राजपुत्रः | भोज्योष्णम् | पुत्रौ | गृहगतः |
| देवैर्दत्तः | बुद्धपुत्रः | व्याघ्रश्वा | अश्वरथाः | गुरुदक्षिणा |
| नखैर्भिन्नः | नृपसेवकः | लतातन्वि | वापीकूपतटाकाः | चोरभयम् |
| वाक्कलहः | देवलोकः | मेघश्यामः | रामश्च लक्ष्मणौ | दुर्जनः |
| घृतमिश्रः | वनवासः | नरसिंहः | राजसभा | दशपद्मानि |
| राजहतः | आतपशुष्कः | तनुलता | चक्रपाणिः | त्रिभुवनम् |
| चीवरवस्त्रम् | भूतदया | मुखमद्मम् | आगतश्रमणाः | मुखकमलम् |
| युपदारु | क्रीडाकुशलः | धर्मसंज्ञा | कण्ठकालः | अनश्वः |
| भूतबलिः | त्रिनेत्रः | देवताबुद्धिः | लम्बकर्णः | अनागतः |
| अनुज्येष्ठम् | धर्मबुद्धिः | गुणबुद्धिः | पीताम्बरः | अब्राह्मणः |
| सुभिक्षम् | बहुधनः | धर्मवृक्षः | शारिपुत्रस्थविरः | असुरः |
| प्रतिवृक्षम् | करकङ्कणः | विद्याधनम् | ब्राह्मणपण्डितः | प्रवातः |
| निर्मक्षिकम् | कृष्णसर्पः | मृगराजा | कुपुरुषः | पञ्चपात्रम् |
| प्रतिवाचम् | महामुनिः | भीमार्जुनौ | कालवनम् | सप्तर्षयः |
| यथाशक्ति | नीलोत्पलम् | अधिस्त्रि | पञ्चगु | अष्टौस्त्रियः |
| आ ग्रामम् | रम्यलता | | | |

# පාඩම 9 - තද්ධිත

**නිපුණතාව** : 6.0 සංස්කෘත භාෂාවේ තද්ධිත නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 6.1 තද්ධිතපද අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කරයි; ලියයි.

**කාලච්ඡේද** : 12 යි.

**ඉගෙනුම් පල** :

- අතිශයාර්ථතද්ධිතය හඳුන්වයි.
- අතිශයාර්ථ තද්ධිතපද නම් කරයි.
- නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් අතිශයාර්ථ තද්ධිත පද උපුටා දක්වයි.
- අනෙකාර්ථ තද්ධිතය හඳුන්වයි.
- අනෙකාර්ථ තද්ධිතපද නම් කරයි.
- නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් අනෙකාර්ථ තද්ධිතපද උපුටා දක්වයි.
- සංඛ්‍යාතද්ධිතය හඳුන්වයි.
- සංඛ්‍යා තද්ධිතපද නම් කරයි.
- නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් සංඛ්‍යා තද්ධිතපද උපුටා දක්වයි.
- අව්‍යයතද්ධිතය හඳුන්වයි.
- අව්‍යය තද්ධිතපද නම් කරයි.
- නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් අව්‍යය තද්ධිතපද උපුටා දක්වයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- ඇමුණුම 1හි යොදාගනිමින් තද්ධිත පිළිබඳ හැඳින්වීමක් ඉදිරිපත් කරන්න.
- සංස්කෘත භාෂාවේ අලංකාරයට හා සුබෝච්චාරණයට තද්ධිතවලින් සිදුවන මෙහෙය සාකච්ඡා කරන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර** 1

- ඇමුණුම 2 සිසුන්ට සපයා අතිශයාර්ථතද්ධිතය, අනේකාර්ථතද්ධිතය, සංඛ්‍යාතද්ධිතය, අව්‍යය තද්ධිතය යන තද්ධිත හතර පිළිබඳ හැඳින්වීමක් කරන්න.

- අදාළ තද්ධිතවර්ග 4 සුවිශේෂ ව හඳුනාගත හැකි ආකාරය ඒවායේ වෙනස්කම් සමග පහදා දෙන්න.
- අදාළ තද්ධිත පාඩම්වල දී පෙළපොත, සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (කාරක - සමාස - තද්ධිත - තරඞ්ග) සහ සාරස්වතය යොදා ගන්න.
- එම තද්ධිත වර්ග 04 සඳහා සුදුසු පරිදි කාලච්ඡේද 3කට ආසන්න කාලයක් වෙන් කර ගන්න.
- එක් එක් තද්ධිතවර්ග පිළිබඳ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා පහත අනුක්‍රමය අනුගමනය කරන්න.
    - ඇමුණුම 2 භාවිත කරමින් තද්ධිතවර්ගයට අදාළ හැඳින්වීම් පාඨය සිසුන් සමග සාමූහික ව හඬ නගා කියවන්න.
    - ඇමුණුමෙහි අඩංගු තද්ධිතපද ලැයිස්තුව සිසුන් සමග හඬ නගා කියවන්න.
    - එහි විග්‍රහ වාක්‍යය සහ ප්‍රත්‍යය කෙරෙහි අවධානය යොමු කරමින් එම තද්ධිතපද ගොඩනැගී ඇති ආකාරය '*හැකි නම් කියන්න*' යනුවෙන් උදෙ‍්‍යාගිමත් ව ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
    - එම තද්ධිත ගොඩනැගී ඇති ආකාරය සාකච්ඡාවක් මගින් තහවුරු කරන්න.
    - පෙළපොතේ අදාළ පාඩම කෙරෙහි අවධානය යොමු කරමින් සිසුන් අභ්‍යාසයෙහි නිරත කරවන්න.
    - තමා පරිශීලනය කරන නිර්දිෂ්ටග්‍රන්ථවලින් අදාළ තද්ධිතය සඳහා නිදසුන් කිහිපයක් උපුටා දැක්වීමට අවස්ථාව දෙන්න.
- පන්තියෙහි සිසුන්ගේ ප්‍රමාණය සැලකිල්ලට ගෙන ඇමුණුම 7 පරිදි කාඞ්බෝඞ් තීරු යොදාගෙන තද්ධිත සම්බන්ධයෙන් ඉගෙනුම් ආධාරකයක් සැකසීමට සිසුන්ට පසුවැඩ ලෙස පවරන්න.

**මූලික වදන් සංකල්ප :**

- තද්ධිත - ප්‍රත්‍යාර්ථ නාම ගණයට අයත් වේ.
- අතිශයාර්ථතද්ධිත
- අනේකාර්ථතද්ධිත
- සංඛ්‍යාතද්ධිත
- අව්‍යයතද්ධිත

**ඇගයීම් හා තක්සේරුකරණය :**

- අතිශයාර්ථ, අනේකාර්ථ, සංඛ්‍යා සහ අව්‍යය තද්ධිතවර්ග නිදර්ශන සහිත ව විස්තර කිරීම
- නිර්දිෂ්ටග්‍රන්ථවල ඇති තද්ධිතපද වර්ග උපුටා දැක්වීම
- තද්ධිතවර්ගවලට අයත් උදාහරණ වාචෝද්ගත ව ප්‍රකාශ කිරී

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 1,2 සහ 3
- සංස්කෘත භාෂාව - පස්වන ශ්‍රේණිය, පෙළපොත
- සංස්කෘත පාඨමාලා - 5 ග්‍රන්ථය
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (කාරක - සමාස - තද්ධිත - තරඞ්ග)
- සාරස්වතය

**ඇමුණුම් 1**

තද්ධිත යනු කවරේදැයි සිසුන් සමග සාකච්ඡා කරන්න. නාමපදවල අගට අර්ථ ප්‍රත්‍යය හෙවත් විශේෂ ප්‍රත්‍යය එකතු කිරීමෙන් නිර්මාණය වන්නේ තද්ධිතනාම යි. එම නිසා තද්ධිත ප්‍රත්‍යාර්ථ නාම ගණයට අයත් වේ.

| | | |
|---|---|---|
| උදා :- | **महतः भावः** | (විග්‍රහ වාක්‍යය) |
| | **महतः डिमन्** | (ප්‍රත්‍යය යෙදීමෙනි) |
| | **महत् + इमन्** | (විභක්ති හා ඉත් ලෝපයෙනි) |
| | **मह् + इमन्** | (ටිසංඥ, ලෝපයෙහි) |
| | **महिमन्** | (ගැළපීමෙන් වූ තද්ධිතනාමය) |

ඇමුණුම් 2

1. <u>අතිශයාර්ථ තද්ධිත නාම</u>

ප්‍රථමා විභක්ත්‍යන්ත නාම කෙරෙන් අතිශයාර්ථ ප්‍රකාශක **तर , तम , ईयस् , इष्ठ** යන ප්‍රත්‍ය යෙදීමෙන් නිර්මාණය වන්නේ අතිශයාර්ථතද්ධිත යි.

නිද :- **अतिशयेन लघुः - लघुतरः**

**अतिशयेन लघुः - लघुतमः**

2. <u>අනේකාර්ථ තද්ධිත නාම</u>

නොයෙක් විභක්ති අන්තකොට ඇති නොයෙක් නාම කෙරෙන් අනේකාර්ථ ප්‍රකාශක ප්‍රත්‍යය යෙදීමෙන් නිර්මාණය වන්නේ අනේකාර්ථතද්ධිත නම් වේ.

නිද :- **विदेहेषु जातः - वैदेहः**

**वेदेषु भवः - वैदिकः**

3. සඞ්ඛ්‍යාතද්ධිත නාම

ෂෂ්ඨී විභක්ත්‍යන්ත සඞ්ඛ්‍යාශබ්ද කෙරෙන් පූර්ණාර්ථ ප්‍රකාශක ප්‍රත්‍යය යෙදීමෙන් නිර්මාණය වන්නේ සංඛ්‍යාතද්ධිත යි.

නිද :- **द्वयोः पूरणः - द्वितीयः**

**दशानां पूरणः - दशमः**

4. අව්‍යය තද්ධිතනාම

විභක්තිවල වරනොනැගෙන නමුත් එක විභක්තියක අර්ථයක් ගෙනදෙන අව්‍යය ස්වරූපයෙන් සිටින තද්ධිත අව්‍යයතද්ධිත යි.

නිද :- **एकस्मिन् काले - एकदा**

**अस्मिन् - अत्र**

## අතිශයාර්ථ තද්ධිතය

| අනුඅංකය | තද්ධිතප්‍රත්‍යය | විග්‍රහවාක්‍යය | තද්ධිතපදය |
|---|---|---|---|
| ०१ | तर | अतिशयेन लघुः | लघुतरः |
| ०२ | तम | अतिशयेन लघुः | लघुतमः |
| ०३ | ईयस् | अतिशयेन लघुः | लघीष्ठः |
| ०४ | इष्ठ | अतिशयेन लघुः | लघियः |
| ०५ | तर | अतिशयेन पादकः | पाचकतरः |
| ०६ | तम | अतिशयेन पाचकः | पाचकतमः |
| ०७ | ईयस् | अतिशयेन पटुः | पटीयान् |
| ०८ | इष्ठ | अतिशयेन पटुः | पटिष्ठः |

අනේකාර්ථතද්ධිතය

| අනුඅංකය | තද්ධිතප්‍රත්‍යය | විග්‍රහවාක්‍යය | තද්ධිතපදය |
|---|---|---|---|
| ०१ | अण् | मगधेषु वसति | मागधः |
| | मगधेषु | जातः | |
| | मगधेभ्यः | आगतः | |
| | मगधानाम् | ईश्वरः | |
| ०२ | कण् | कणाटेषु वसति | कार्णाटकः |
| | कणाटेषु | जातः | |
| | कणाटेभ्यः | आगतः | |
| | कर्णाटानाम् | ईश्वरः | |
| ०३ | इकण् | नगरे वसति | नागरिकः |
| | नगरे | जातः | |
| | नगरे | नियुक्तः | |
| | नगरात् | आगतः | |

සංඛ්‍යාතද්ධිතය

| අනුඅංකය | තද්ධිතප්‍රත්‍යය | විග්‍රහවාක්‍යය | තද්ධිතපදය |
|---|---|---|---|
| ०१ | तीय | द्वयोः पूरणः | द्वितीयः |
| | | त्रयाणां पूरणः | तृतीयः |
| ०२ | थ | चतुर्णां पूरणः | चतुर्थः |
| | | षण्णां पूरणः | षष्ठः |
| | | कतीनां पूरणः | कतिथः |


| අනුඅංකය | තද්ධිතප්‍රත්‍යය | විග්‍රහවාක්‍යය | තද්ධිතපදය |
|---|---|---|---|
| ०३ | म | नवानां पूरणः | नवमः |
| | | दशानां पूरणः | दशमः |
| | | एकादशानां पूरणः | एकादशमः |
| ०४ | तम | विंशतेः पूरणः | विंशतितमः |
| | | त्रिंशतः पूरणः | त्रिंशत्तमः |
| | | शतस्य पूरणः | शततमः |
| ०५ | ड | एकादशानां पूरणः | एकादशः |
| | | विंशतः पूरणः | विंशः |
| | | त्रिंशतः पूरणः | त्रिंशः |
| ०६ | डय | द्वौ अवयवौ यस्य तत् | द्वयम् |
| | | त्रयो वयवाः यस्य तत् | त्रयम् |
| ०७ | तय | द्वौ अवयवौ यस्य तत् | द्वितयम् |
| | | त्रयो वयवाः यस्य तत् | त्रितयम् |

- **අව්‍යය තද්ධිතය**

| අනුඅංකය | තද්ධිතප්‍රත්‍යාර්ථ | ප්‍රත්‍යය | විග්‍රහවාක්‍යය | තද්ධිතපදය |
|---|---|---|---|---|
| ०१ | පඤ්චම්‍යර්ථයෙහි | तः | ग्रामात् | ग्रामतः |
| | | | सर्वस्मात् | सर्वतः |
| ०२ | සප්තම්‍යර්ථයෙහි | त्र | सर्वस्मिन् | सर्वत्र |
| | | | कस्मिन् | कुत्र |
| ०३ | ප්‍රකාරාර්ථයෙහි | थम् | अनेन प्रकारेण | इत्थम् |
| | | | केन प्रकारेण | कथम् |
| ०४ | කාලාර්ථයෙහි | दा | एकस्मिन् काले | एकदा |
| | | | कस्मिन् काले | कदा |

| අනුඅංකය | තද්ධිතප්‍රත්‍යාර්ථ | ප්‍රත්‍යය | විග්‍රහවාක්‍යය | තද්ධිතපදය |
|---|---|---|---|---|
| ०५ | සදෘශාර්ථයෙහි | वत् | चन्द्रेण तुल्यः | चन्द्रवत् |
| | | | मुखेन तुल्यः | मुखवत् |
| ०६ | වාරාර්ථයෙහි | शः | शः बहुवारान् | बहुशः |
| | | | शतवारान् | शतशः |
| ०७ | දූරාර්ථයෙහි | आ | दक्षिणस्यां दिशि दूरे | दक्षिणा |
| | | | उत्तरस्यां दिशि दूरे | उत्तरा |
| ०८ | අතිශයාර්ථයෙහි | तराम् | अतिशयेन कः | किंतराम् |
| | | | अतिशयेन पचति | पचतितराम् |
| ०९ | අයත් බැව්හි | | सात्‌राज्ञः अधीनम् | राजसात् |
| | | | अग्नेः अधीनम् | अग्निसात् |
| १० | ස්වාථීයෙහි | | सात् सर्वं भस्म | भस्मसात् |

ඇමුණුම 3



# පාඩම 10 - කෘදන්ත

**නිපුණතාව** : 7.0 සංස්කෘත භාෂාවේ කෘදන්ත නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 7.1 අතීත, වර්තමාන, අනාගත කෘදන්ත නිවැරදි ව භාවිත කරයි.

**කාලච්ඡේද** : 15 යි.

**ඉගෙනුම් පල** :

**7.1**

- අතීතකෘදන්ත හඳුන්වයි.
- අතීතකෘදන්තවල ප්‍රත්‍යය හය වාචෝද්ගත ව ප්‍රකාශ කරයි.
- ප්‍රත්‍යය හයට අදාළ අතීත කෘදන්තපදවලට නිදසුන් ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් අතීත කෘදන්තපද උපුටා දක්වයි.

**7.2**

- වර්තමානකෘදන්ත හඳුන්වයි.
- වර්තමානකෘදන්තවල ප්‍රත්‍යය දෙක වාචෝද්ගත ව ප්‍රකාශ කරයි.
- ප්‍රත්‍ය දෙකට අදාළ වර්තමාන කෘදන්තපදවලට නිදසුන් ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් වර්තමාන කෘදන්තපද උපුටා දක්වයි.

**7.3**

- අනාගතකෘදන්ත හඳුන්වයි.
- අනාගතකෘදන්තවල ප්‍රත්‍යය තුනට වාචෝද්ගත ව ප්‍රකාශ කරයි.
- ප්‍රත්‍ය තුනට අදාළ අනාගතකෘදන්තපදවලට නිදසුන් ඉදිරිපත් කරයි.
- නිර්දිෂ්ටග්‍රන්ථවල පාඨවලින් අනාගතකෘදන්තපද උපුටා දක්වයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- කෘදන්තපද ඇතුළත් පහත ශ්ලෝකය සිසුන්ට ඉදිරිපත් කරන්න.

  गच्छन् पिपीलिको याति योजनानां शतान्यपि ।

  अगच्छन् वैनतेयोऽपि पदमेकं न गच्छति ॥

- එහි ඉරි ඇඳි පද කෙරෙහි සිසු අවධානය යොමු කරමින් එම පද පිළිබඳ පෙර දැනුම සිහි ගන්වන්න.
- එවැනි වෙනත් පද කිහිපයක් ඉදිරිපත් කරන්න.
- මේවා කෘදන්ත යටතට ගැනෙන බව සාකච්ඡා කරන්න.

- ධාතු අගට කෘත් ආදි ප්‍රත්‍යය සම්බන්ධ වීමෙන් ගොඩනැගෙන පද කෘදන්ත යනුවෙන් හඳුන්වන බව සිසුන්ට පහදා දෙන්න.
- ඇමුණුම් අංක 1 යොදා ගනිමින් කාලය, පදය සහ ලිඞ්ගය වශයෙන් කෘදන්ත වර්ග කළ හැකි බව පෙන්වා දෙන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- අදාළ කෘදන්ත පාඩම්වල දී පෙළපොත, සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (ආඛ්‍යාත - කෘදන්ත - තරඞ්ග), සහ සාරස්වතය යොදා ගන්න.
- අතීත, වර්තමාන සහ අනාගත කෘදන්ත සඳහා සුදුසු පරිදි කාලච්ඡේද වෙන් කර ගන්න.
- එක් එක් කෘදන්ත වර්ගය පිළිබඳ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා පහත අනුක්‍රමය අනුගමනය කරන්න.
- කෘදන්තවර්ගයට අදාළ ප්‍රත්‍යය සිසුන් ලවා පෙළ ගස්වන්න.
- එම ප්‍රත්‍යය යොදා කෘදන්තපද ගොඩනංවන්න.
- සාදාගත් කෘදන්තපද ලිඞ්ගත්‍රයෙහි වරනගන්න.
- ඒ ඒ කෘදන්තපද යොදා වාක්‍යනිර්මාණය කර වන්න.
- ඇමුණුම 2 සහ පෙළ පොතෙහි අභ්‍යාස කිරීමට සිසුන් යොමු කරන්න.

**මූලික වදන් සංකල්ප :**

- කෘදන්ත
- ප්‍රත්‍යය

**ඇගයීම හා තක්සේරුකරණය :**

- අතීත, වර්තමාන හා අනාගත කෘදන්ත අර්ථ දැක්වීම
- ඒ ඒ කෘදන්ත වර්ගවල ප්‍රත්‍යයන් පෙළ ගැස්වීම
- කෘදන්තපද ලිඞ්ගත්‍රයෙහි වරනැගීම
- කෘදන්ත යොදා වාක්‍ය ගොඩනැගීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 1 සහ 2
- සංස්කෘත භාෂාව - පස්වන ශ්‍රේණිය, පෙළපොත
- සංස්කෘත පාඨමාලා - 5 ග්‍රන්ථය
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (ආඛ්‍යාත - කෘදන්ත - තරඞ්ග)
- සාරස්වතය

ඇමුණුම 1

<u>गच्छन्</u> पिपीलिको याति योजनानां शतान्यपि ।
<u>अगच्छन्</u> वैनतेयोऽपि पदमेकं न गच्छति ॥

ඇමුණුම 2

1. වර්තමානකාලික " **गच्छ** ශබ්දයට **अत्** " ප්‍රත්‍යය යොදා ලිඞ්ග තුනෙහි ප්‍රථමාවිභක්තියෙහි වරනගමින් පහත වගුව පුරවන්න.

ප්‍රථමාවිභක්තියෙහි **गच्छ** + **अत्** ප්‍රත්‍යය ලිඞ්ග තුනෙහි වරනැගීම

| ලිඞගය | ඒකවචන | ද්විවචන | බහුවචන |
|---|---|---|---|
| පුරුෂ | गच्छन् | गच्छन्तौ | गच्छन्तः |
| ස්ත්‍රී | गच्छन्ती | गच्छन्त्यौ | गच्छन्त्यः |
| නපුංසක | गच्छत् | गच्छन्ती | गच्छन्ती |

2. වර්තමානකාලික **अत्** ප්‍රත්‍යයට අදාළ **वद्** ශබ්දය යොදා ලිඞ්ග තුනෙහි ප්‍රථමාවිභක්තියෙහි වරනගන්න.

ප්‍රථමාවිභක්තියෙහි **वद्** + **अत्** ප්‍රත්‍යය ලිඞ්ග තිනෙහි වරනැගීම

| ලිඞ්ගය | ඒකවචන | ද්විවචන | බහුවචන |
|---|---|---|---|
| පුරුෂ | | | |
| ස්ත්‍රී | | | |
| නපුංසක | | | |

2. හිස්තැන් පුරවමින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| धातु - लट् | तुमन्त [तुम्] | पूर्वक्रिया [त्वा/य] | वर्तमानकृदन्त [अत्/मान] | अतीतकृदन्त [त] |
|---|---|---|---|---|
| पत् - पतति - වැටෙයි | पतितुम् වැටීමට | पतित्वा වැටී | पतत् වැටෙන, වැටෙමින්, වැටෙන්නා වූ | पतित වැටුණු |
| गम् - गच्छति (යයි) | गन्तुम् | गत्वा | गच्छत् | गत |
| नम् - नमति (වඳියි) | नर्तुम् | | नमत् | |
| जि - जयति (දිනයි) | | जित्वा | जयत् | जित |
| चल् - चलति (සෙලවෙයි) | चलितुम् | | चलत् | |
| चर् - चरति (හැසිරෙයි) | | चरित्वा | | चरित |
| धाव् - धावति (දුවයි) | धावितुम् | | धावत् | |
| लिख् - लिखति (ලියයි) | | आलिख्य | | लिखित |
| पठ् - पठति (පාඩම්කරය) | पठितुम् | | पठत् | |
| खाद् - खादति (කයි) | | खादित्वा | | खादित |
| हस् - हसति (සිනාසසෙයි) | हसितुम् | | हसत् | |
| व्रज् - व्रजति (යයි) | | व्रजित्वा | | व्रजित |
| स्था - तिष्ठति (සිටියි) | स्थातुम् | | तिष्ठत् | |
| गै - गायति (ගයයි) | | गीत्वा | | गीत |
| भू - भवति (වෙයි) | भवितुम् | | भवत् | |
| हृ - हरति (ගෙන යයි) | | हृत्वा | | हृत |
| वृत् - वर्तते (පවතියි) | वर्तितुम् | | वर्तमान | |
| डि - डयते (ඉගිලෙයි) | | डयित्वा | | डयित |
| शिक्ष् - शिक्षते (ඉගෙනගනියි) | शिक्षितुम् | | शिक्षमान | |
| सेव् - सेवते (ඇසුරු කරයි) | | सेवित्वा | | सेवित |

# පාඩම 11 - වාක්‍යනිර්මාණය

**නිපුණතාව** : 8.0 සංස්කෘත භාෂාව නිවැරදි ව හසුරුවමින් අර්ථාන්විත ව සහ ව්‍යාකරණානුකූල ව වාක්‍යනිර්මාණය කරයි.

**නිපුණතා මට්ටම** : 8.1 ව්‍යාකරණානුකූල පූර්ණ වාක්‍ය යොදා ගනිමින් අදහස් සන්නිවේදනය කරයි.

**කාලච්ඡේද** : 10 යි.

**ඉගෙනුම් පල** :

- දෙනු ලබන තේමාවකට අදාළ ව වාක්‍ය දහයකට නොඅඩු කථාවක් පවත්වයි.
- සරල වාක්‍ය රචනා ලියයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**ප්‍රවේශය :**

- සංස්කෘත භාෂාවෙන් අභිමත සරල සුදුසු කෙටි දේශනයක් සිසුන් ඉදිරියේ පවත්වන්න.
- එවැනි කථාවක් සිසුන්ට ද පැවැත්වීමට අවස්ථාවක් දෙන්න.
- අවශ්‍ය සම්පත් සපයා ගත හැකි නම් සංස්කෘත කථාවක හඬපටයක් ඇසීමට සලස්වන්න.
- මූලභාෂාවක් වශයෙන් සංස්කෘත භාෂාව භාවිත කිරීම විද්වද්භාවය ප්‍රදර්ශනය කිරීමක් බව සාකච්ඡාවක් මගින් සිසුන්ට පැහැදිලි කරන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- වාක්‍යනිර්මාණයේ දී උක්තාඛ්‍යාත සම්බන්ධය වැදගත් බව පෙන්වා දෙන්න.
- විභක්ත්‍යර්ථ හා විභක්තිප්‍රයෝග පිළිබඳ දැනුම වාක්‍යනිර්මාණයට උපකාර වන බව පහදා දෙන්න.
- විභක්ත්‍යර්ථ සහිත වාක්‍යනිර්මාණයට සිසුන් යොමු කරවන්න.
- පරිවර්තන ශක්‍යතාව ද උපයෝගිකරගෙන පූර්ණ වාක්‍ය සංස්කෘත භාෂාවෙන් මාධ්‍ය භාෂාවට ද මාධ්‍යභාෂාවෙන් සංස්කෘත භාෂාවට ද හරවා දේවනාගරී අකුරෙන් හුණුපුවරුවේ ලිවීමට සිසුන් යොමු කරන්න.
- පෙළපොතේ 13, 14 පාඩම් යොදා ගනිමින් ලිඞ්ගත්‍රය, වචනත්‍රය, පුරුෂත්‍රය, පූර්වක්‍රියා, තුමන්තක්‍රියා, විභක්තිප්‍රයෝග, අව්‍යයපද ආදිය සහිත පූර්ණ වාක්‍යනිර්මාණය කිරීමේ අභ්‍යාස සිසුන් ලවා කරවන්න.

**පියවර 2**

- පෙළපොතෙහි 15.5 ක්‍රියාකාරකමේ අඩංගු සංස්කෘත භාෂාවෙන් නිර්මාණය කර ඇති ආරාධනාපත්‍ර සිසුන්ට නිරීක්ෂණය කරවන්න.

- එය අනුසාරයෙන් විහාරස්ථානයේ අභිනව විහාරමන්දිරය විවෘත කිරීමේ උත්සවය වෙනුවෙන් ආරාධනාපත්‍රයක් සංස්කෘත භාෂාවෙන් නිර්මාණය කිරීමට සිසුන් යොමු කරන්න.

## පියවර 3

- පෙළපොතේ 15 පාඩමේ **කථා ප්‍රවේශයට උදාහරණ කිහිපයක්** කොටස යොදා ගනිමින් සාමාන්‍ය සරල මාතෘකා ඔස්සේ කුඩා කථාවක් පන්තිය ඉදිරියේ පවත්වන්නට සිසුන් මෙහෙයවන්න.
- සරල වාක්‍ය කිහිපයක් එකතු කළවිට ඡේදයක් සකස් වන බව පෙන්වා දෙන්න.
- එක ම තේමාවක් ඔස්සේ එම ඡේදය ලියන්නේ නම් එය රචනාවක් ලෙස පිළිගැනෙන බව දක්වන්න.
- පෙළපොතේ 16 පාඩමට සිසු අවධානය යොමු කරවන්න.
- සරල තේමා යටතේ වාක්‍ය 10කට නො අඩු රචනා ලිවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- යම් සිදුවීම් හා පුද්ගලයන් පිළිබඳ තොරතුරු ලිවීම ද වාක්‍යරචනාවක අවස්ථාවක් බව පැහැදිලි කරන්න.
- සුදුසු වර්ණ පින්තූරයක් සපයා ගනිමින් A4 කඩදාසියක තනි පැත්තේ එම පින්තූර පිළිබඳ වාක්‍ය 10කට නොඅඩු රචනයක් ලිවීමට සිසුන් යොමු කරන්න.
- එම සියලු ම නිර්මාණ යොදා සුදුසු නමක් යටතේ නිර්මාණ එකතුවක් එළි දැක්වීමට පියවර ගන්න.

## මූලිකවදන් සංකල්පය :

- විභක්තිප්‍රයෝග
- ආරාධනාපත්‍ර
- කථා පැවැත්වීම
- වාක්‍යරචනා

## ඇගයීම් හා තක්සේරුකරණය :

- ආරාධනාපත්‍රයක් නිර්මාණය කිරීම
- වාක්‍ය දහයකට නොඅඩු සංස්කෘත කථාවක් පැවැත්වීම
- දෙනු ලබන තේමාවන් ඔස්සේ සරල වාක්‍ය රචනා ලිවීම
- පන්තියේ සාමූහික රචනා එකතුවට නිර්මාණයක් ලබා දීම

## ගුණාත්මක යෙදවුම් :

- සංස්කෘත භාෂාව - පස්වන ශ්‍රේණිය, පෙළපොත
- සංස්කෘත භාෂාවෙන් නිර්මිත ආරාධනාපත්‍රය
- හඬපටයක් හා ප්‍රචාරක මාධ්‍යයක් (අවශ්‍ය නම්)

# පාඩම 12 - නිර්දිෂ්ටග්‍රන්ථ - සාරස්වතය

**නිපුණතාව** : 9.0 නිර්දිෂ්ටග්‍රන්ථ අර්ථාන්විත ව පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම** : 9.1 සාරස්වතය අර්ථාන්විත ව පරිශීලනය කරයි.

**කාලච්ඡේද** : 15 යි.

**ඉගෙනුම් පල** :

- සංස්කෘත ව්‍යාකරණය හැදෑරීම සඳහා ඇති වැදගත් මූලාශ්‍රයක් ලෙස සාරස්වතය නම් කරයි.
- සාරස්වතයෙහි අඩංගු සංඥා සහ සන්ධි යන ව්‍යාකරණාංග දෙකට අදාළ සූත්‍ර වාචෝද්ගත කරයි.
- එම සූත්‍රවල අර්ථ මතකයෙන් කියයි; ලියයි.
- එම සූත්‍ර භාෂා භාවිතයේ දී ප්‍රයෝජනයට ගනියි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**(ගුරුභවතාට)**

(මෙහි දී අපේක්ෂා කරන්නේ ශිෂ්‍යයාට කිසියම් ග්‍රන්ථයක් අර්ථාන්විත ව පරිශීලනය කිරීමේ අත්දැකීම ලබා දීම යි. ඒ සඳහා තෝරාගෙන ඇත්තේ කාලච්ඡේද 15 කට අදාළ කරගත හැකි සාරස්වතයේ ඉහත විෂය කොටස් පමණි. මෙහි දී ව්‍යාකරණ ඉගැන්වීම අපේක්ෂා නො කෙරේ. එහෙත් ඒ ඒ පාඩම්වල දී ගුරුවරයා සාරස්වතය යොදා ගනිමින් ශිෂ්‍යයාගේ ව්‍යාකරණ කුසලතාව වැඩිදියුණු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.)

**ප්‍රවේශය :**

- **प्रणम्य परमात्मानम्** ශ්ලෝකය හුණුපුවරුවේ දක්වා සජ්ඣායනා කරන්න.
- සිසුන් සමග දෙවනු ව සාමූහික ව කියවන්න.
- අර්ථ විවරණ සපයමින් සාරස්වතය පිළිබඳ පෙර මතකය අවදි කරමින් සාකච්ඡාවක නිරත වන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- සිංහල, පාලි වැනි භාෂාවල ව්‍යාකරණ පිළිබඳ කරුණු ඇතුළත් ග්‍රන්ථ වශයෙන් සිදත් සඟරාව හා බාලාවතාරය ගැන හැඳින්වීමක් කරන්න.
- සාරස්වතය සංස්කෘත ව්‍යාකරණය පිළිබඳ වටිනා ම මූලාශ්‍රයක් වශයෙන් සැලකෙන බව පැහැදිලි කරන්න.

- එය රචනාකොට ඇත්තේ අනුභූති ස්වරූපාචාර්යයන් විසින් ය යන්න තහවුරු කිරීමට කරුණු ඉදිරිපත් කරන්න.
- **प्रणम्य परमात्मानम्** । යන ශ්ලෝකය හා **इन्द्रादयोऽपि यस्यान्तं** ।'' යන ශ්ලොකවල අරුත් මැනවින් පැහැදිලි කරන්න.
- එම ශ්ලෝක මනාව උච්චාරණය කරමින් හඬ නගා කියවීමට සිසුන් යොමු කරන්න.
- එම ශ්ලෝක වනපොත් කිරීමට උපදෙස් දෙන්න.

**පියවර 2**

- සාරස්වතයෙහි ආරම්භයේ සිට එකිනෙක සූත්‍ර උච්චාරණය කෙරෙන ආකාරය මැනවින් පැහැදිලි කරන්න.
- එම සූත්‍රවල අර්ථ විවරණය කරන්න.
- සාරස්වත සූත්‍ර අනුසාරයෙන් අක්ෂර හඳුන්වා දෙන්න.

  උදාහරණ, ''**ए ऐ ओ औ सन्ध्यक्षराणी** ।''

  ඒ, ඓ, ඕ, ඖ යන අක්ෂර සන්ධ්‍යක්ෂර ය.
- ස්වර හා ව්‍යඤ්ජන අක්ෂර හා අක්ෂර උත්පත්තිස්ථාන මෙන් ම සංඥා කාණ්ඩයට අදාළ සියලු බෙදීම් සාරස්වතසූත්‍ර අනුසාරයෙන් පැහැදිලි කරන්න.

**පියවර 3**

- සන්ධි යනු කුමක්දැයි සූත්‍රානුසාරයෙන් පැහැදිලි කරදෙන්න.
- සන්ධිවර්ග 5 සහ සන්ධි විධීන් සූත්‍රානුසාරයෙන් පැහැදිලි කරන්න.
- ඒවා වනපොත් කිරීමට උපදෙස් දෙන්න.
- එම සූත්‍රයන්ට අදාළ ව පදසාධනයන් පැහැදිලි කරන්න.
- සූත්‍රානුසාරයෙන් විසන්ධිපද සන්ධි වන ආකාරය පෙන්වන්න.
- ඇමුණුම 1 අභ්‍යාසයෙහි සිසුන් යොදවන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සාරස්වතසූත්‍ර නිවැරදි ව මැනවින් උච්චාරණය කරමින් සජ්ඣායනය කිරීම
- සාරස්වත සංඥා හා සන්ධිවලට අදාළ සූත්‍රවල අර්ථ විවරණය කිරීම
- අදාළ සූත්‍ර මතකයෙන් ප්‍රකාශ කිරීම
- වාචෝද්ගත කළ සාරාස්වතසූත්‍ර දේවනාගරී අකුරින් හා සිංහල අකුරින් ලිවීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 1
- සාරස්වතය
- හුණුපුවරුව

ඇමුණුම් 1

1 පහත දැක්වෙන සූත්‍ර ඒ ඒ ව්‍යාකරණාංගයන්ට අයත් වන සේ පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න. (නිදසුන් පමණි)

1. හ්‍රස්වදීර්ඝප්ලුතභේදාඃ ස්වර්ණාඃ
2. ස්වරහීනං පරේණ සංයෝජ්‍යම්
3. ස්වරෙ යත්වං වා
4. උභයේ ස්වරාඃ
5. අවර්ජා නාමිනඃ
6. වර්ණවිරෝධො ලෝපශ්
7. ඉයං ස්වරෙ
8. හසා ව්‍යඤ්ජනානි

| අනුඅංකය | සංඥා | සන්ධි |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

**2.** පහත සඳහන් සාරස්වතසූත්‍රයන්හි තේරුම ලියන්න.

01. एकमात्रो भवेद्ध्रस्वो

02. द्विमात्रो दीर्घ उच्यते।

03. त्रिमात्रस्तु प्लुतो ज्ञेयो।

04. व्यञ्जनञ्चार्धमात्रकम्।

05. ए ऐ ओ औ सन्ध्यक्षराणि।

06. अवर्जा नामिनः।

07. अ इ उ ऋ ऌ समानाः।

08. कादयो मावसानाः स्पर्शाः। / कुचुटुतुपु वर्गाः।

09. यरलवा अन्तःस्थाः।

10. शषसहा ऊष्माणः।

11. वर्णशिरो बिन्दुरनुस्वारः।

12. अः इति विसर्जनीयः।

13. मुखनासिकाभ्यामुच्चार्यमानो वर्णोऽनुनासिकः।

14. अकुहविसर्जनीयानां कण्ठः।

15. इचुयशानां तालु।

16. ऋटुरषाणां मूर्धा।

17. ऌतुलसानां दन्ताः।

18. उपूपध्मानीयानामोष्ठौ।

19. एदैतोः कण्ठतालुः।

20. ओदौतोः कण्ठौष्ठम्।

21. वकारस्य दन्तौष्ठम्।

22. ङञणनमानां नासिका।

23. आरेदो नामिनो गुणाः।

24. आरै औ वृद्धिः।

25. सवर्णे दीर्घः सह।

26. अ इ ए।

27. क्वचिदार्।

28. एदोतोतः।

29. इयं स्वरे।

30. उवम्।

31. चपा अबे जबाः।

32. स्तोः श्चुभिः श्चुः।

33. ष्टुभिः ष्टुः।

34. तोर्लिलः।

35. खसे चपा झसानाम्।

36. आदबे लोपश्।

37. नामिनो रः

38. रिलोपो दीर्घश्च

39. विसर्जनीयस्य सः।

40. मः स्वरे।

41. मोनुस्वारः।

# පාඩම 13 - නිර්දිෂ්ටග්‍රන්ථ - අභිනවා පාඨාවලී - 02

**නිපුණතාව** : 9.0 නිර්දිෂ්ටග්‍රන්ථ අර්ථාන්විත ව පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම** : 9.2 අභිනවා පාඨාවලී - 02 රසවිඳියි.

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල** : 9.2

- අභිනවා පාඨාවලී - 02 හි අදාළ කථා අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.
- අභිනවා පාඨාවලී - 02 හි අදාළ කථා මාතෘභාෂාවට පරිවර්තනය කරයි.
- අභිනවා පාඨාවලී - 02 හි අදාළ කථා රස විඳියි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**(ගුරුවරයාට)**

- මෙහි දී අභිනවා පාඨාවලී - 2හි අදාළ කථාවල අර්ථ විවරණය කිරීම අපේක්ෂිත ය. එබැවින් අර්ථ වන පොත්කරවා අදාළ කථාව පිළිබඳ අවබෝධය ලබාදෙමින් කරුණු විස්තර කොට දෙන්න.

**ප්‍රවේශය :**

- අදාළ කථාව පිළබඳ ව ශිෂ්‍යයකු ලවා අඳින ලද සිතුවමක් ප්‍රදර්ශනය කරන්න.
- ඒ පිළිබඳ සිසුන්ගේ අදහස් විමසා ඒ සම්බන්ධ ව අභිනවා පාඨාවලියෙහි එන කතාපුවත නම් කරන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- අභිනවා පාඨාවලියෙහි පහත සඳහන් කතා ඉදිරිපත්කිරීමට සුදුසු පරිදි කාලය වෙන්කොට ගන්න.
  - පළමුවන අංකය - සඞ්ගෙ ශක්තිඃ කලෞ යුගෙ
  - තුන්වැනි අංකය - දර්පාන්නාශෝනයාත්සුඛම්
  - දහතුන් වන අංකය - අන්ධානාං නිරීක්ෂණම්
  - විසිතුන් වන අංකය - කථාප්‍රියස්‍ය මහීපාලස්‍ය
- ඒ ඒ දිනවල දී පහත සඳහන් ආකාරයට එම කථා ඉගෙනීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- අභිනවා පාඨාවලියෙහි - 02, අදාළ කථාව ගුරු භවතා කියවමින් සිසුන් ලවා ඡේදයෙන් ඡේදය පුනරුච්චාරණය කරන්න.
- පසුව ඡේදයෙන් ඡේදය අර්ථ පැහැදිලි කරවමින් අදාළ කථාව විස්තර කරන්න.

- අදාළ කථාවේ මූලික චරිත හා සිද්ධීන් පිළිබඳවත් කථාවේ සාරාංශයත් සාකච්ඡා කරන්න.
- අදාළ කථාව දේවනාගරී පෙළ බලා කියවීමටත් අර්ථය ඒ සමගින් මාධ්‍යභාෂාවෙන් මතකයෙන් කීමටත් සිසුන් යොමු කරන්න.
- අදාළ කථාසාරය මතකයෙන් ලියවන්න.

## පියවර 2

- පන්තිය කණ්ඩායම් හතරකට බෙදන්න.
- අධ්‍යයනය කළ කතා පුවත් හතර කණ්ඩායම්වලට පවරන්න.
- එම කතා පුවත් අහඹු ලෙස ලබා දී චරිත නිරූපණයට යොමු කරන්න.
- ඇමුණුම 1 වගුව හුණුපුවරුවේ දක්වා සිසුන් ලවා එය සම්පූර්ණ කරවන්න.

## ඇගයීම හා තක්සේරුකරණය :

- අභිනවා පාඨාවලියෙහි නිර්දිෂ්ටකථා දේවනාගරී පෙළින් කියවීම
- අභිනවා පාඨාවලියෙහි නිර්දිෂ්ටකතථා මාධ්‍යභාෂාවට නගා අර්ථය පැහැදිලි කිරීම
- අදාළ කථාවල එන චරිත හා සිද්ධීන් මතකයෙන් කීම, ලිවීම සහ රඟ දැක්වීම

## ගුණාත්මක යෙදවුම් :

- ඇමුණුම 1
- අභිනවා පාඨාවලී 2
- තෝරාගත් කථාවකට අඳින ලද සිතුවමක්

**ඇමුණුම 1**

- ඒ ඒ කථාවන්ට අයත් චරිත යොදා පහත වගුව සම්පූර්ණ කරන්න

| අනු අංකය | සඞ්ගෙ ශක්තිඃ කලෞ යුගේ | දර්පාන්නශෝනයාත්සුබම් | අන්ධානාම් නිරීක්ෂණම් | කතාප්‍රියස්‍ය මහීපාලස්‍ය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

# පාඩම 14 - සංස්කෘත සාහිත්‍යය පෝෂණය කළ විද්වතුන්

**නිපුණතාව** : 10.0 උපදේශ සාහිත්‍යය සහ මහාකාව්‍ය සාහිත්‍යය රස විඳියි.

**නිපුණතා මට්ටම** : 10.1 සංස්කෘත සාහිත්‍යය පෝෂණය කළ විද්වතුන් අගය කරයි.

**කාලච්ඡේද** : 05 යි.

**ඉගෙනුම් පල** :

- සංස්කෘත සාහිත්‍යය පෝෂණය කළ විද්වතුන් කිහිපදෙනෙකු ලෙස මහාකවි අශ්වඝෝෂපාද, මහාකවි කාලිදාස සහ දණ්ඩින් හඳුන්වා දෙයි.
- අශ්වඝෝෂපාදයන්, මහාකවි කාලිදාසයන්, දණ්ඩින් යන විද්වතුන්ගේ නිර්මාණ වෙන් වෙන් ව නම් කරයි.
- අශ්වඝෝෂපාදයන්, මහාකවි කාලිදාසයන්, දණ්ඩින් යන විද්වතුන්ගේ සේවය වෙන් වෙන් ව ප්‍රකාශ කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්** :

(ගුරුවරයාට)

- ඉහත දක්වන ලද විද්වතුන් පිළිබඳ ජීවන තොරතුරු හා ඔවුන් විසින් රචිත පොතපත පිළිබඳවත් ඔවුන් කළ සේවාවන් පිළිබඳ ප්‍රාමාණික දැනුමක් අපේක්ෂිත ය. එබැවින් එම විද්වතුන් පිළිබඳ ජයදේව තිලකසිරි සූරීන්ගේ සංස්කෘත කාව්‍ය සාහිත්‍යය වැනි පොතපත ආශ්‍රයෙන් සිසුන් දැනුවත් කරන්න.

**ප්‍රවේශය** :

- सर्वभाषासु या श्रेष्ठा या चाढ्या शास्त्रसञ्चयैः ।
  श्रेयं संस्कृतभाषा ते भूयाद् वृद्धयै शिवाय च ॥

  ශ්ලෝකය ලියූ පත්‍රිකාවක් ප්‍රදර්ශනය කරන්න.
- එම ශ්ලෝකය සිසුන් සමග සජ්ඣායනය කරන්න.
- එහි අර්ථ විවරණ සපයමින් සංස්කෘත භාෂාවේ වටිනාකම පෙන්වා දෙන්න.
- එසේ ම ඒ අතර සංස්කෘත සාහිත්‍යය පිළිබඳ කරුණු දක්වා සංස්කෘත සාහිත්‍යය පෝෂණයට අශ්වඝෝෂ පාදයන්, මහාකවි කාලිදාසයන්, දණ්ඩින් යන විද්වතුන්ගේ සාහිත්‍යය මෙහෙවර අගය කරන්න.
- සංස්කෘත භාෂාවත් සාහිත්‍යයත් අගය කරමින් සිසුන් සමග සාකච්ඡාවක නිරතවන්න.

පාඩම සංවර්ධනය :

**පියවර 1**

- ඇමුණුම 1 ලිපිය සියලු ම සිසුන්ට ලබා දෙන්න.
- පන්තිය කණ්ඩායම් තුනකට බෙදා අශ්වඝෝෂපාදයන්, කාලිදාසයන් හා දණ්ඩින් යන විද්වත් චරිත ඔවුන්ට පවරා දෙන්න.
- ඇමුණුම 1 ඇසුරින් තමන්ට පවරන ලද විද්වත් පුද්ගලයා පිළිබඳ පහත දැක්වෙන කරුණු ගොනු කිරීමට සිසු කණ්ඩායම් මෙහෙයවන්න.
    - විද්වත් පුද්ගලයා හඳුන්වා දීම
    - ජීවන තොරතුරු
    - රචිත කෘති
    - ඔහුට අනන්‍ය වූ කාව්‍යය ලක්ෂණ, භාෂා රීති, රචනා ශෛලීය, අලංකාර ප්‍රයෝග, චින්තන රටාව
    - ඔහුගේ නිර්මාණ අතීතයේ සිට වර්තමානය දක්වා මෙන් ම අනාගතය තෙක් විහිදෙමින් සංස්කෘත සාහිත්‍ය පෝෂණයට දායකවන ආකාරය
    - ඔහු වෙනුවෙන් අප ඉදිරිපත් කරනු ලබන ප්‍රශස්ති
- බුද්ධි කලම්බන සාකච්ඡාවක් ලෙස කණ්ඩායම් අනාවරණ ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

**පියවර 2**

- ඇමුණුම 2 සිසු කණ්ඩායම්වලට ලබා දෙන්න.
- කණ්ඩායම් විසින් ගොනු කළ තොරතුරු (A4 කඩදාසිවල) සාහිත්‍යය රසයෙන් යුතු ව ලිවීමට යොමු කරන්න.
- සුදුසු මාතෘකාවක් යොදා ග්‍රන්ථයක් නිර්මාණය කරන්න.
- අදාළ පින්තූර, කාව්‍ය, මුල්පිටු, කවර, ආදිය නිර්මාණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- සුදුසු විද්වතකු කැඳවා එම නිමැවුම අගය කරන්න.

**පියවර 3**

- සිසුන් තුන් දෙනෙකු අදාළ චරිතනිරූපණයට යොමු කරන්න.
- තමන් සංස්කෘත සාහිත්‍යයට සිදු කළ මෙහෙවර සමස්ත පන්තියට ප්‍රකාශ කර නාට්‍යමය ස්වරූපයෙන් විද්වත් සාකච්ඡාවක් සිදු කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ඒ ඒ පඬිවරයා විසින් රචිත කෘති පන්තිය ඉදිරියේ ප්‍රදර්ශනය කිරීමට ඔවුන්ට අවස්ථාව දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- මහාකවි අශ්වඝෝෂයන්, මහාකවි කාලිදාසයන් හා ශ්‍රීමද් දණ්ඩින් පිළිබඳ ජීවන තොරතුරු ඉදිරිපත් කිරීම
- මහාකවි අශ්වඝෝෂයන්, මහාකවි කාලිදාසයන් හා ශ්‍රීමද් දණ්ඩින් විසින් රචිත පොතපත වෙන් වෙන් ව ලැයිස්තුගත කිරීම
- මහාකවි අශ්වඝෝෂයන්, මහාකවි කාලිදාසයන් හා ශ්‍රීමද් දණ්ඩින් විසින් සංස්කෘත සාහිත්‍යය පෝෂණය විෂයෙහි දැක්වූ දායකත්වය ප්‍රකාශ කරමින් ලේඛන සැකසීම
- ඉහත දැක්වූ විද්වතුන් විසින් කළ සේවය හා ඔවුන්ගේ නිර්මාණ මතකයෙන් ප්‍රකාශ කිරීම හා ලිවීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 1 සහ 2
- සංස්කෘත කාව්‍ය සාහිත්‍යය
- අදාළ පඬිවරුන් විසින් රචිත ග්‍රන්ථවල පිටපත්

**ඇමුණුම් 1**

- අශ්වඝෝෂපාදයන් කවියකු හා දාර්ශනිකයකු ලෙස භාරතයෙහි චිරප්‍රසිද්ධ ව සිටි අයකු බව පැහැදිලි කරන්න.
- සාකේත පුරයේ විසූ සුවර්ණාක්ෂී නම් ස්ත්‍රියකගේ පුතෙකු මෙන් ම බෞද්ධ භික්ෂුවක් බව පෙන්වා දෙන්න.
- පෞද්ගලික ජීවන තොතුරු හා ඔහුගේ සාහිත්‍යයමය සේවාව හඳුන්වා දෙන්න.
- බුද්ධචරිත මහාකාව්‍යය, සෞන්දරනන්ද මහාකාව්‍යය, ශාරිපුත්‍රප්‍රකරණය යනාදි කෘතීන් අශ්වඝෝෂපාදයන්ගේ කෘතීන් බව පෙන්වා දෙන්න.
- අශ්වඝෝෂපාදයන්ගේ කාව්‍යකරණයෙහි සුවිශේෂතා පැහැදිලි කරන්න.
- අශ්වඝෝෂපාදයන් සංස්කෘත සාහිත්‍යය පෝෂණයට දායක වී ඇති ආකාරය ඔහු අනුගමනය කළ ආර්යශූර වැනි පඬිවරුන්ගේ ජාතකමාලාව වැනි පොතපත නිදර්ශන වශයෙන් ගෙන පහදා දෙන්න.
- මහාකවි කාලිදාසයන් සංස්කෘත සාහිත්‍යයෙහි ප්‍රථමාංකය වශයෙන් ප්‍රකටව සිටි බවත් ''**උපමා කාලිදාසස්‍ය**'' යන ප්‍රකාශානුගත ව උපමා කාව්‍යකරණයෙහි ද අග්‍රතමයා වශයෙන් ප්‍රකට ව සිටි බවත් පැහැදිලි කරන්න.
- කාලිදාසයන්ගේ ජීවන තොරතුරු ජයදේව තිලකසිරි සූරීන්ගේ ''සංස්කෘත කාව්‍ය සාහිත්‍යය'' ඇසුරින් පැහැදිලි කොට දෙන්න.
- ඔහුගේ සාහිත්‍යමය සේවාව හඳුන්වා දෙන්න.
- ඍතුසංහාරය, රඝුවංශය, කුමාරසම්භවය, මේඝදූතය, අභිඥාන ශාකුන්තලය, මාලවිකාග්නිමිත්‍ර, වික්‍රමෝර්වශී යනාදි මහාකාව්‍ය, ඛණ්ඩකාව්‍ය හා නාට්‍යකෘති කාලිදාසයන්ගේ කෘතීන් බවත්

ඊට අමතර ව තවදුරටත් බොහෝ පොතපත ඔහු විසින් රචනා කොට ඇති බවත් එම කෘතීන් සංස්කෘත සාහිත්‍ය පෝෂණයට දායක වී ඇති බවත් පෙන්වා දෙන්න.

- මහාකවි කාලිදාසයන්ගේ කාව්‍ය ලක්ෂණ, රචනා ශෛලීය, අලංකාර ප්‍රයෝග හා චින්තන ශක්තිය පිළිබඳ කරුණු උක්ත පොතපත ඇසුරින් පැහැදිලි කොට දෙන්න.
- මහාකවි කාලිදාසයන් සංස්කෘත සාහිත්‍යය පෝෂණයට දායක වී ඇති ආකාරය හා ඔහු විසූ කාලය පිළිබඳ බාණ, රවිකීර්ති, වැනි පඬිවරුන් පැහැදිලි කළ නිදර්ශන හා කාලිදාසයන්ගේ විවිධ පොතපත මගින් ගෙන කරුණු පහදා දෙන්න.
- කාලිදාසයන්ගේ ජීවන තෙරතුරු හා සාහිත්‍යය සේවාව පිළිබඳ වාක්‍ය රචනා ලේඛනයට හා අදාළ මාතෘකාගත ව වාචික ඉදිරිපත් කිරීම් සිදුකිරීමට සිසුන්ට උපදෙස් දෙමින් ඒවා ඇගයීමට ලක් කරන්න.
- දණ්ඩින් ගද්‍යය කවියකු හා දක්ෂ කාව්‍ය විචාරකයකු වශයෙන් ඉතිහාසගත ව භාරතයෙහි ප්‍රකට ව සිටි අයෙකු බව පැහැදිලි කරන්න.
- පෞද්ගලික ජීවනතොරතුරු හා ඔහුගේ සාහිත්‍යයමය සේවාව හඳුන්වා දෙන්න.
- කාව්‍යාදර්ශය, දශකුමාරචරිතය යනාදි කෘතීන් ශ්‍රීමද් දණ්ඩින්ගේ කෘතීන් බවත් එම කෘතීන් සංස්කෘත සාහිත්‍ය පෝෂණයට දායක වී ඇති බවත් පෙන්වා දෙන්න.
- සංස්කෘත කාව්‍ය විචාරයෙහි හස්තසාර කෘතියක් වශයෙන් දණ්ඩින් විසින් විරචිත කාව්‍යාදර්ශයේ ප්‍රාමාණික බව පැහැදිලි කරන්න.
- ශ්‍රීමද් දණ්ඩින්ගේ කාව්‍ය ලක්ෂණ හා භාෂා රීතියත් භාවිතයත් පිළිබඳ කරුණු උක්ත පොතපත ඇසුරින් පැහැදිලි කර දෙන්න.
- දණ්ඩින් සංස්කෘත සාහිත්‍ය පෝෂණයට දායක වී ඇති ආකාරය ඔහු අනුගමනය කළ පසුකාලීන කවීන්ගේ ප්‍රකාශයන් හා කාව්‍යාදර්ශය ඇසුරින් රචිත මහාකාව්‍යයන් හා වෙනත් පොතපත නිදර්ශන වශයෙන් ගෙන පහදා දෙන්න.

### ඇමුණුම් 2

- **දිදුලන තරු ඔබය සකු සාහිත අඹරේ** යන මාතෘකාව සඳහා, අශ්වඝෝෂපාදයන් විසින් සිදු කළ සාහිත්‍ය සේවාවන් හා ඔහුගේ ජීවන තොරතුරු, මහාකවි කාලිදාසයන් විසින් සිදු කළ සාහිත්‍ය සේවාවන් හා ඔහුගේ ජීවන තොරතුරු, ශ්‍රීමද් දණ්ඩින් විසින් සිදු කළ සාහිත්‍ය සේවාවන් හා ඔහුගේ ජීවන තොරතුරු ඇතුළත් කරමින් පුවත්පත් ලිපියක් පිළියෙල කරන්න. (මෙම ලිපිය ලිවීම සඳහා ජයදේව තිලකසිරි සූරීන්ගේ ''සංස්කෘත කාව්‍ය සාහිත්‍යය'' කෘතිය පරිශීලනය කරන්න.)

# පාඩම 15 - පඤ්චතන්ත්‍රය

**නිපුණතාව** : 10.0 උපදේශ සාහිත්‍යය සහ මහාකාව්‍ය සාහිත්‍යය රස විඳියි.

**නිපුණතා මට්ටම** : 10.2 පඤ්චතන්ත්‍රය රස විඳියි.

**කාලච්ඡේද** : 15 යි.

**ඉගෙනුම් පල** :

- පඤ්චතන්ත්‍රයෙහි අදාළ කථා අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.
- පඤ්චතන්ත්‍රයෙහි අදාළ කථා මාතෘභාෂාවට පරිවර්තනය කරයි.
- පඤ්චතන්ත්‍රයෙහි අදාළ කථා රස විඳියි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**(ගුරුවරයාට)**

- මෙහි දී පඤ්චතන්ත්‍රයෙහි අදාළ කතාවල අර්ථ විවරණය කිරීම අපේක්ෂිත ය. එබැවින් අර්ථ වනපොත් කරවා අදාළ කථාව පිළිබඳ අවබෝධය ලබාදෙමින් කරුණු විස්තර කොට දෙන්න.

**ප්‍රවේශය :**

- පඤ්චතන්ත්‍රයට අයත් තන්ත්‍ර පහ පිළිබඳ පූර්ව මතකය අවදි කරන්න.
- පස්වන ශ්‍රේණියට **කාකෝලූකීය, අපරීක්ෂිතකාරකය හා ලබ්ධප්‍රණාශ** යන තන්ත්‍රයන්ට අයත් කතා පුවත් කිහිපයක් පමණක් නිර්දේශිත බව පෙන්වා දෙන්න.
- පඤ්චතන්ත්‍රයෙහි එන කථාවල උපදේශාත්මක බව අගයන්න.

**පාඩම සංවර්ධනය :**

**පියවර 1**

- පඤ්චතන්ත්‍රයෙහි පහත සඳහන් කථා ඉදිරිපත් කිරීමට කාලය වෙන්කර ගන්න.
  - කාකෝලූකීය තන්ත්‍රය
    - පස්වන අංකය වන බ්‍රාහ්මණසර්පකථා
    - දහවන අංකය වන ස්වර්ණපුරීෂපක්ෂී - රාජ - මන්ත්‍රීකථා

- ○ අපරීක්ෂිතකාරක තන්ත්‍රය
  - පළමුවන අංකය වන බ්‍රාහ්මණීනකුලකථා
  - තුන්වන අංකය වන සිංහකාරක මූර්ඛකථා
  - දහතුන්වන අංකය ඒකොදරභාරුණ්ඩකථා
- ○ ලබ්ධප්‍රණාශ තන්ත්‍රය
  - සිව්වන අංකය වන සිංහශෘගාලශිශුකථා

- ඒ ඒ දිනවල දී පහත සඳහන් ආකාරයට එම කථා ඉගෙනීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- පඤ්චතන්ත්‍රයෙහි, අදාළ කථාව ගුරු භවතා කියවමින් සිසුන් ලවා ඡේදයෙන් ඡේදය පුනරුච්චාරණය කරන්න.
- පසු ව ඡේදයෙන් ඡේදය අර්ථ පැහැදිලි කරවමින් අදාළ කථාව විස්තර කරන්න.
- අදාළ කථාවේ මූලික චරිත හා සිද්ධීන් පිළිබඳත්, කථාවේ සාරාංශයත් සාකච්ඡා කරන්න.
- අදාළ කථාව දේවනාගරී පෙළ බලා කියවීමටත්, අර්ථය ඒ සමගින් මාධ්‍යභාෂාවෙන් මතකයෙන් ප්‍රකාශ කිරීමටත් සිසුන් යොමු කරන්න.
- අදාළ කථාසාරය මතකයෙන් ලියවන්න.
- අදාළ කථාවේ උපදේශය පිළිබඳ විස්තර කරන්න.

**පියවර 2**

- පන්තිය කණ්ඩායම් තුනකට බෙදන්න.
- අධ්‍යයනය කළ කථා පුවත් හය කණ්ඩායම්වලට පවරන්න.
- එම කථා පුවත් දෙක බැගින් අහඹු ලෙස ලබා දී චරිත නිරූපණයට යොමු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- පඤ්චතන්ත්‍රයෙහි නිර්දිෂ්ටකථා දේවනාගරී පෙළින් කියවීම
- පඤ්චතන්ත්‍රයෙහි නිර්දිෂ්ටකථා මාධ්‍යභාෂාවට නගා අර්ථ මතකයෙන් කියවීම, ලිවීම
- අදාළ කථාවල එන චරිත හා සිද්ධීන් මතකයෙන් කීම හා ලිවීම.
- අදාළ කථා රංගනයෙන් ඉදිරිපත් කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

- පඤ්චතන්ත්‍රය

# පාඩම 16 - සෞන්දරනන්ද මහාකාව්‍යය

**නිපුණතාව** : 10.0 උපදේශ සාහිත්‍යය සහ මහාකාව්‍ය සාහිත්‍යය රස විඳියි.

**නිපුණතා මට්ටම** : 10.3 සෞන්දරනන්ද මහාකාව්‍යය රස විඳියි.

**කාලච්ඡේද** : 20 යි.

**ඉගෙනුම් පල** :

- සෞන්දරනන්ද මහාකාව්‍යයෙහි අදාළ ශ්ලෝක අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.
- සෞන්දරනන්ද මහාකාව්‍යයෙහි අදාළ ශ්ලෝක මාධ්‍යභාෂාවට පරිවර්තනය කරයි.
- සෞන්දරනන්ද මහාකාව්‍යයෙහි අදාළ ශ්ලෝක රස විඳියි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**(ගුරුවරයාට)**

- මෙහි දී සෞන්දරනන්ද මහාකාව්‍යයයෙහි අදාළ ශ්ලෝකවල අර්ථ විවරණය කිරීම අපේක්ෂිත ය. එබැවින් අර්ථ වනපොත් කරවා ශ්ලෝකයන්හි පැනෙන අර්ථරසය හා ශබ්දරසය පිළිබඳ අවබෝධය ලබාදෙමින් කරුණු විස්තර කොට දෙන්න.

**ප්‍රවේශය :**

- සෞන්දරනන්ද මහාකාව්‍යය සිසුනට ඉදිරිපත් කරන්න.
- කාව්‍යාදර්ශයෙහි දැක්වෙන පරිදි මහාකාව්‍යය ලක්ෂණ සහිත ව එහි මූලික අර්ථ පඤ්චකය පැහැදිලි කරන්න.
- සෞන්දරනන්ද මහාකාව්‍යයේ අලංකාරය සාකච්ඡා කරන්න.

**පාඩම සංවර්ධනය :**

- පහත පරිදි සෞන්දරනන්ද මහාකාව්‍යයෙහි අදාළ ශ්ලෝක සංඛ්‍යා කාණ්ඩ කොට ගනිමින් ඒවා ඉදිරිපත් කිරීමට දින වෙන්කොට ගන්න.
  - සිව්වන සර්ගයට අයත් 01, 02, 04, 05, 06, 07, 26, 28, 30, 31, 33, 34, 39, 42 යන ශ්ලෝක 14
  - 06 වන සර්ගයට අයත් 01, 03, 05, 06, 12, 13, 14, 24, 25, 34 යන ශ්ලෝක 10
  - 08 වන සර්ගයට අයත් 01 සිට 11 දක්වා ශ්ලෝක 11
  - 10 වන සර්ගයට අයත් 58 සිට 64 දක්වා ශ්ලෝක 07

- 11 වන සර්ගයට අයත් 31, 32, 33 යන ශ්ලෝක 03
- 12 වන සර්ගයට අයත් 32 සිට 35 දක්වා ශ්ලෝක 04
- 13 වන සර්ගයට අයත් 11, 13, 14, 15, 20, 29, 30, 31, 32, 33, 39, 40, යන ශ්ලෝක 12
- 14 සර්ගයට අයත් 11, 12, 13, 14, 15, 27, 28, 30, 33, 36 යන ශ්ලෝක 10
- 15 සර්ගයට අයත් 27, 32, 36, 41, 45, 46, 47, 49, 53 යන ශ්ලෝක 09
- 16 වන සර්ගයට අයත් 09, 10, 11, 12, 16, 26, 27, 28, 29, 30, 43, 44 යන ශ්ලෝක 12
- 18 වන සර්ගයට අයත් 01, 02, 03, 04, 05, 06, 07, 22, 23, 26, 27, 29, 30, 32, 33, 34, 38, 42, 45, 46, 54, 55, 63, 64 යන ශ්ලෝක 24

- ඉහත දැක්වෙන නිර්දිෂ්ට ශ්ලෝක ගුරුභවතා කියවමින් සිසුන් ලවා පුනරුච්චාරණය කරවන්න.
- යොදා ගත් ඒ ඒ දිනවල දී ශ්ලෝකයෙන් ශ්ලෝකය අර්ථ පැහැදිලි කරන්න.
- අදාළ ශ්ලෝකවල සරල අර්ථ සාකච්ඡා කරන්න.
- අදාළ ශ්ලෝකවල ඇති අර්ථරසය හා ශබ්දරසය මැනවින් පැහැදිලි වන සේ සජ්ඣායනා කරන්න.
- අදාළ ශ්ලෝක දේවනාගරී පෙළ බලා කියවීමටත්, අර්ථය ඒ සමගින් මතකයෙන් කීමටත් උපදෙස් දෙන්න.
- අදාළ ශ්ලෝක දේවනාගරී අකුරින් හා මාධ්‍යභාෂාවෙන් ලිවීමට සලස්වන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- සෞන්දරනන්ද මහාකාව්‍යය

**ඇගයීම හා තක්සේරුකරණය :**

- සෞන්දරනන්ද මහාකාව්‍යයෙහි නිර්දිෂ්ටශ්ලෝක දේවනාගරී පෙළින් කියවීම
- සෞන්දරනන්ද මහාකාව්‍යයෙහි නිර්දිෂ්ටශ්ලෝක මාධ්‍යභාෂාවට නගා අර්ථ මතකයෙන් කියවීම, ලිවීම
- අර්ථරසය හා ශබ්දරසය ගැබ් ව ඇති ශ්ලෝක වෙන්කොට දැක්වීම

# ඇගයීම හා තක්සේරුකරණය

# හැඳින්වීම

පිරිවෙන්වල භාවිතය සඳහා සකස් කරන ලද මෙම ගුරු මාර්ගෝපදේශය තුළින් නිපුණතා පාදක විෂයමාලාව හඳුන්වා දීමේ දී **පාසල පදනම් කරගත් තක්සේරුකරණය** පිළිබඳ මේ වන විට ඔබ මනා වැටහීමක් ලබා තිබිය යුතු ය. ඔබ ගේ පහසුව සඳහා මෙම ගුරු මාර්ගෝපදේශයේ ද එම විස්තර පහත දක්වා ඇත.

ඉගෙනුම, ඉගැන්වීම සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත්, ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැන ගැනීම පිණිස ඇගයීම යොදා ගත යුතු බවත්, සෑම ගුරුවරයකු විසින් ම දතයුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යෝන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියා කරන බවත්, එ සේ ම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත්, ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදු වන) ඇගයීම් මූල ධර්ම අනුව ඇගයීම සිදු විය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දී ය. මෙය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑ ම අවස්ථාවක දී සිදු විය හැකි ය. එ ලෙස තම සිසුන් ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයකු ඉගෙනුම ඉගැන්වීම හා සහ ඇගයීම පිළිබඳ සංවිධානාත්මක සැලැස්මක් යොදා ගත යුතු වෙයි.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන් ගේ ඉගෙනීමත්, ගුරුවරුන් ගේ ඉගැන්වීමත්, වැඩි දියුණු කිරීම සඳහා යොදා ගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. මෙය සිසුන්ට සමීප ව සිටිමින් ඔවුන් ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනා ගෙන ඒවාට පිළියම් යොදමින් සිසුන් ගේ උපරිම වර්ධනය ළඟා කර ගැනීමට යොදාගත හැකි වැඩ පිළිවෙළකි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියට සිසුන් යොමු කෙරෙන අතර ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්යය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය  සපයමින් කටයුතු කිරීම පාසල පදනම් කර ගත් ඇගයීම් වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහි දී ශිෂ්‍යයා නිරතුරු ව ඇගයීමට ලක් විය යුතු අතර ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදු වන්නේ දැ යි ගුරුවරයා විසින් තහවුරු කරනු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මගින් සිදුවිය යුත්තේ සිසුනට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කර ගෙන තිබේ දැයි තහවුරු කර ගැනීම ය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ගුරුවරයා ගේ කාර්යභාරය යි. ඇගයීමේ(තක්සේරු කිරීමේ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණය (feed Forward) යනුවෙනි. සිසුන් ගේ දුබලතා අනාවරණය කොට ගෙන ඒවාට පිළියම් යෙදීම ප්‍රතිපෝෂණයෙන් සිදු කෙරෙන අතර, ප්‍රබලතා වැඩි දියුණු කිරීම සඳහා යම් යම් ක්‍රියාමාර්ග ගැනීම ඉදිරි පෝෂණයෙන් සිදු කෙරේ.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතුරෙන් කවර අරමුණු කවර මට්ටමින් සාක්ෂාත් වුයේ දැ යි අනාවරණය කර ගැනීම අවශ්‍ය වෙයි. ඇගයීම් වැඩ පිළිවෙළ ඔස්සේ සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන් ගෙන් බලාපොරොත්තු වන අතර එම තත්ත්වය සිසුන්ට සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමු විය යුතු ය. මේ සඳහා පවත්නා හොඳ ම ක්‍රමය වන්නේ පාසල පදනම් කර ගත් ඇගයීම් ක්‍රමය යි. යථෝක්ත අරමුණ සහිත ව ක්‍රියා කරන ගුරුවරුන් විසින් තම ඉගැන්වීම් කාර්යයත්, සිසුන්ගේ ඉගෙනුම් කාර්යයත්, කාර්යක්ෂම කිරීම පිණිස වඩාත් හොඳ කාර්යක්ෂමතාවෙන් යුක්ත ඉගෙනුම් ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට හා ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද, ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද, යෝජනා කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්ෂා කෙරේ.

1. පැවරුම්
2. ව්‍යාපෘති
3. සමීක්ෂණ
4. ගවේෂණ
5. නිරීක්ෂණ
6. ප්‍රදර්ශන / ඉදිරිපත් කිරීම
7. ක්ෂේත්‍ර චාරිකා
8. කෙටි ලිඛිත පරීක්ෂණ
9. ව්‍යුහගත රචනා
10. විවෘත ග්‍රන්ථ පරීක්ෂණ
11. නිර්මාණාත්මක ක්‍රියාකාරකම්
12. ශ්‍රවණ පරීක්ෂණ
13. ප්‍රායෝගික ක්‍රියාකාරකම්
14. කථනය
15. ස්වනිර්මාණ
16. කණ්ඩායම් ක්‍රියාකාරකම්
17. සංකල්ප සිතියම
18. ද්විත්ව සටහන් ජර්නල
19. බිත්ති පුවත්පත්
20. ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන්
21. ප්‍රශ්න හා පිළිතුරු පොත්
22. විවාද
23. සාකච්ඡා මණ්ඩල
24. සම්මන්ත්‍රණ
25. ක්ෂණික කථා
26. භූමිකා රංගන

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම සෑම එකක් මත්, සෑම විෂයක් සම්බන්ධයෙන් මත්, සෑම විෂය ඒකකයකට මත්, යොදා ගත යුතු යැයි අපේක්ෂා නොකෙරේ. තම විෂයට, විෂය ඒකකයට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනීමට ගුරුවරුන් දැනුවත් විය යුතු ය. වග බලාගත යුතු ය. එහි දී උචිත නිර්ණායක පදනම් කරගෙන ඇගයීම් ආධාරක සකස් කොට ඇගයීම් කාර්යය සිදු කළ යුතු වේ.

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය

1. වාරය ඃ පළමු වාරය

2. ආධාරක අංකය ඃ 01

3. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම ඃ 6.1

4. ආවරණය කෙරෙන විෂය සන්ධාරය ඃ 6.1 නිර්දිෂ්ට ග්‍රන්ථවල ශ්ලෝක නිවැරැදි ව හා අර්ථාවබෝධයෙන් යුතු ව භාවිත කරයි.

5. ආධාරකයේ ස්වභාවය ඃ පිටු පෙරළනයක් සැකසීම

6. ආධාරකයේ අරමුණු ඃ
- නාමාෂ්ටශතකය පිළිබඳ දැනුවත් බව ඇති කිරීම
- නාමාෂ්ටශතකයේ ඇති ශ්ලෝක 18 වාචෝද්ගත කිරීම හා දිරි ගැන්වීම
- නාමාෂ්ටශතකයේ ශ්ලෝක දේවනාගරී අක්ෂරවලින් ලිවීමේ කුසලතාව තහවුරු කිරීම

ගුරු උපදෙස් ඃ

- පන්තියේ සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදා එක් එක් කණ්ඩායමට වෙන වෙන ම නාමාෂ්ට ශතකයේ ශ්ලෝක පවරා ඒ ඒ ශ්ලෝකය ඩිමයි කඩදාසියක දේවනාගරී අක්ෂරයෙන් ලියා පිටු පෙරළනයට එක් පිටුවක් බැගින් සකස් කිරීමට උපදෙස් දෙන්න.
- අදාළ පිටුව කැමැති පරිදි වර්ණ ගන්වා චිත්තාකර්ෂණීය ලෙස සැකසීමට යොදවන්න.
- පිටු සකස් කිරීමට නිශ්චිත කාල රාමුවක් ලබාදෙන්න.
- අදාළ පිළිවෙළට පිටු 18 අමුණා පිටු පෙරළනය ගොඩනැගීමට සිසුන්ට සහාය වන්න.
- පිටු පෙරළනය නිතර පරිහරණය කළ හැකි ස්ථානයක රඳවන්න.
- අදාළ නිර්ණායකයන්ට ලකුණු ලබා දෙන්න.

සිසු උපදෙස් ඃ

- තම කණ්ඩායමට සකස් කිරීමට නියමිත ශ්ලෝක ගුරුවරයා හා සාකච්ඡා කොට තීරණය කරන්න.

- අකුරු හොඳින් ඉස්මතු වී ඈතට පෙනෙන සේ නිවැරදි දේවනාගරී අක්ෂරවලින් ලියන්න.
- පිටු 18 පිළිවෙළට අමුණා පිටු පෙරළනය ගොඩනගන්න.
- නිර්ණායක මැනවින් තේරුම් ගෙන උසස් ලෙස කණ්ඩායමේ කාර්යය සිදු කරන්න.

| | නිර්ණායකය | සිසුන්ගේ නම් | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |
| 1. | මාතෘකාවට අදාළ බව | | | | | | | | | |
| 2. | කරුණුවල නිවැරදි බව | | | | | | | | | |
| 3. | ලිපි පිළිවෙළට සැකසීම | | | | | | | | | |
| 4. | දත්තවල ප්‍රමාණාත්මක බව | | | | | | | | | |
| 5. | නිර්මාණාත්මක බව | | | | | | | | | |
| | එකතුව | | | | | | | | | |

**ලකුණු පරාසය**

- ඉතා හොඳයි 04
- හොඳයි 03
- මධ්‍යස්ථ යි 02
- සංවර්ධනය විය යුතු යි 01

මුලින් ලකුණු 20ක් ප්‍රදානය කොට දෙවනු ව එය දෙකෙන් බෙදා අවසාන ලකුණු සටහන් කිරීම නිර්දේශ කෙරේ. ශිෂ්‍යයා ලබා ගත් ලකුණු ඔත්තේ සංඛ්‍යාවක් නම් දෙකෙන් බෙදූ විට ඉතිරියක් වන නිසා එය ධනාත්මක අගයකින් පූර්ණ සංඛ්‍යාවට ගෙනයන්න. මේ ලකුණු ඇසුරෙන් ශිෂ්‍ය නිපුණතා මට්ටම තීරණය කෙරේ.

| | |
|---|---|
| 9-10 | විශිෂ්ට මට්ටමේ නිපුණතාව |
| 8 | ඉහළ මට්ටමේ නිපුණතාව |
| 6-7 | සම්මාන මට්ටමේ නිපුණතාව |
| 4-5 | ආසන්න මට්ටමේ නිපුණතාව |
| 5 ට අඩු | නිපුණතාවට ළඟා නො වූ |

මෙය නිදර්ශක ආධාරකයක් පමණි. ගුරුවරයාට ස්වාධීන ව ආධාරක සැලසුම් සකස් කොටගත හැකි ය.

| | |
|---|---|
| සියලු ම හිමිකම් ඇවිරිණි<br>All Rights Reserved | **මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2018**<br>**Primary Piriven Mid Year Term Test - 2018** |
| | 5 ශ්‍රේණිය /**Grade 5** |
| | **සංස්කෘත භාෂාව I**     **කාලය : පැය එකයි**<br>Sanskrit I   **විභාග අංකය :**.......................................... Time : One hours |

- **1 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන එය උත්තර පත්‍රයේ දක්වෙන උපදෙස් පරිදි කතිරයක් (x) යොදා දක්වන්න.**

1. නාමින් ස්වර ගණනින්,

(1) අටකි. (2) දහයකි. (3) දොළහකි. (4) දාහතරකි.

2. ඕෂ්ඨජ ස්වර ඇතුළත් වරණය කුමක් ද?

(1) उ ऊ। (2) अ आ। (3) इ ई। (4) ऋ ॠ।

3. ඌෂ්මාක්ෂර පමණක් ඇතුළත් පේළිය වන්නේ,

(1) ए ऐ ओ औ। (2) आ आर् ऐ औ।

(3) स श ष ह। (4) य र ल व।

4. ह्मा යන අක්ෂරය සෑදී ඇත්තේ,

(1) द् + य् + आ (2) ह् + म् + आ

(3) द् + भ् + आ (4) द् + म् + आ

5. र् + म् + औ යන අක්ෂර එක්වීමෙන් සෑදෙන සංයුක්තාක්ෂරය වන්නේ,

(1) र्मो (2) र्मौ (3) म्रौ (4) र्मै

6. ऋ කාරයෙහි වෘද්ධි රූපය වන්නේ,

(1) रि। (2) आर्। (3) अर्। (4) रा।

7. ද්විජාක්ෂර පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) ए, ऐ, व, र, क। (2) य, र, ल, व, ङ।

(3) ञ, ण, न, म, श। (4) ए, ऐ, ओ, औ, व।

8. ප්‍රත්‍යාහාර සූත්‍රයට අනුව 'හබ' ප්‍රත්‍යාහාරය යනු

(1) අඝෝෂාක්ෂර යි. (2) අල්ප ප්‍රාණාක්ෂර යි.

(3) ඝෝෂාක්ෂර යි. (4) මහප්‍රාණාක්ෂර යි.

9. ''कादयोमावसानाः स्पर्शाः'' යනු,

(1) क සිට स දක්වා අකුරු ස්පර්ශාක්ෂර යි.

(2) क සිට म දක්වා අකුරු ස්පර්ශාක්ෂර යි.

(3) क සිට ळ දක්වා අකුරු ස්පර්ශාක්ෂර යි.

(4) क සිට ह දක්වා අකුරු ස්පර්ශාක්ෂර යි.

10. ''भानु'' ශබ්දයේ තෘතීයා විභක්ති බහුවචනය ඇතුළත් වරණය කුමක් ද?

(1) भानुभ्यः। (2) भानुभ्याम्। (3) भानुभिः। (4) भानूनाम्।

11. ''मुनौ'' යන්නෙහි නිවැරදි විභක්තිය හා වචනය දැක්වෙන වරණය තෝරන්න.

(1) ප්‍රථමා විභක්ති ද්විවචන පදයකි.

(2) සප්තමී විභක්ති ඒකවචන පදයකි.

(3) ද්විතීයා විභක්ති ද්විවචන පදයකි.

(4) සප්තමී විභක්ති ද්විවචන පදයකි.

12. ''बन्धवे – शालायाम्'' යන පදවල පිළිවෙළින් අර්ථය ඇතුළත් වරණය කුමක් ද?

(1) නෑයා ගේ - ශාලාවෙන් (2) නෑයා විසින් - ශාලාවල

(3) නෑයා ගෙන් - ශාලාවෙහි (4) නෑයාට - ශාලාවෙහි

13. අපාදානාර්ථය යෙදෙන්නේ කුමන විභක්තියේ ද?

(1) ප්‍රථමා විභක්තිය (2) ද්විතීයා විභක්තිය

(3) චතුර්ථී විභක්තිය (4) පඤ්චමී විභක්තිය

14. ए , ऐ , ओ , औ යන අක්ෂර අයත් වන්නේ,

(1) හ්‍රස්ව ස්වරවලට යි. (2) ගුණ ස්වරවලට යි.

(3) වෘද්ධි ස්වරවලට යි. (4) සන්ධ්‍යක්ෂරවලට යි

15. ස්ත්‍රීලිංග නාම පමණක් ඇතුළත් වරණය වන්නේ,

(1) लङ्का – जननी – वसुधा। (2) नदी – तनुजा – भानु।

(3) नगरी – माया – भर्ता। (4) अस्थि – भगिनी – गौरी।

16. ''नृणाम्'' යන පදයෙහි අර්ථය වන්නේ,

(1) මිනිසුන් ගේ යන්න යි. (2) මිනිසා යන්න යි.

(3) මිනිසා ගේ යන්න යි. (4) මිනිසුන් දෙදෙනා ගේ යන්න යි.

17. ''आवाम् अध्ययनाय पाठालयं ............ ।'' හිස්තැනට ගැළපෙන ආඛ්‍යාතපදය ඇතුළත් වරණය තෝරන්න.

(1) प्रविशथ । (2) प्रविशामः । (3) प्रविशथः । (4) प्रविशावः ।

18. ''अतिष्ठम् - धावामि'' යන ආඛ්‍යාතයන්හි තේරුම පිළිවෙළින් දක්වා ඇති වරණය කුමක් ද?

(1) සිටියෙමි - දුවමි (2) සිටිමි - දිව්වෙමි

(3) සිටියෙමි - දුවන්නෙමි (4) සිටින්නෙමි - දුවන්නෙමි

19. වර්තමාන लट् හා අනද්‍යතනාතීත लङ् ක්‍රියා පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) वहति - अभवत् । (2) आगमिष्यन्ति - अकरोत् ।

(3) आरोहति - आगच्छतु । (4) आगच्छन्ति - चरन्तु ।

20. ''अनयत् - पास्यति'' යන ආඛ්‍යාතවල ලකාර පිළිවෙළින් දක්වා ඇති වරණය කුමක් ද?

(1) लृट् - लङ् । (2) लङ् - लृट् ।

(3) लिङ् - लङ् । (4) लट् - लृट् ।

21. ''पठानि'' යන ආඛ්‍යාතපදය අයත් වන්නේ,

(1) लोट् उत्तमपुरुष एकवचनम् । (2) लृट् उत्तमपुरुष एकवचनम् ।

(3) लट् उत्तमपुरुष एकवचनम् । (4) लिङ् उत्तमपुरुष एकवचनम् ।

22. ''मुनि + इन्द्र'' යන පදවල නිවැරදි සන්ධි පදය වන්නේ,

(1) मुनिन्द्र । (2) मुनेन्द्र । (3) मुनीन्द्र । (4) मुनि ऐन्द्र ।

23. ''गमनागमन'' යන්නෙහි නිවැරදි විසන්ධිය වන්නේ,

(1) गमना + अगमन । (2) गमन + आगमन ।

(3) गमन + अगमन । (4) गमना + आगमन ।

24. ''पुनरुदय'' යන සන්ධිපදය අයත් වන්නේ,

(1) व्यञ्जनसन्धिः । (2) स्वरसन्धिः ।

(3) विसर्गसन्धिः । (4) अनुस्वारसन्धिः ।

25. ''भूमौ + उपविश्य + अवदत्'' යන පදවල නිවැරදි සන්ධිය වන්නේ,

(1) भूमौपविश्यवदत्। (2) भूमापविश्यावदत्।

(3) भूमावुपविश्यवदत्। (4) भूमावुपविश्यावदत्।

26. ''कर्मधारय'' සමාසයට නිදර්ශන පදය වන්නේ,

(1) स्त्रीपुरुषौ। (2) पञ्चरत्नम्। (3) गुरुदक्षिणा। (4) नीलाकाशः।

27. ''राजपुत्रः'' යන්න

(1) තත්පුරුෂ සමාසපදයකි. (2) බහුව්‍රීහි සමාසපදයකි.

(3) අව්‍යයීභාව සමාසපදයකි. (4) කර්මධාරය සමාසපදයකි.

28. තද්ධිත පදයක් සෑදෙන්නේ,

(1) නාමයකට තවත් විශේෂ ප්‍රත්‍යයක් එකතුවීමෙනි.

(2) නාමයකට තවත් විශේෂ නාමයක් එකතුවීමෙනි.

(3) ධාතුවකට තවත් විශේෂ ප්‍රත්‍යයක් එකතුවීමෙනි.

(4) උපසර්ග, ශබ්ද ප්‍රකෘති එකතුවීමෙනි.

29. ''पापिष्ठः'' යන්න අයත් වන්නේ කුමන තද්ධිතයට ද?

(1) अनेकार्थतद्धित। (2) भावार्थतद्धित।

(3) अतिशयार्थतद्धित। (4) अस्त्यर्थतद्धित।

30. ''बालकः गृहं गच्छन् मार्गे रोदिति।'' යන වාක්‍යයෙහි ඉරි ඇඳි පදයෙන් දැක්වෙන්නේ,

(1) පූර්වක්‍රියාවකි. (2) තද්ධිත පදයකි.

(3) තුමන්තක්‍රියාවකි. (4) කෘදන්ත පදයකි.

31. පූර්වක්‍රියා පමණක් ඇතුළත් පද පේළිය වන්නේ,

(1) आदाय - द्रष्टुम् - गत्वा। (2) हर्तुम् - निर्गत्य - उपविश्य।

(3) उषित्वा - जित्वा - कर्तुम्। (4) दत्वा - आगम्य - हसित्वा।

32. ''गजः जलं पातुं इच्छति।'' යන වාක්‍යයෙහි ඉරි ඇඳි පදයෙන් දැක්වෙන්නේ,

(1) තුමන්තක්‍රියාවකි. (2) අසම්භාව්‍ය ක්‍රියාවකි.

(3) අතිශයාර්ථ ක්‍රියාවකි. (4) පූර්වක්‍රියාවකි.

33. ''**अर्धो घठो घोषमुपैति नूनम् ।**'' යන වාක්‍ය ඛණ්ඩයෙහි වඩාත් නිවැරදි අර්ථය වන්නේ,

(1) කළයේ අර්ධයක් නිතර හඬ නගයි.

(2) ඒකාන්තයෙන් නොපිරුණු කළය හඬ නගයි.

(3) අඩක් පිරුණු කළය නිතර හඬ නොනගයි.

(4) පිරුණු කළය හඬ නොනගයි.

34. **"ඔබ ගේ උපන්දිනය කවදා ද?"** යන්නෙහි නිවැරදි පරිවර්තනය වන්නේ,

(1) **कदा त्वं जन्मदिनम् ?**
(2) **कदा तस्मै जन्मदिनम् ?**
(3) **कदा तव जन्मदिनम् ?**
(4) **कदा युवयोः जन्मदिनम् ?**

35. **"සුබ උදෑසනක්"** යන්න සංස්කෘතයෙන් පැවසෙන වරණය තෝරන්න.

(1) **शुभदिनम् ।** (2) **सुप्रभातम् ।** (3) **स्वागतम् ।** (4) **सुखोदयम् ।**

36. **"එසේ වේවා"** යන අර්ථ දෙන ප්‍රකාශය කුමක් ද?

(1) **भवितव्यम् ।** (2) **किमेवम् ।** (3) **एवमस्तु ।** (4) **एवम्भवेत् ।**

37. ''**मेघदूतम्**'' යනු,

(1) සංස්කෘත මහාකාව්‍යයකි.
(2) සංස්කෘත ඛණ්ඩකාව්‍යයකි.
(3) සංස්කෘත වීරකාව්‍යයකි.
(4) සංස්කෘත ශතකකාව්‍යයකි.

38. **කනිෂ්ක** රාජ්‍ය සමයේ දී වාසය කළ මහ කවියා වන්නේ,

(1) **कुमारदासः ।**
(2) **भारवी ।**
(3) **अश्वघोषः ।**
(4) **श्री हर्षः ।**

39. බුද්ධභක්තිය ප්‍රකාශිත ශ්‍රී ලාංකේය ශතකකාව්‍යය වන්නේ,

(1) භක්තිශතකය යි.
(2) නාමාෂ්ටශතකය යි.
(3) අමරුශතකය යි.
(4) නීතිශතකය යි.

40. **භදන්ත අශ්වඝෝෂාචාර්යයන්** විසින් රචිත නාට්‍ය කෘතිය වන්නේ,

(1) අභිඥානශාකුන්තලය යි.
(2) ශාරිපුත්‍රප්‍රකරණය යි.
(3) වික්‍රමෝර්වශීය යි.
(4) ප්‍රතිඥායෞගන්ධරායණය යි.

(ලකුණු 1 x 40 = 40)

| | |
|---|---|
| සියලු ම හිමිකම් ඇවිරිණි<br>All Rights Reserved | මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2018<br>**Primary Piriven Mid Year Term Test - 2018** |
| | 5 ශ්‍රේණිය /**Grade 5** |
| | **සංස්කෘත භාෂාව II** කාලය : පැය තුනයි<br>Sanskrit II විභාග අංකය :........................................ Time : Two hours |

♦ I කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද, II කොටසේ 02, 03 ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් ද පිළිතුරු සපයන්න.

I කොටස

**01.** 01. (අ) පහත සඳහන් උද්ධෘත ගද්‍යපාඨ සිංහලයට නගන්න.

१. ब्राह्मणः ग्रामान्तरं जगाम ।

..........................................................................................................................

२. सोऽतीव चतुरो बहुश्रुतश्चासीत् ।

..........................................................................................................................

३. ब्राह्मण जलार्थमहं तडागे यास्यामि ।

..........................................................................................................................

(ලකුණු 2 x 03 = 06 යි)

(ආ) පහත සඳහන් උද්ධෘත පද්‍යපාඨ සිංහලයට නගන්න.

१. तं गौरवं बुद्धगतं चकर्ष ।

..........................................................................................................................

२. न सुन्दरी सैव तदा बभासे ।

..........................................................................................................................

३. दीर्घं च निःश्वस्य वचोऽभ्युवाच ।

..........................................................................................................................

(ලකුණු 2 x 03 = 06 යි)

02. (අ) **दुर्जनः परिहर्तव्यो विद्ययाऽलङ्कृतोऽपि सन्।** මේ ප්‍රකාශයෙහි ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

(ලකුණු 04 යි)

(ආ) පහත සඳහන් මාතෘකා අතුරින් එකක් පිළිබඳ විවරණයක් කරන්න.

i. **අඥාන නොවී ප්‍රඥාවෙන් ක්‍රියා කරමු.** (සුවර්ණපුරීෂ-පක්ෂිරාජමන්ත්‍රී කථාව ආශ්‍රයෙන්)

ii. **දැඩි ලෝභය විනාශයට හේතු වේ.** (බ්‍රාහ්මණ-සර්ප කථාව ආශ්‍රයෙන්)

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

(ලකුණු 08 යි)

## II කොටස

03. (අ) ඌෂ්මාක්ෂර ලියා දක්වන්න.

..................................................................................................................................................

(ලකුණු 02 යි)

(ආ) පහත සඳහන් සාරස්වත සූත්‍රවල තේරුම ලියන්න.

१. अवर्जा नामिनः। ..............................................................................................

२. अरेदो नामिनो गुणाः। ..............................................................................................

(ලකුණු 02 x 02 = 04 යි)

(ඇ) i. පහත සඳහන් සන්ධිපද විසන්ධි කරන්න.

१. नाहम्। = ..............................................................................................

२. इतस्ततः। = ..............................................................................................

३. अजन्तः। = ..............................................................................................

(ලකුණු 01 x 03 = 03 යි)

ii. පහත සඳහන් විසන්ධිපද සන්ධි කරන්න.

१. इति + आह। = ..............................................................................................

२. भो + अति। = ..............................................................................................

३. सत् + गुणः। = ..............................................................................................

(ලකුණු 01 x 03 = 03 යි)

04. (අ) हे යන නිපාතය යෙදෙන්නේ .......................................... විභක්තිය සමගයි.

(ලකුණු 02 යි)

(ආ) පහත සඳහන් පදවල **විභක්තිය හා වචනය** ලියා දක්වන්න.

| पद | दासेन | मुनिभिः | मृगान् | पितरि |
|---|---|---|---|---|
| विभक्ति | | | | |
| वचन | | | | |

(ලකුණු ½ x 08 = 04 යි)

(ඇ) පහත සඳහන් ආදර්ශ පද රටාව දෙස බලා, **හිස්තැනට ගැළපෙන වචනය** ලියන්න.

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | दासः | दासौ | दासाः |
| प्रथमा | | बालकौ | बालकाः |
| तृतीया | कविना | | |
| चतुर्थी | आत्मने | | आत्मभिः |
| पञ्चमी | पितुः | पितृभ्याम् | |
| सप्तमी | कवौ | कव्योः | |

(ලකුණු 01 x 06 = 06 යි)

05. (අ) **लट्** සහ **लिट्** යන ලකාර අයත් වන්නේ කුමන කාලවලටදැ යි පිළිවෙළින් ලියන්න.

.................................................................................................................................

(ලකුණු 02 යි)

(ආ) පහත දී ඇති කෘදන්ත පදවලින් වගුව සම්පූර්ණ කරන්න.

(मृत, गच्छत्, कृत्वा, द्रष्टुम्)

| पूर्वक्रिया | तुमन्तक्रिया | वर्तमानकृदन्त | अतीतकृदन्त |
|---|---|---|---|
| | | | |

(ලකුණු 01 x 04 = 04 යි)

(ඇ) පහත සඳහන් වගුව සුදුසු පරිදි සම්පූර්ණ කරන්න.

| क्रियापद | लकार | वचन | अर्थः |
|---|---|---|---|
| लिखतु | | | |
| अपठन् | | | |

(ලකුණු 01 x 06 = 06 යි)

06. (අ) पीतं च तत् अम्बरम् යන්න සමාස කොට ලියන්න.

..........................................................................................................................

(ලකුණු 02 යි)

(ආ) चन्द्रवत् - तृतीयः - विदेशीयः - लघुतरः මෙම වචන සුදුසු පරිදි වර්ගගත කරන්න.

| अतिशयार्थतद्धित | संख्यातद्धित | अव्ययतद्धित | अनेकार्थतद्धित |
|---|---|---|---|
| | | | |

(ලකුණු 01 x 04 = 04 යි)

(ඇ) නිදසුනට අනුව සමාසපද ඉදිරියෙන් සමාස නාමය ලියන්න.

| | |
|---|---|
| श्रीपादपर्वतः | කර්මධාරය සමාසය |
| दुष्टनरः | |
| स्त्रीपुरुषौ | |
| त्रिनेत्रः | |
| मधुरवचनम् | |
| त्रिलोकी | |
| देवलोकः | |

(ලකුණු 01 x 06 = 06 යි)

07. (අ) වරහන් තුළ ඇති වචන සුදුසු පරිදි යොදා හිස්තැන් පුරවන්න.
(उष्णकालावसाने - प्रसारितं- वृक्षच्छायायां - दृष्ट्वा - मया - हरिदत्तो - कृषिं )

अस्ति कस्मिंश्चिदधिष्ठाने .............................................. नाम ब्राह्मणः । तस्य

............................................. सदैव निष्फलः कालोतिवर्तते । अथैकस्मिन्दिवसे स

ब्राह्मण ........................................... घर्मार्तः स्वक्षेत्रमद्ये ............................................

प्रसुप्तोऽनतिदूरे वल्मीकोपरि ............................................. बृहत्फटायुक्तं भीषणं भुजङ्गमं

............................................ चिन्तयामास नूनमेषा क्षेत्रदेवता............................................

कदाचिदपि न पूजिता । (ලකුණු 01 x 07 = 07 යි)

(ආ) පහත දැක්වෙන ඡේදය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**अस्ति कस्मिंश्चित्पर्वतैकदेशे महान्वृक्षः। तत्र च सिम्भुक नामा कोऽपि पक्षी प्रतिवसति स्म। तस्य पुरीषे सुवर्णमुत्पाद्यते। अथ कदचित्मुद्दिश्य व्याधः कोपि समाययौ। स च पक्षी तदग्रत एव पुरीषमुत्ससर्ज। अथ पातसमकालमेव तत्सुवर्णीभूतं दृष्ट्वा व्याधो विस्मयमगमत् - अहो मम शिशुकालादारभ्य शकुणिबन्धव्यसनीनोऽशीतिर्वर्षाणि समभूवन्। न च कदाचिदपि पक्षिपुरीषे सुवर्णं दृष्टम्। इति विचिन्त्य तत्र वृक्षे पाशं बबन्ध। अथासावपि पक्षी मूर्खस्तत्रैव विश्वस्तचित्तो यथापूर्वमुपविष्टः। तत्कालमेव पाशेन बद्धः।**

i. ගසෙහි වාසය කළ පක්ෂියා ගේ නම කුමක් ද? ..............................................................................

ii. පක්ෂියා ගේ මළපහ දැක පුදුමයට පත් වූයේ කවු ද? ..............................................................................

iii. අසූවැනි වියට පත් පුද්ගලයා කවු ද? ..............................................................................

iv. පක්ෂියා ගේ අසුචිවල තිබුණේ මොනවා ද? ..............................................................................

v. 'මූර්ඛඃ' යනුවෙන් හඳුන්වනු ලැබ ඇත්තේ කවුරු ද? ..............................................................................

(ලකුණු 01 x 05 = 05 යි)

08. (අ) පහත දැක්වෙන වාක්‍ය සිංහලයට පරිවර්තනය කරන්න.

१. **सैनिकाः देशं रक्षन्तु।**

..............................................................................

२. **गुरुः शिष्यं प्रत्युत्तरं पृच्छति।**

..............................................................................

३. **शुकाः धान्यैः शावकान् पोषयन्ति।**

..............................................................................

४. **विष्णुशर्मा षण्मासं पञ्चतन्त्रम् अकथयत्।**

..............................................................................

(ලකුණු 01 x 04 = 04 යි)

(ආ) පහත දැක්වෙන වාක්‍ය සංස්කෘතයට පරිවර්තනය කරන්න.

i. රජතුමා සිංහාසනයෙහි සිටියි.

..................................................................................................................................

ii. වඳුරෝ ගස්වල වාසය කරති.

..................................................................................................................................

iii. අශ්වයා වේගයෙන් දිව්වේ ය.

..................................................................................................................................

iv. සත්පුරුෂයෝ අද මෙහි පැමිණෙත්වා!

..................................................................................................................................

(ලකුණු 01 x 04 = 04 යි)

(ඇ) චිත්‍රය ඇසුරෙන් වචන තුනකට නොඅඩු සංස්කෘත වාක්‍ය 04ක් දේවනාගරී අකුරෙන් ලියන්න. (එක ම වචනය දෙවරකට වඩා භාවිත නොකළ යුතු ය.)



..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

(ලකුණු 04 යි)